77 වන කාණ්ඩය
18 වන කලාපය



# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

### නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 2935]

ශෝක ප්‍රකාශය : ආචාර්ය මාර්ටින් ලූතර් කිං [තී. 2957]

කොළඹ (පහත් බිම් ප්‍රදේශ) ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලය පනත් කෙටුම්පත [තී. 2964] :
දෙවන වර සහ තුන්වන වර කියවා, සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී.

පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත : නියෝග [තී. 3058]

විදේශ විදුලි සන්දේශ පනත : රෙගුලාසි [තී. 3073]

පළාත් පාලන අතුරු ව්‍යවස්ථා [තී. 3086]

කල් තැබීමේ යෝජනාව [තී. 3088]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [තී. 3107]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 77
இல. 18

செவ்வாய்க்கிழமை
9 ஏப்ரில் 1968

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

வினுக்களுக்கு வாய்மூல விடைகள் [ப. 2935]

அனுதாபத் தீர்மானம் : டாக்டர் மாட்டின் லூதர் கிங் [ப. 2957]

கொழும்பு (தாழ்ந்த இடப்பரப்புக்கள்) மீட்டல், அபிவிருத்தி செய்தற் சபை மசோதா [ப. 2964] :
இரண்டாம் மூன்றும் மதிப்புக்கள் இடம்பெற்று திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

பாடசாலை ஆசிரியர் உபகாரச் சம்பளச் சட்டம் : பிரமாணங்கள் [ப. 3058]

கடல் கடந்த தொலைச் செய்திப்போக்குவரத்துச் சட்டம் : பிரமாணம் [ப. 3073]

உள்ளூராட்சித் துணைவிதிகள் [ப. 3086]

ஒத்திவைப்புப் பிரேரணை [ப. 3088]

வினுக்களுக்கு எழுத்துமூல விடைகள் [ப. 3107]

---

Volume 77
No. 18

Tuesday
9th April 1968

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS [Col. 2935]

VOTE OF CONDOLENCE : DR. MARTIN LUTHER KING [Col. 2957]

COLOMBO (LOW-LYING AREAS) RECLAMATION AND DEVELOPMENT BOARD BILL [Col. 2964] :

Read a Second, and the Third time, and passed, as amended

SCHOOL TEACHERS' PENSION ACT : REGULATIONS [Col. 3058]

OVERSEAS TELECOMMUNICATION ACT : REGULATION [Col. 3073]

LOCAL GOVERNMENT BY-LAWS [Col. 3086]

ADJOURNMENT MOTION [Col. 3088]

WRITTEN ANSWERS TO QUESTIONS [Col. 3107]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය
## பிரதிநிதிகள் சபை
## House of Representatives

**1968 අප්‍රේල් 9 වන අඟහරුවාදා**

செவ்வாய்க்கிழமை 9, ஏப்றில் 1968

*Tuesday, 9th April 1968*

---

අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස්විය. කථානායක තුමා [ගරු එස්. සී. ෂර්ලි කොරෙයා] මූලාසනාරූඪ විය.

சபை, பி. ப. 2 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.

*The House met at 2* P.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
### சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
### PAPERS PRESENTED

Rule made under Section 3 of the Railways Ordinance (Cap. 200).—[*The Hon. D. P. R. Gunawardena on behalf of the Minister of Communications.*]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

## පිළිගන්වන ලද වාර්තා
### சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்
### REPORTS PRESENTED

#### THE NORTHERN PROVINCE TEACHERS' ASSOCIATION BENEVOLENT FUND (INCORPORATION) BILL

**ජී. ජේ. පාරිස් පෙරේරා මයා. (කාරක සභා නියෝජ්‍ය සභාපති සහ "ඒ" ස්ථාවර කාරක සභාවේ සභාපති)**

*(திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா—ஜா-எல—குழுக்களின் உப அக்கிராசனரும் நிலையற் குழு "ஏ" தலைவரும்)*

(Mr. G. J. Paris Perera—Deputy-Chairman of Committees and Chairman, Standing Committee "A")

I present the Report of Standing Committee "A" on the Northern Province Teachers' Association Benevolent Fund (Incorporation) Bill, together with the Minutes of Proceedings.

REPORT

The Committee have considered the Northern Province Teachers' Association Benevolent Fund (Incorporation) Bill and have agreed to it as amended in the attached reprint.

පනත් කෙටුම්පත "ඒ" ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි 1968 අප්‍රේල් 10 වන බදාදා සලකා බලනු ලැබේ.

மசோதா, நிலையற்குழு "ஏ" இனால் அறிக்கை செய்யப்பட்டவாறு 1968 ஏப்றில் 10, புதன்கிழமை பரிசீலிக்கப்படவிருக்கிறது.

*Bill, as reported by Standing Committee "A", to be considered upon Wednesday, 10th April 1968.*

#### THE HENDALA SUSITHA WADANA SAMITHIYA (INCORPORATION) BILL

**පාරිස් පෙරේරා මයා.**

*(திரு. பாரிஸ் பெரேரா)*

(Mr. Paris Perera)

I present the Report of Standing Committee "A" on The Hendala Susitha Wadana Samithiya (Incorporation) Bill, together with the Minutes of Proceedings.

REPORT

The Committee have considered the Hendala Susitha Wadana Samithiya (Incorporation) Bill and have agreed to it without amendment.

පනත් කෙටුම්පත "ඒ" ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි 1968 අප්‍රේල් 10 වන බදාදා සලකා බලනු ලැබේ.

மசோதா, நிலையற்குழு "ஏ" இனால் அறிக்கை செய்யப்பட்டவாறு 1968, ஏப்றில் 10, புதன்கிழமை பரிசீலிக்கப்படவிருக்கிறது.

*Bill, as reported by Standing Committee "A", to be considered upon Wednesday, 10th April 1968.*



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු

## வினுக்களுக்கு வாய்மூல விடைகள்

## ORAL ANSWERS TO QUESTIONS

### යාපනේ නගර සභාවේ ලොරි රියැදුරු කේ. යූ. ජී. රොමානිස් මහතා

### யாழ்ப்பாண நகரசபை லொறிச்சாரதி திரு. கே. யூ. ஜீ. றொமானிஸ்

### MR. K. U. G. ROMANIS, LORRY DRIVER, JAFFNA MUNICIPAL COUNCIL

1. ටී. බී. ඉලංගරත්න මයා. (කොලොන්නාව)

(திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னுவ)

(Mr. T. B. Ilangaratne—Kolonnawa)

පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1967 නොවැම්බර් මාසයේ ගංවතුර ගැලීම සම්බන්ධව සහනාධාර ලැබූ යාපනේ නගර සභාවේ සේවකයින්ගේ නම්, පදවි හා වේතන ඇතුළු ලේඛනයක් ඉදිරිපත් කරන්නේද? (ආ) යාපනේ නගර සභාවේ ලොරි රියැදුරු කේ. යූ. ජී. රොමානිස් මහතා 1967 නොවැම්බර් මාසයේ ගංවතුර පිළිබඳ සහණාධාර ඉල්ලූ බව එතුමා දන්නේද? (ඉ) ඔහුට සහණාධාර දෙන ලද්දේද? (ඊ) නොදෙන ලද්දේ නම්, නොදීමට හේතුව කුමක්ද? (උ) බයිසිකල් මිළට ගැනීම සඳහා අත්තිකාරම් මුදල් යාපනේ නගර සභාවෙන් ලබාගත් එම නගර සභාවේ සේවකයන්ගේ නම්. පදවි හා වේතන ඇතුළු ලේඛනයක් එතුමා ඉදිරිපත් කරන්නේද? (ඌ) යාපනේ නගර සභාවේ ලොරි රියැදුරු කේ. යූ. ජී. රොමානිස් මහතා බයිසිකල් අත්තිකාරම් මුදලක් ඉල්ලන ලද්දේද? (එ) එය දෙන ලද්දේද? (ඒ) නොදෙන ලද්දේ නම් එයට හේතුව කුමක්ද?

உள்ளூராட்சி அமைச்சரினதும் தகவல், ஒலிபரப்பு அமைச்சரினதும் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினு: (அ) 1967 நவம்பர் மாதத்தில் வெள்ளப்பெருக்குச் சம்பந்தமாக நிவாரணம் பெற்ற யாழ்ப்பாண நகரசபை ஊழியரின் பெயர், பதவி, சம்பளம் ஆகியவை அடங்கிய அட்டவணையை அவர் சமர்ப்பிப்பாரா? (ஆ) யாழ்ப்பாண நகரசபை லொறிச் சாரதி திரு. கே. யூ. ஜீ. றொமானிஸ் அவர்கள் 1967 நவம்பர் மாதத்தில் வெள்ள நிவாரணம் கோரியிருந்தாரென்பதை அவர் அறிவாரா? (இ) அவருக்கு நிவாரணமளிக்கப்பட்டதா? (ஈ) அளிக்கப்படாவிடின், அளிக்கப்படாததற்குக் காரணமென்ன? (உ) துவிச்சக்கர வண்டி வாங்குவதற்கு முற்பணத்தைப் பெற்றுக்கொண்ட யாழ்ப்பாண நகரசபை ஊழியரின் பெயர், பதவி, சம்பளம் ஆகியவைகளடங்கிய அட்டவணையை அவர் சமர்ப்பிப்பாரா? (ஊ) யாழ்ப்பாண நகரசபை லொறிச் சாரதி திரு. கே. யூ. ஜீ. றொமானிஸ் அவர்கள் துவிச்சக்கர வண்டிக்காக முற்பணம் கோரியிருந்தாரா? (எ) அது கொடுக்கப்பட்டதா? (ஏ) கொடுக்கப்படாவிடின், அதற்குக் காரணமென்ன?

asked the Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information and Broadcasting: (*a*) Will he table a list of names of employees of the Jaffna Municipal Council who received flood relief in respect of the floods of November 1967, including the positions they hold and their salaries? (*b*) Is he aware that Mr. K. U. G. Romanis, a lorry driver of the Jaffna Municipal Council, applied for relief in respect of the floods of November 1967? (*c*) Was he given flood relief? (*d*) If not, for what reason? (*e*) Will he table a list of names of employees of the Jaffna Municipal Council who obtained salary advances from the council to purchase bicycles, including the positions they hold and their salaries? (*f*) Did Mr. K. U. G. Romanis, lorry driver of the Jaffna Municipal Council, apply for a cycle advance? (*g*) Was it granted? (*h*) If not, why?

**ආර්. ප්‍රේමදාස මයා. (පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

(திரு. ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரதும், தகவல், ஒலிபரப்பு அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. R. Premadasa—Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information and Broadcasting)

(අ) 1967 නොවැම්බර මාසයේදී යාපනයේ මහ නගර සභාව විසින් කිසිම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සේවකයකුට ගංවතුරු සහනාධාර නොදෙන ලදී. එම නිසා මෙම ප්‍රශ්නය පැන නොනඟී. (ආ) ඔව්. (ඉ) නැත. (ඊ) 1967 නොවැම්බර මාසයේදී යාපනය කොට්ඨාශයේ ගංවතුරු නොවීය. (උ) 1. ඇන්. මුතුක්‍රිෂ්ණන්—සනීපාරක්ෂක පරීක්ෂක—රු. 95 සහ අනෙක් දීමනා. 2. ඩබ්ලිව්. ඒ. ඩී. ජයසේන, ලයින්ස්මන්—රු. 62.50 සහ අනෙක් දීමනා. 3. ඇස්. තුරෙයි, විදුලි පෝර්මන්—රු. 176 සහ අනෙක් දීමනා. (ඌ) ඔව්. (එ) නැත. (ඒ) සභාවේ යෝජනාව අනුව බයිසිකල් මිළ දී ගැනීමට අත්තිකාරම් දෙනු ලබන්නේ තම රාජකාරි ඉටුකිරීමට බයිසිකල් අවශ්‍ය නිලධාරීන්ට පමණයි. කේ. යූ. ජී. රොමානිස් ලොරි රියැදුරෙකි. බයිසිකලයක් මිළදී ගැනීමට වැටුප් අත්තිකාරමක් ලැබීමට ඔහුට හිමිකමක් නොවීය.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
මේ ආධාර ඉල්ලුවේ ඔහු කොටිකාවත්තේ පදිංචිව සිටින නිවසට සහ ඉඩමට හානි වූ නිසා බව ඔබතුමා දන්නවාද? මේ ආධාරය ඉල්ලුවේ යාපනේ ජලගැල්මක් ඇති වූ නිසා නොවෙයි, ජලගැල්ම ඇති වුණේ කොළොන්නාවේ කොටිකාවත්තේ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
දන්නේ නැහැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
මේ අන්දමට සංග්‍රහ කළ නිසා ඊට පසුව මේ රියැදුරා මැරුණු බව දන්නවාද?

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
ඒකත් දන්නේ නැහැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
කරුණාකර සොයා බලා එය දැනගන්නට වීරිය කරනවාද?

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
සොයා බලා දැනගත්තත් නැවත පණ දෙන්න පුළුවන්කමක් නැහැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
පණ දෙන්න නමුසෙලාටත් බැරිද?

## අපරදිග සංගීත හා නැටුම් ගුරුවරු

மேலைத்தேய இசை, நடன ஆசிரியர்

## WESTERN MUSIC INSTRUCTORS AND DANCING INSTRUCTORS

**3. බී. වයි. තුඩාවේ මයා. (මාතර)**
*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*
(Mr. B. Y. Tudawe—Matara)
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) රජයේ පාසල්වල අපරදිග සංගීත හා නැටුම් ගුරු තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවීමෙන් පසු ඒ පිළිබඳ සම්මුඛ පරීක්ෂණය 1967. 9. 6 දින පැවැත්වුණු බව එතුමා දන්නවාද? (ආ) ඉල්ලුම් පත්‍ර භාරගෙන මාස තුනකට වැඩි කාලයක් ගත වන තෙක් සම්මුඛ පරීක්ෂණය නොපැවැත්වීමට හේතුව කුමක්දැයි එතුමා සඳහන් කරනවාද? (ඉ) ගැසට් නිවේදනයෙහි සඳහන් පරිදි එම තනතුරු පිළිබඳ ඒ සහ බී යන කොටස් දෙකට වෙන් වශයෙන් ගුරුවරු කී දෙනෙක් තෝරා ගනු ලැබුවෝද? (ඊ) ඔවුන්ගේ නම්, ලිපිනයන් සහ සුදුසුකම් මොනවාද? (උ) තෝරාගනු ලැබූවනට පත්වීම් දෙන ලද්දේ කවදාද? කවර පාසල්වලටද? (ඌ) මෙතෙක් පත්වීම් දී නැත්නම් එයට හේතු වූ කරුණු මොනවාද?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) அரசாங்கப் பாடசாலைகளில் மேலைத்தேய இசை ஆசிரியர், மேலைத்தேய நடன ஆசிரியர் ஆகிய பதவிகளுக்கான விண்ணப்பங்கள் கோரப்பட்ட பின்னர் அது சம்பந்தமான நேர்முகத் தேர்வொன்று 6.9.1967 அன்று நடாத்தப்பட்டது என்பதை அவர் அறிவாரா? (ஆ) விண்ணப்பங்கள் ஏற்கப்பட்டு மூன்று மாதங்களுக்கும் மேற்பட்ட காலம் தாண்டும் வரை நேர்முகத் தேர்வு

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

நடாத்தப்படாததற்குரிய காரணமென்ன வென்பதை அவர் குறிப்பிடுவாரா? (இ) மேற் குறித்த பதவிகள் வர்த்தமானியில் குறிப் பிட்டபடி ஏ., பீ. ஆகிய இரு பகுதிகளில் ஒவ் வொன்றுக்கும் தேர்ந்தெடுக்கப்பட்ட ஆசிரி யர்களின் எண்ணிக்கை வெவ்வேறாக எவ் வளவு? (ஈ) அவர்களின் பெயர்கள், முகவரி கள், தகைமைகள் யாவை? (உ) தேர்ந்தெடுக் கப்பட்டவர்களுக்கு எப்போது நியமனம் அளிக்கப்பட்டது? எப்பாடசாலைகளில் நிய மிக்கப்பட்டனர்? (ஊ) இன்னும் நியமிக்கப் படாவிடின், ஏன்?

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that applications having been called for posts of western music instructors and dancing instructors in government schools, the interview was held on 6.9.1967? (*b*) Will he state why the interview was not held until a period of over three months had passed? (*c*) How many teachers were selected for each of the two categories A. and B. mentioned in the Gazette notification? (*d*) What are their names, addresses and qualifications? (*e*) When were those selected given appointments, and, to what schools? (*f*) If the appointments have not been made so far, why?

**ගාමිණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. காமனி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

(අ) ඔව්. ඊට පසුව දින හතරක් තුළ ද සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. (ආ) එම කාල පරිච්ඡේදයේ දී තේරීම් මණ්ඩල වලට පත් කළ හැකි අමාත්‍යාංශයේ නිල ධාරීන් තවත් තේරීම් මණ්ඩල කීපයක කටයුතු වල නිරතව සිටි නිසාය. (ඉ) තවම තෝරාගෙන නැත. (ඊ) ඉහත (ඉ) අනුව පැන නොනගී. (උ) පැන නොනගී. (ඌ) පාසැල් වල අවශ්‍යතා අනුව පත්වීම් දීමට අවශ්‍ය විස්තර ලබාගත යුතුව තිබුන හෙයිනි. ළඟදීම පත්වීම් දෙනු ඇත.

වාචික පිළිතුරු

**ඩබ්ලිව්. ආර්. ජෙප්සන් මහතා, විශ්‍රාම ගත් කළමනාකාර අධ්‍යක්ෂ, ෆයර්ස්ටන් (ලංකා) සමාගම**

*திரு. டபிள்யு. ஆர். ஜெப்சன், இளைப்பாறிய முகாமைப் பணிப்பாளர், வரையறுக்கப்பட்ட பயர்ஸ்டோன் (இலங்கை)*

**MR. W. R. JEPSON, RETIRED MANAGING DIRECTOR, FIRESTONE (CEYLON), LTD.**

6. **ඉලංගරත්න මයා.**

*(திரு. இலங்கரத்ன)*

(Mr. Ilangaratne)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) සීමාසහිත ෆයර්ස්ටන් (ලංකා) සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂක ඩබ්ලිව්. ආර්. ජෙප් සන් මහතා 1968 පෙබරවාරි 8 වන දින හෝ ඊට තුදුරු දිනයක දී එම සමාගමේ ලංකා ශාඛාවෙන් විශ්‍රාම ගත් බව එතුමා දන්නවාද? (ආ) කොපමණ මුදලක් ලංකා වෙන් පිට ගෙන යෑමට ඔහුට අවසර දෙන ලද්දේද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) வரையறுக்கப்பட்ட பயர்ஸ்டோன் (இலங்கை) நிறுவனத்தின் முகாமைப் பணிப்பாளர் திரு. டபிள்யு. ஆர். ஜெப்சன் இலங்கைக் கிளையிலிருந்து 1968 ஆம் ஆண்டு பெப்ரவரி 8 ஆம் தேதியளவில் இளைப்பாறியதை அவர் அறிவாரா? (ஆ) இலங்கையிலிருந்து எவ்வளவு பணம் எடுத்துச் செல்ல அவர் அனுமதிக்கப் பட்டார்?*

asked the Minister of Finance: (*a*) Is he aware that Mr. W. R. Jepson, the Managing Director, Firestone (Ceylon) Ltd., retired from the Ceylon branch on or about February 8, 1968? (*b*) How much money was he permitted to take away from Ceylon?

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**

*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*

(The Hon. U. B. Wanninayake—Minister of Finance)

(අ) ඔව්. 1968 ජනවාරි මස තුළය. (ආ) රු. 60,112.99.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ඒ වෙනුවට දැන් පත් කරනු ලැබ සිටින්නේ ලාංකිකයෙක් දැයි කියන්නට ගරු ඇමතිතුමාට පුළුවන් ද?

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

ඒ ප්‍රශ්නය පැහැදිලි මදි.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ඒ මහතා විශ්‍රාම ගැනීමෙන් ඇති වූ පුරප්පාඩුවට දැන් ලාංකිකයකු පත් කර සිටිනවා දැයි කියන්නට පුළුවන් ද?

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

මට ඒක කියන්නට බැහැ නොවැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

9 වැනි ප්‍රශ්නය.

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)*

(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence and External Affairs)

ඒ ප්‍රශ්නයට පිළිතුරු දීමට සති දෙකක් කල් ඉල්ලනවා.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

## පී. ගුණවර්ධන ගුරු මහතා

*திரு. பீ. குணவர்த்தன, ஆசிரியர்*

MR. P. GUNAWARDENE, TEACHER

10. **ආචාර්ය එන්. එම්. පෙරේරා** (යටියන්තොට)
*(கலாநிதி என். எம். பெரோரா—யட்டியாந்தோட்டை)*
(Dr. N. M. Perera—Yatiyantota)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) පී. ගුණවර්ධන මහතා, අවුරුදු දෙකක කාලයක් කෑග/ඉහළඋඩුව පාසලේ වැඩ බලන මූල් ගුරු වශයෙන් කටයුතු කළ බවත්, (ii) 1968 ජනවාරි 16 වැනි දින දී උප ගුරුවරයකු වශයෙන් කෑග/නාපල්ල පාසලට ඔහු මාරුකර යැවූ බවත්, (iii) මාස 1½ කට පසුව 68. 3. 1 වැනිදා සිට මාවනැල්ල ප්‍රදේශයේ කෑග/අරම විද්‍යාලයට ඔහු මාරු කර ඇති බවත්, එතුමා දන්නවාද? (ආ) ඉතා කාර්යක්ෂම පුහුණු ගුරුවරයකු මෙසේ නිතර නිතර මාරු කිරීමට හේතුව කුමක් ද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) திரு. பி. குணவர்த்தன, ஈராண்டு காலம் கேகாலே/இகல உடுவ பாடசாலையின் பதில் தலைமையாசிரியராகப் பணியாற்றினர் என்பதையும்; (ii) அவர் 1968, ஜனவரி 16 ஆந் தேதியன்று கேகாலே/நாபெல்ல பாடசாலையின் உதவியாசிரியராக மாற்றப்பட்டாரென்பதையும்; (iii) அவர் ஒன்றரை மாதங்களின் பின், 1.3.1968 அன்றிலிருந்து மாவனெல்லேப் பிரதேசத்தில் உள்ள கேகாலே/அறம வித்தியாலயத்துக்கு மாற்றப்பட்டாரென்பதையும் அவர் அறிவாரா? (ஆ) மிகவும் திறமை வாய்ந்த பயிற்றப்பட்ட ஆசிரியர் ஒருவரை இங்ஙனம் அடிக்கடி இடம் மாற்றஞ் செய்யக் காரணம் என்ன?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that (i) Mr. P. Gunawardene was the acting head teacher of K/G Ihala Uduwa for a period of two years; (ii) on the 16th of January 1968, he was transferred to K/G Napella as an assistant teacher; (iii) after 1½ months, he has been transferred with effect from 1.3.68 to K/G Arama Vidyalaya in Mawanella

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

area? (b) What is the reason for these frequent transfers of a very efficient trained teacher?

**ජයසූරිය මයා.**
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

(අ) (i), (ii) සහ (iii) දනිමි. (ආ) (i) කෑ/ඉහලදූව පාසැලට ස්ථිර මුල් ගුරුවරයෙකු පත් කළ නිසා ගුණවර්ධන මහතා ඔහුගේ ඉල්ලීම පරිදි කෑ/නාපල්ල විද්‍යාලයට මාරු කරන ලදී. (ii) කෑ/අරම විද්‍යාලයේ මුල්ගුරු පුරප්පාඩුවක් ඇති වූ හෙයින් වැඩ බලන මුල්ගුරුවරයෙකු වශයෙන් පළපුරුද්දක් තිබූ ගුණවර්ධන මහතා එම තනතුරට 68.3.1 දින සිට මාරු කරන ලදී. (iii) මෙම ගුරුවරයා කෑ/අරම විද්‍යාලයට මාරුවී යෑමට බලවත් අකැමැත්තක් පලකළ හෙයින් ඔහුගේ ඉල්ලීම පරිදි කෑ/නාපල්ල විද්‍යාලයට නැවතත් මාරු කරන ලදී.

## ආර්. බෙලිගම්මන මහත්මිය, රක්ෂණ සංස්ථා නියෝජිත

திருமதி ஆர். பெலிகம்மன, முகவர், காப்புறுதிக் கூட்டுத்தாபனம்

MRS. R. BELIGAMMANA, AGENT, INSURANCE CORPORATION

11. **ආචාර්ය එන්. එම්. පෙරේරා**
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

වාණිජ හා වෙළෙඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ලංකා රක්ෂණ සංස්ථාවේ රක්ෂණ නියෝජිතයකු වශයෙන් ආර්. බෙලිගම්මන මහත්මිය පත් කර තිබෙන බව එතුමා දන්නවාද? (ආ) රක්ෂණ නියෝජිතයකු වශයෙන් බෙලිගම්මන මහත්මිය කටයුතු කර තිබෙන්නේ කවදා සිටද? (ඉ) ඇය රක්ෂණ නියෝජිතයකු වශයෙන් කටයුතු කරන්නේ කිනම් නියමයන් හා කොන්දේසි යටතේ ද? (ඊ) බෙලිගම්මන මහත්මිය විසින් මෙතෙක් උපයා ඇති මුළු කොමිස් මුදල් ප්‍රමාණය කොපමණ ද? (උ) රක්ෂණ ඔප්පු කීයක් සම්බන්ධයෙන් කොමිස් මුදල් උපයා තිබේ ද? ඒ ඔප්පුවල වටිනාකම කීය ද? (ඌ) රක්ෂණ සංස්ථාවේ නියෝජිතයකු වශයෙන් බෙලිගම්මන මහත්මිය පත් කරන ලද්දේ කිනම් පදනමක් මතද?

வர்த்தக, வியாபார அமைச்சரைக் கேட்ட வினா: (அ) இலங்கைக் காப்புறுதிக் கூட்டுத்தாபனத்தின் காப்புறுதி முகவராகத் திருமதி ஆர். பெலிகம்மன நியமிக்கப்பட்டுள்ளார் என்பதை அவர் அறிவாரா? (ஆ) திருமதி பெலிகம்மன எப்பொழுதிருந்து காப்புறுதி முகவராகக் கடமையாற்றுகிறார்? (இ) அவர் காப்புறுதி முகவராகக் கடமையாற்றுவதற்கான நியதிகளும், நிபந்தனைகளுமெவை? (ஈ) திருமதி பெலிகம்மன இதுவரையில் உழைத்துள்ள முழுத்தரகுத் தொகை எவ்வளவு? (உ) எத்தனை காப்புறுதிப் பத்திரங்களில் தரகு உழைக்கப்பட்டது, இப்பத்திரங்களின் பெறுமதியென்ன? (ஊ) திருமதி பெலிகம்மன காப்புறுதிக் கூட்டுத்தாபனத்தின் முகவராக எந்த அடிப்படையில் நியமிக்கப்பட்டுள்ளார்?

asked the Minister of Commerce and Trade: (a) Is he aware that Mrs. R. Beligammana has been appointed an insurance agent of the Insurance Corporation of Ceylon? (b) Since when has Mrs. Beligammana functioned as an insurance agent? (c) What are the terms and conditions under which she functions as an insurance agent? (d) What is the total amount of commission so far earned by Mrs. Beligammana? (e) On how many policies has commission been earned and what is the value of the policies? (f) What is the basis on which Mrs. Beligammana has been appointed as an agent of the Insurance Corporation?

**ගරු හියු ප්‍රනාන්දු (වාණිජ හා වෙළඳ ඇමති)**
(கௌரவ ஹியூ பெர்னாண்டோ—வர்த்தக, வியாபார அமைச்சர்)
(The Hon. Hugh Fernando—Minister of Commerce and Trade)

(අ) ඔව්. (ආ) වර්ෂ 1966 යේ ජනවාරි මස 3 වැනි දා. (ඉ) ඇයද පත් කර ඇත්තේ නියෝජිතයන් පත් කිරීමට අදාල සාමාන්‍ය නියමයන් හා කොන්දේසි මතය. (ඊ) රු. 12,766/80. (උ) රක්ෂණ ඔප්පු 13 වූ අතර එහි සම්පූර්ණ අගය රු. 1,14,000. (ඌ) බෙලිගම්මන මැතිනිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නියෝජිත වරියක වශයෙන් පත්කර ඇත්තේ සාමාන්‍ය පදනම මත වන අතර ("ඉ" ප්‍රශ්නයට දී ඇති පිළිතුර මෙයට අදාළය) ඇය සෑම ලිත් වර්ෂයක් තුළ ජීවිත හයක් හෝ එයට වැඩි ගණනක වෙන් වෙන් ජීවිත වෙනුවෙන් රු. 50,000 ක අගය ඇති රක්ෂණ ව්‍යාපාර සම්පූර්ණ කළ යුතුයි.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
පාර්ලිමේන්තු ලේකම්වරයාගේ භාර්යාව ඉන්ෂුවරන්ස් ඒජන්ත කෙනකු හැටියට වැඩ කිරීම යුක්තිසහගත දෙයකැයි ගරු ඇමතිතුමා කල්පනා කරනවාද?

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்ணாண்டோ)*
(The Hon. Hugh Fernando)
රක්ෂණ සංස්ථාවට බාධාවක් නැහැ.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
රක්ෂණ සංස්ථාවට බාධාවක් නැහැ. ඒක එහෙම වෙන්නට පුළුවන් නමුත් මේ තනතුර මේ විධියේ ආණ්ඩුවේ බල තලයක් දරන කෙනකුගේ භාර්යාවක් දරන එක සුදුසුද කියන එකයි ප්‍රශ්නය.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்ணாண்டோ)*
(The Hon. Hugh Fernando)
පසුගිය ආණ්ඩුව පැවැති කාලයේදී පත් කර සිටියේ ස්වාමි පුරුෂයා. ඉන්පසු, මේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ, ඒ කටයුතු එතුමාගෙන් නතර කර භාර්යාවට දුන්නා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
ඒ කාලයේ ඔහු මන්ත්‍රීවරයකු හැටියට හිටියේ නැහැ නොවැ. පාර්ලිමේන්තු ලේකම්වරයකුගේ භාර්යාවකට මේ තනතුර දීම සුදුසුද?

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்ணாண்டோ)*
(The Hon. Hugh Fernando)
රක්ෂණ සංස්ථාවට ආදායමක් ලබා දෙන්නට පුළුවන් ඕනෑම කෙනකු සුදුසුයි.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
ඇමතිවරයකුටත් පුළුවන්ද?

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்ணாண்டோ)*
(The Hon. Hugh Fernando)
ඕනෑම කෙනකුට පුළුවනි.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
ගරු අගමැතිතුමා එය අනුමත කරනවාදැයි මම දැන ගන්නට කැමතියි. ලජ්ජා වක්‍ය කියන එකක් නැහැ, මට පෙනෙන හැටියට නම්.

## දෝවේ ඛේදවාචකයට සම්බන්ධ ලං. ග. ම. බස් රියැදුරු

தோவ விபத்துக்குள்ளான இ. போ. ச. பஸ் சாரதி

DRIVER OF C.T.B. BUS IN DOWA TRAGEDY

2. **බර්නාඩ් සොයිසා මයා.** (දකුණු කොළඹ—ඩී. පී. ආර්. වීරසේකර මයා. —දෙහිඕවිට—වෙනුවට)
*(திரு. பெர்ணாட் சொய்ஸா—கொழும்புத் தெற்கு—திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—தெகியோவிற்ற—சார்பாக)*
(Mr. Bernard Soysa—Colombo South—on behalf of Mr. D. P. R. Weerasekera—Dehiowita)
ජනසතු සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ජීවිත විසිහතරක් බිලි ගනිමින් පසුගිය පෙබරවාරි මස බණ්ඩාරවෙල දෝවේදී ඇති වූ ඛේදවාචකයට සම්බන්ධ බස්රථය කුමණ ඩිපෝවට අයත් වූවක්දැයි එතුමා සඳහන් කරනවාද? (ආ) එම රිය පැදවූ රියැදුරාගේ නම සහ ගම කුමක්ද? (ඉ) මොහු ලංගම සේවයට පත් කළේ කවදාද? (ඊ) ඔහු ලබා ඇති සුදුසුකම් මොනවාද? (උ) ලංගම සේවයට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

පෙර ඔහු කවුරුන් යටතේ සේවය කළේ දැයි එතුමා සඳහන් කරනවාද? (ඌ) නො එසේ නම්, ඒ මන්ද?

தேசியமயச் சேவை அமைச்சரைக் கேட்ட வினா: (அ) இருபத்து நான்கு உயிர்களைப் பலிகொண்ட கடந்த பெப்ரவரி மாதம் 8 ஆம் தேதியன்று பண்டாரவளை, தோவலில் பயங்கர விபத்திற்குள்ளான பஸ் வண்டி எந்த டிப்போவுக்குரியதென அவர் குறிப்பிடுவாரா? (ஆ) அவ்வண்டியைச் செலுத்திய சாரதியின் பெயரும், ஊரும் யாவை? (இ) அவர் எப்போது இ. போ. ச. சேவையில் சேர்க்கப்பட்டார்? (ஈ) அவருடைய தகைமைகள் யாவை? (உ) இ. போ. ச. இல் சேவையாற்றுவதற்கு முன் அவர் யாருக்குக் கீழ்ச் சேவை புரிந்தாரென அவர் குறிப்பிடுவாரா (ஊ) அன்றேல், ஏன்?

asked the Minister of Nationalised Services: (*a*) In regard to the bus that was involved in the tragic accident that took twenty-four lives at Dowa, Bandarawela, on the 8th February, will he state the depot to which it belonged? (*b*) Will he state the name and the village of the driver of this bus? (*c*) When was he recruited to the C. T. B.? (*d*) What were his qualifications? (*e*) Will he state the name of his employer prior to his joining the C. T. B.? (*f*) If not, why?

ගරු වී. ඒ. සුගතදාස (ජනසතු සේවා ඇමති)

(கௌரவ வீ. ஏ. சுகததாச—தேசியமய சேவை அமைச்சர்)

(The Hon. V. A. Sugathadasa—Minister of Nationalized Services)

(*a*) Yes, Meetotamulla Depot. (*b*) T. Coranelis, Talangama. (*c*) 18th March 1966. (*d*) Educational qualifications: 7th standard Sinhala; age: 30 years; height: 5 ft. 7½ ins.; weight: 125 lbs.; experience: he had been driving lorries since 27.9.61. (*e*) Before joining the board's service he had been driving lorries under Lanka Power Lines Ltd., Gaffoor Building, Colombo, from November 1962 to May 1964. (*f*) Does not arise.



## සිවුරු පඬු ආනයනය

## பிக்குமாரின் அங்கிகளுக்கான வண்ணச்சாய இறக்குமதி

## IMPORTS OF DYE FOR MONKS' ROBES

4. මෛත්‍රීපාල සේනානායක මයා. (මැදවච්චිය—හේමචන්ද්‍ර සිරිසේන මයා.—අකුරණ පළමුවන මන්ත්‍රී—වෙනුවට)

(திரு. மைத்திரிபால சேனநாயக்க—மதவாச்சி—திரு. ஹேமச்சந்திர சிரிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர் சார்பாக)

(Mr. Maithripala Senanayeke—Medawachchiya—on behalf of Mr. Hemachandra Sirisena—First Akurana)

රාජ්‍ය කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ලංකාවට සිවුරු පඬු ආනයනය කරන්නන් නම් වශයෙන් කවිද? (ආ) එක් එක් ආනයනකයින් වෙත මේ සඳහා ලැබෙන වාර්ෂික විදේශ විනිමය ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරනවාද? (ඉ) ඉහතකී ආනයනකයින් අතර භික්ෂූන් වහන්සේලා ද සිටින්නේ නම්, එක් එක් භික්ෂූන් වහන්සේ වෙතද වෙන්කර දී තිබෙන වාර්ෂික විදේශ විනිමය ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද? (ඊ) තව තවත් භික්ෂූන් වහන්සේලා සිවුරුපඬු ආනයනය කිරීමට අවසරය ඉල්ලා සිටියහොත් එකී භික්ෂූන් වහන්සේලා වෙතද විදේශ විනිමය ලබාදීමට එතුමා සලකා බලනවාද? (උ) නොඑසේ නම්, ඒ මන්ද?

இராஜாங்க அமைச்சரைக் கேட்ட வினா: (அ) பிக்குமாரின் அங்கிகளுக்குப் பயன்படுத்தப்படும் வண்ணச்சாயங்களை இலங்கையில் இறக்குமதி செய்பவர்களின் பெயர்கள் யாவை: (ஆ) இந்த இறக்குமதியாளர் ஒவ்வொருவருக்கும் வண்ணச்சாய இறக்குமதிக்காக ஆண்டுதோறும் வழங்கப்படும் வெளிநாட்டு நாணயமாற்று எவ்வளவு என்பதை அவர் தனித்தனியாகத் தெரிவிப்பாரா? (இ) இவ்வண்ணம் இறக்குமதி செய்பவர்களில் பௌத்த பிக்குமாரும் அடங்கியுள்ளனரெனின், அவர்கள் ஒவ்வொருவருக்கும் ஆண்டுதோறும் வழங்கப்படும் வெளிநாட்டு நாணயமாற்று எவ்வளவு என்பதை அவர் தனித்தனியாகத் தெரிவிப்பாரா: (ஈ) பிக்குமாரின் அங்கிகளுக்குப் பயன்படுத்தப்படும் வண்ணச்சாயங்களை இறக்குமதி செய்ய அனுமதிகோரி மேன்மேலும் பௌத்த பிக்குமார்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

விண்ணப்பித்தால் அவர்களுக்கும் வெளிநாட்டு நாணயமாற்று வழங்குவதுபற்றி அவர் ஆலோசிப்பாரா? (உ) அன்றேல், ஏன்?

asked the Minister of State: (*a*) What are the names of the importers of dye used for monks' robes? (*b*) Will he state the annual foreign exchange allocation made to each of these importers? (*c*) If there are Buddhist monks among these importers, what is the foreign exchange allocation made to each of them? (*d*) If more Buddhist monks apply for permission to import dye used for monks' robes, will he consider allowing foreign exchange to them too? (*e*) If not, why?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayawardene)

(අ) ගල් අඟුරු තාර රංජක ද්‍රව්‍ය සහ ස්වාභාවික නිල් එතෙරින් ගෙන්වීම සඳහා ආනයන පංගු වෙන් කර දෙනු ලැබූ මුළු ආනයනකයන් ගණන 29 දෙනෙකි. ඔවුන් අතුරින් පහත නම් සඳහන් ආනයනකයන් විසින් බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ සිවුරු පඬු පෙවීමට අවශ්‍ය රංජක ද්‍රව්‍ය ගෙන්වා ඇත. මේ ආනයනකයනට වෙන් කර දෙනු ලැබූ පංගුවලින් කවර ප්‍රමාණයක් එක් එක් ආනයනකයා විසින් විශේෂයෙන් සිවුරු පඬු ගෙන්වීම සඳහා යොදාගනු ලැබීද යන්න කිව නොහැකිය.

| ආනයනකයාගේ නම | | 1967 වෙන්කළ ප්‍රමාණය රු, | | 1968 (මුල් හමස) රු. |
|---|---|---|---|---|
| 1. සීමාසහිත කෙමිකල් ඉන්ඩස්ට්‍රීස් ... | ... | 89,462 | ... | 41,500 |
| 2. සීමාසහිත වැතැම් හවුස් ඩී.අයි.ජී.එස්. | ... | 49,650 | ... | 24,300 |
| 3. සීමාසහිත ඒ. බවර් සහ සමාගම ... | ... | 9,930 | ... | 4,600 |
| 4. සදක් අලි ආදම්ජී | ... | 8,853 | ... | 4,300 |
| 5. ඉන්දු ලංකා ට්‍රේඩිං සමාගම | | 6,956 | ... | 800 |
| 6. අබ්දුල් හුසේන් ඩාවුඩ්බෝයි | | 3,324 | ... | 1,500 |
| 7. සීමාසහිත ඩී. සී. ප්‍රනාන්දු සහ සමාගම | ... | 3,116 | ... | 1,400 |
| 8. තහෙරලි රාජ්බෝයි | ... | 2,714 | ... | 800 |
| 9. සීමාසහිත මෙට්කෝ | ... | 2,322 | ... | 1,100 |
| 10. සීමාසහිත ජෙනරල් ඒජන්සීස් | | 2,045 | ... | 1,000 |
| 11. සීමාසහිත මැක්වුඩ්ස් | ... | 563 | ... | 700 |
| 12. සීමාසහිත කලම්බු ඇපොතිකරීස් සමාගම | ... | 500 | ... | 700 |
| 13. ලුක්මන්ජී අලිබෝයි | ... | 500 | ... | 700 |

(ආ) 1967 වර්ෂයත් 1968 වර්ෂයේ මුල් හමසත් සඳහා වෙන් කර දෙනු ලැබූ පංගු ප්‍රමාණයන් ඉහතින් දක්වෙයි. (ඉ) තමන්ගේ සිවුරු පඬු පොවා ගැනීමට අවශ්‍ය වූ තන්හි ඊට වුවමනා පඬු වර්ග ලබා ගැනීම දුෂ්කර බවට සමස්ත ලංකා භික්ෂු පෙරමුණ විසින් කරුණු ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේදී 1967 සැප්තැම්බරයේ දී රු. 10,000 ක් වන විශේෂ "වෙන් කිරීමක්" එම භික්ෂු පෙරමුණට නිකුත් කරනු ලැබීය. 1968 පෙබරවාරියේදීත් රු. 5,000 ක් වන "වෙන් කිරීමක්" එම පෙරමුණට නිකුත් කරන ලදී. (ඊ) ඔව්. (උ) පැන නොනඟී.

## රක්ෂණ සංස්ථාව : එච්. ඒ. හින්නිනෝනාගේ කම්කරු වන්දි ඉල්ලීම

காப்புறுதிக் கூட்டுத்தாபனம்: எச். ஏ. ஹின்னி நோனாவினது வேலையாளர் நட்ட ஈட்டுக் கோரிக்கை

INSURANCE CORPORATION: WORKMEN'S COMPENSATION CLAIM OF H. A. HINNINONA

5. **නීල් ද අල්විස් මයා.** (බද්දේගම)
*(திரு. நீல் டி அல்விஸ்—பத்தேகம)*
(Mr. Neal de Alwis—Baddegama)

වාණිජ හා වෙළෙඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) හල්ඔළුව ආරච්චිගේ හින්නිනෝනා නමැති තුවාල ලැබූ කම්කරුවකු වෙනුවෙන් අවුරුදු එකහමාරකට පමණ කාලයකට පෙර නැඳුන් උයන වත්තේ අධිකාරීන් විසින් කම්කරු වන්දි ඉල්ලීමක් රක්ෂණ සංස්ථාව වෙත යැවූ බව එතුමා දන්නවාද? (ආ) මාස දෙකක පමණ කාලයකට පෙර ගෙවීම් රිසිට් පත රක්ෂණ සංස්ථාව වෙත ඉදිරිපත් කළ නමුත් මෙතෙක් ගෙවීම් කර නැති බව එතුමා දන්නවාද? (ඉ) එච්. ඒ. හින්නිනෝනාට අය විය යුතු මුදල ගෙවීමට වහාම අණකර, මෙම සංස්ථාවේ පවතින බලවත් නොසැලකිලිමත්කම ගැන එතුමා සොයා බලනවාද?

வர்த்தக, வியாபார அமைச்சரைக் கேட்ட வினா: (அ) ஹல்ஒளுவ ஆராச்சிகே ஹின்னிநோனா என்ற காயமுற்ற வேலையாளர் ஒருவரின் சார்பில், ஏறத்தாழ ஒன்றரை ஆண்டுகளுக்கு முன்னால் நெதுன் உயனத் தோட்டத் துரையால் வேலையாளர் நட்டஈட்டுக் கோரிக்கையொன்று காப்புறுதிக் கூட்டுத்தாபனத்திற்கு அனுப்பப்பட்ட தென்பதை அவர் அறி

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[නීල් ද අල්විස් මයා.]

வாரா? (ஆ) காப்புறுதிக் கூட்டுத்தாபனத் திற்குக் கொடுப்பனவுப் பற்றுச்சீட்டு இரண்டு மாதங்களுக்கும் முன்னரே அனுப்பப்பட் டுள்ள போதிலும் இன்னமும் பணம் கொடுபட வில்லை யென்பதை அவர் அறிவாரா? (இ) எச். ஏ. ஹின்னிநோனாவுக்குரிய பணத்தை உடனடியாகக் கொடுக்கும்படி அவர் கட்டளை யிடுவதுடன், இந்தக் கூட்டுத்தாபனத்தில் நில வும் அறமோசமான அசட்டை மனப்பான்மை நிலைமைப்பற்றி அவர் விசாரணை நடாத்து வாரா?

asked the Minister of Commerce and Trade: (*a*) Is he aware that a workmen's compensation claim was sent to the Insurance Corporation by the Superintendent, Nedunuyana Estate, about one and half years ago, on behalf of an injured worker, Haloluwa Arachchige Hinninona? (*b*) Is he aware that although the payment receipt was forwarded to the Insurance Corporation over two months ago the payment has not yet been made? (*c*) Will he order immediate payment of the amount due to H. A. Hinninona, and inquire into the state of utter indifference prevailing in this corporation?

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்ணாண்டோ)*
(The Hon. Hugh Fernando)

(අ) එසේය. (ආ) මෙම හිමිකම් පෑම සම්බන්ධයෙන් ගෙවීම 1968 පෙබරවාරි 18 වැනි දින කර ඇත. (ඉ) උද්ගත නොවේ. මේ හිමිකම් පෑම පිළිබඳ ලිපිගොනුව, පවත්නාවූ වැඩ වර්ජනය නිසා දනට සොයා ගැනීමට නොහැකි හෙයින් මෙම ප්‍රමාදයට නියම හේතුව ප්‍රකාශ කිරීම අපහසුය.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

මෙම ආයතනය මඟින් රජයට විශාල ආදායමක් ලබා ගන්නට පුළුවන්කම තිබෙන නමුත් නිසි කාලසීමාවන් තුළ මහජනතාවගේ ලිපිවලට පිළිතුරු නොලැබෙන නිසා මෙම ආයතනය පිළිබඳව ඇති මහජන විශ්වාසය ක්‍රමක්‍රමයෙන් නැතිවේගන යන බව තමුන්නාන්සේ දන්නවාද?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Is this a question?

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

It is a long question.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The hon. Member is getting involved in the question.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

I am not getting involved in the question. This is a money-spinning department and because of its unbusinesslike methods people are losing confidence in it. මා දන්නවා, මෙම සංස්ථාව කෙරෙහි මහජනතාව තුළ පවත්නා විශ්වාසය නැතිවේගෙන යන බව. නියම කාල සීමාවක් තුළ උත්තර ලැබෙන්නේ නැහැ.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்ணாண்டோ)*
(The Hon. Hugh Fernando)

එවැනි තත්ත්වයක් තිබුණු බව මා පිළිගන්නවා.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

ඉදිරියටත් එවැනි තත්ත්වයක් ඇති වෙනවා. මහජනතාවට යැවිය යුතු අව සාන උත්තර පවා අවුරුදු දෙක තුනකට වත් නොයවා ඇති බවට සාධක වශයෙන් මා ඉදිරියේදී මේ පිළිබඳව තවත් ප්‍රශ්න දෙක තුනක් ඉදිරිපත් කරන්නට යනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Is that also a question ?

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

Sir, I am not finding fault—I am only suggesting that these things be put right. Sir, I want to ask a third supplementary question.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The hon. Member had better start learning to count.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

එම ප්‍රශ්නයට අදාලව තවත් අතුරු ප්‍රශ්නයකුයි මා අහන්නේ. මෙම මුදල ගෙව්වේ මේ ප්‍රශ්නය මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවායින් පසුවය යන්න තමුන්නාන්සේ දන්නවාද ?

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்னாண்டோ)*
(The Hon. Hugh Fernando)

එසේ වන්නට බැහැ. ඊට පෙර මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වලයි, එසේ කර තිබෙන්නේ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 12.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමා (මංගල මුණසිංහ මයා. වෙනුවෙන් මා අහනවා, 12 වන ප්‍රශ්නය.

වාචික පිළිතුරු

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

ඒ ප්‍රශ්නයට උත්තර සැපයීම සඳහා මාස 3 ක් කල් වුවමනා කරනවා. [බාධා කිරීමක්] මොකද හා හා කියන්නේ ? ප්‍රශ්නය කියවා බැලුවොත් පෙනේවි තත්ත්වය.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

මේවා කල්පනා කරලයි ඉදිරිපත් කර තිබෙන්නේ. තමුන්නාන්සේගෙන් අවසරයක් වුවමනා කරන්නේ නැහැ ප්‍රශ්න කියවන්නට. මේ අන්දමේ ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම මෙසේ ප්‍රමාද කරන්නේ ඇයි ? දෙපාර්තමේන්තුවට මේවාට උත්තර සොයා ගන්නට බැරිද ? අවශ්‍ය ලිපි ලේඛනාදිය ඇත්තේ නැද්ද ? ඒවා සොයා ගන්නට අපහසුද ?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

සොයා ගන්නට තමයි, මාස 3 ක් වුවමනා බව කියන්නේ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගුරුවරුන් මාරු කරනවා විතරයි.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 13.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමා වෙනුවෙන් 13 වන ප්‍රශ්නය මා අහනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
ඊට පිළිතුරු දීම සඳහාත් මාස 3 ක් කල් වුවමනා කරනවා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
මාස 3 ක් යන විට අළුත් සැසි වාර යක් එනවා. එතකොට මේවා අහෝසි වෙනවා. එම නිසා මේවාට උත්තර නො දීමේ අදහසිනුයි, මාස 3 ක් කල් ඉල්ලන්නේ.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
නැහැ, නැහැ.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
එසේ නොවේ නම් මාස 3ක් කල් වුව මනා කරන්නේ නැහැ.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
ප්‍රශ්නය කියවා බැලුවොත් පෙනේවි, කුමන කුමන ස්ථානවලින් ඒ සඳහා තොරතුරු ලබා ගන්නට තිබෙනවාද යන්න.

**ලෙස්ලි ගුණවර්ධන මයා.** (පානදුර)
*(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை)*
(Mr. Leslie Goonewardene—Panadura)
ගුරුවරුන් 10,000 ක් මාරු කරන්නට තිබෙනවානේ.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Question No. 14.



**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
14 වන ප්‍රශ්නයත් මා අහනවා.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
එම ප්‍රශ්නයට පිළිතුර සැපයීම සඳහාත් මාස 3ක් කල් වුවමනා කරනවා.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ කෙටුම්පත් පනත්

### *தனி அங்கத்தவர் மசோதா*

### PRIVATE MEMBERS' BILL

RENT RESTRICTION (AMENDMENT) BILL

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
ගෙවල් කුලී සීමා කිරීමේ පණත පිළිබඳ සංශෝධන පණතක් නැතහොත්, "Bill to amend the Rent Restriction Act" නමැති කෙටුම්පත් පණත ඉදිරිපත් කිරීමට අවසර දෙන ලෙස මා යෝජනා කරනවා.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)
විසින් ස්ථිර කරන ලදී.

*அனுவதித்தார்*
*seconded.*

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. R. Premadasa)
එම අවසරය දෙනවාට රජය විරුද්ධ වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

We cannot have a discussion. I shall put the Question to the House.

ප්‍රශ්නය විමසන ලදී.

කටහඬවල් අනුව "විරුද්ධ" මන්ත්‍රීන්ට ජය බව කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

வினா விடுக்கப்பெற்றது.

குரல்களின்படி "இல்லை" என்றவர்களுக்கு வெற்றியென சபாநாயகர் அவர்களால் பிரகடனப்படுத்தப்பட்டது.

*Question put.*

MR. SPEAKER, *having collected the Voices, declared that the "Noes" had it.*

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Divide!

මන්ත්‍රී මණ්ඩලය 48 වන ස්ථාවර නියෝගය යටතේ—පක්ෂව 11; විරුද්ධව 38; යනුවෙන්—බෙදුණේ ය.

சபை, 48 ஆம் நிலையற் கட்டளையின் கீழ் பிரிந்தது சார்பாக 11 ; எதிராக 38.

*The House divided (under Standing Order No. 48) : Ayes 11; Noes 38.*

## ශෝක ප්‍රකාශය : ආචාර්ය මාටින් ලූතර් කිං

*அனுதாபத் தீர்மானம் : டாக்டர் மாட்டின் லூதர் கிங்*

## VOTE OF CONDOLENCE : DR. MARTIN LUTHER KING

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

With the permission of the House, the Hon. Prime Minister wishes to propose a Vote of Condolence on the death of Dr. Martin Luther King.

අ. භා. 2.21

ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)
*(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும் தகவல், ஒலிபரப்பு அமைச்சரும்)*
(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)

Members of this Honourable House will share with me the deep sense of shock and grief on the tragic and untimely death of Dr. Martin Luther King at the hands of an assassin.

Dr. Martin Luther King was an outstanding example of a man of vision and courage who ventured out fearlessly and relentlessly to gain acceptance in his own country for that fundamental principle of human rights that all men are equal irrespective of race, creed and coulour. I need not recount to you today the magnitude of the problems that he confronted. They were a part of the history of the people, defying both the passage of time and the efforts of other valiant men who had themselves given much to this same cause.

What rouses our admiration for this noble soul is not merely the cause which he espoused, but even more important, the means by which he sought to realize this goal. He was the apostle of non-violence, and the compaign he undertook was based on this principle of non-violence—a principle which Gautama the Buddha preached and through which a great neighbour of ours secured its freedom.

Dr. Martin Luther King was a Minister of the Baptist Church who after graduating from Boston University, engaged himself completely in

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the campaign for the rights of the American Negro people. He was the founder of the Southern Christian Leadership Conference and organized the non-violent and passive resistance campaign through which he was convinced that justice for his people would be attained. In this struggle he came up against prejudice and resistance and often endured the trials of imprisonment. He suffered indignity and obstruction but none of these prevented him from carrying on his campaign for a fair deal for his people ; nor did it deflect him from the principles of non-violence to which he was committed.

The world recognized the justice of the cause he espoused and the wisdom of the non-violent means he used in his advocacy of this cause when it applauded the award to Martin Luther King in 1964, of the Nobel Prize for Peace. It is a paradox that this man of non-violence should have died at the hands of an assassin. It calls to mind the parallel of another great aspostle of non-violence in recent times, Mahatma Gandhi, who himself met his death at the hands of an assassin. Mahatma Gandhi at least saw the fulfilment of his vision before his death. This has been denied to Martin Luther King.

I have no doubt that by his tragic death he has roused in the peoples, not only in the United States but throughout the world, wherever human rights have been denied to any people, a greater consciousness of the necessity for remedying the injustices of society. His death may well prove the catalyst that will hasten the realization of his vision.

On hearing of the death of Dr. Martin Luther King, I have conveyed to Mrs. King our sense of sorrow and grief at his untimely death.

I move :

"That this House expresses its profound sorrow at the untimely death of Dr. Martin Luther King and its confiddence that the noble cause to which he devoted a lifetime must triumph."

අ. භා. 2.25

**සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය.** (අත්තනගල්ල)

*(திருமதி சிறிமாவோ ஆர். டீ. பண்டாரநாயக்க—அத்தனகல்ல)*

(Mrs. Sirimavo R. D. Bandaranaike—Attanagalla)

ගරු කථානායකතුමනි, ආචාර්ය මාටින් ලූතර් කිං මහතාගේ ශෝකජනක මරණය ගැන ගරු අගමැතිතුමා මෙම ගරු සභාවට ඉදිරිපත් කළ යෝජනාව මුළු විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් මා සවිර කරන අතරම ගරු අගමැතිතුමාගේ ප්‍රකාශයට තවත් වචන ස්වල්පයක් එකතු කරන්නට මා කැමතියි.

ආචාර්ය මාටින් ලූතර් කිං මහතාගේ දුක්ඛදායක මරණය ගැන අද ලෝකයේ මනුෂ්‍ය අයිතිවාසිකම් ගරු කරන වර්ණ භේදය හෙළා දකින, එක ජාතියක් විසින් තවත් ජාතියක් පාගා ගැනීම හෙළා දකින සෑම ප්‍රගතිශීලියකුම දුක් වනු ඇත.

මාටින් ලූතර් කිං මහතා ඇමෙරිකාවේ වාසය කරන නීග්‍රෝ ජාතිකයින්ගේ ආදරයට හා ගෞරවයට පාත්‍ර වුණු ඉතාම උසස් පෙළේ නායකයෙකි. ඔහුගේ ජීවිතයේ පරමාර්ථය වූයේ තම ජනතාව ඇමරිකාවේ සුදු මිනිසුන්ගේ තාඩන පීඩනවලින් මුදවාගෙන ඔවුන්ටත් සමාජයේ හිමිතැන සාමකාමී මාර්ගයකින් ලබා ගැනීමයි.

මනුෂ්‍ය අයිතිවාසිකම් ගැන සහ සම තත්ත්වය උදෙසා කරන සටන් අද ලෝකයේ සෑම ජනතාවක්ම යෙදී සිටින්නා වූ ඉතාම උසස් සහ අවශ්‍යම සටනකි. ඇමෙරිකන් එක්සත් ජනපදය තුළ නීග්‍රෝ ජාතිකයින්ගේ සටන බොහෝ කලක සිට නොයෙක් මාර්ගවලින් ගෙන ගොස් ඇති සටනක් බව අපි කවුරුත් දනිමු.

ලෝකයේ ඉතාම ධනවත්, ඉතාම බල සම්පන්න, ශාස්ත්‍රයෙන් සහ ඉගෙනීමෙන් උසස්ම තත්ත්වයක් ලබා ගත්තා වූ රටක ජනගහණයෙන් සැලකිය යුතු කොටසක් වූ නීග්‍රෝ ජාතිකයන්—කෝටි 2 ක් පමණ පිරිසෙන්—වැඩි කොටසක් ඉතාම දුක්ඛිත තත්ත්වයක අද ජීවත් වෙති. අධ්‍යාපනයක් නැතිකම, දිළිඳුකම,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රැකියාවල් නැතිකම, වාසස්ථාන නැතිකම සහ නගරවල සමාජයෙන් කොන් කර තැබීම අද ඇමෙරිකන් එක්සත් ජනපදයේ නිග්‍රෝ ජාතිකයන්ට මුහුණ පාන්නට සිදු වී ඇති පීඩනයි. මෙම බලසම්පන්න සහ ධනවත් රට ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී නායකයකු යයි කියා ගනිමින් ලෝක නායකත්වයක් ලබා ගැනීමට තැත් කරන නමුත් එම සමාජයේ ඇති ගැඹුරු දුර්වලතාව මෙයින්ම පැහැදිලිව පෙනී යයි.

නිග්‍රෝ ජාතිකයින්ගේ නැඟිටීම ඇමෙරිකන් එක්සත් ජනපදයට මුහුණ පාන්නට සිදු වී ඇති ආර්ථික, යුද්ධමය සහ විදේශ ප්‍රතිපත්තියේ අර්බුදාත්මක තත්ත්වයේ කොටසකි.

වියට්නාම් ජාතිකයින්ගේ අධිෂ්ඨානය ඉදිරිපිට පසු බැසීමට සිදු වීමත්, ලෝකයේම ධනවත් රටක් හැටියට තිබුණේ වී නමුත්, තම මුදල් ක්‍රමයේ දුර්වලතාවනුත් සමගම මතු වී ඇති අනෙකුත් සමාජයීය ප්‍රශ්නත් මාටින් ලූතර් කිං මහතාගේ සාහසික මරණයෙන් තවත් පැහැදිලි ලෙස ඉස්මතු වෙයි.

මේ සිදු වී ඇති අපරාධකාරී සිදුවීම්වලින් ඇමෙරිකානු පාලකයන් තම වැරදි ප්‍රතිපත්ති වෙනස් කොට නිග්‍රෝ ජාතිකයන්ගේ අයිතිවාසිකම් සහතික කරදීම පමණක් නොව වැරදි ජාත්‍යන්තර ප්‍රතිපත්තිද වෙනස් කර සාමකාමී මාර්ගයට බසින්නේ නම් මෙම ශ්‍රේෂ්ඨතම නායකයාගේ මරණයෙන් ද සේවයක් වනු නිසැකය.

ආචාර්ය මාටින් ලූතර් කිං තම ජාතියේ සහ දුක් විඳින ජනතාවගේ විමුක්තිය උදෙසා කළ හැකි ශ්‍රේෂ්ඨතම පරිත්‍යාගය කර ඇත. නායකයා මරා දැමීමෙන් ඔවුන්ගේ අදහස් මරා දැමිය නොහැක. මේ රටේ බහුතර ජනතාව ඔහුට උසස් ලෙස ගෞරවාදරය දක්වන අතරම ඔහුගේ මරණය ගැඹුරු බලවත් ලෙස ශෝක වනු ඇත. විරුද්ධ පක්ෂය වෙනුවෙන් මාටින් ලූතර් කිං මැතිනියටත් ඇයගේ දරුවන්ටත් නිග්‍රෝ ජාතිකයන්ටත් එක්සත් ජනපදයේ යුක්තිය, මනුෂ්‍ය නිදහස සහ සාමය ගරු කරන ජනතා කොටස්වලටත් අපගේ ශෝකය පළ කරමු.

අ. භා. 2.29

**වී. එන්. නවරත්නම් මයා. (චාවකච්චේරි)**

*(திரு. வீ. என். நவரத்னம்—சாவகச்சேரி)*

**(Mr. V. N. Navaratnam—Chavakachcheri)**

சபாநாயகரவர்களே, கௌரவ பிரதம அமைச்சர் அவர்களும், கௌரவ எதிர்க்கட்சித் தலைவர் அவர்களும் டாக்டர் மாட்டின் லூதர் கிங் அவர்களின் அகால மரணங்குறித்துச் செலுத்திய அஞ்சலியை ஆமோதிக்கும் இந்த நேரத்திலே, எமது கட்சியின் சார்பாகச் சில வார்த்தைகள் கூற வேண்டிய கடமை எனக்கு இருக்கிறது.

டாக்டர் மாட்டின் லூதர் கிங் அவர்களை ஒரு பெரிய உலகத் தலைவர் என்ற முறையில் மட்டுமல்ல, எங்களுடைய அரசியல் கட்சியின் இயக்கங்களுக்கு ஒரு வழிகாட்டியாகவும் சென்ற காலங்களில் நாங்கள் மதித்து வந்திருக்கிறோம். எமது அரசியல் கட்சி எமது கொள்கைகளைப் பெறுவதற்கு, இலட்சியங்களை அடைவதற்கு பாராளுமன்றத்தில் மாத்திரமல்ல, சில வேளைகளில் பாராளுமன்றத்துக்கு அப்பாலும் நேரடி நடவடிக்கைகளிலும் இறங்கியதை நீங்கள் அறிவீர்கள். நாங்கள் நேரடி நடவடிக்கைகளில் இறங்கிய போதெல்லாம், டாக்டர் மாட்டின் லூதர் கிங் அவர்கள் அமெரிக்காவிலே தமது மக்களின் அடிப்படை உரிமைகளுக்கு எப்படிப் புனிதமான முறையிலே இயக்கங்கள் நடாத்தினரோ அந்த முறையிலேதான் நாங்களும், இயன்ற அளவில், நடந்து கொண்டோம். எமது இயக்கங்களை நடத்த அவருடைய நடவடிக்கைகள் எமக்கு உதவியாக இருந்தன.

எமது பிரதம அமைச்சர் அவர்கள் இப்பொழுது தெரிவித்த அனுதாபச் செய்தியை எதிர்க்கட்சித் தலைவர் அவர்கள் ஆமோதித்ததை நாங்கள் பெரிதும் வரவேற்கிறோம். எதிர்க்கட்சித் தலைவர் அவர்களுடைய மனதிலே ஏற்பட்டிருக்கும் மாற்றம், வருங்காலத்தில் டாக்டர் மாட்டின் லூதர் கிங் அவர்களுடைய அடிச்சுவட்டிலே எமது இயக்கங்கள் சென்றாலும் அந்த இயக்கங்களுக்கு தடை விதிக்காமல், அந்த இயக்கங்களைத் துன்புறுத்தாமல் இயங்க விடுவார் என்ற நம்பிக்கையை எங்களுக்கு ஏற்படுத்தியுள்ளது. 1956 ஆம் ஆண்டிலே காலிமுக மைதானத்திலே, டாக்டர்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[නවරත්නම් මයා.]

மாட்டின் லூதர் கிங் அவர்களுடைய அடிவழியில் எமது கட்சி பெரியதோர் சாத்வீக நடவடிக்கையை எடுத்தபொழுது நடந்த சம்பவங்கள் இனி நடக்காது என்ற நம்பிக்கையும், 1961 ஆம் ஆண்டு பெப்ருவரி மாதத்திலே டாக்டர் மாட்டின் லூதர் கிங் அவர்களுடைய அடிவழியிலே எமது கட்சி சாத்வீக வழியிலே செய்த சத்தியாக்கிரக இயக்கத்துக்கு எதிராக எடுக்கப்பட்ட நடவடிக்கைகள் வருங் காலத்தில் எடுக்கப்பட மாட்டாது என்ற நம்பிக்கையும் எதிர்க்கட்சித் தலைவர் அவர்களுடைய பேச்சிலிருந்து எமக்கு ஏற்பட்டிருக்கிறது.

எமது கட்சியின் சார்பாக டாக்டர் மாட்டின் லூதர் கிங் அவர்களுடைய குடும்பத்துக்கு அனுதாபம் தெரிவித்துக் கொள்கிறேன்.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Although it was agreed that there should be only one speech on behalf of the Government and one on behalf of the Opposition, if any other hon. Member wishes to speak I am prepared to allow him to do so.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

We abide by agreements.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I wish to associate myself with the sentiments expressed by both sides of the House on the death of Dr. Martin Luther King.

I shall request the Clerk of the House to make a minute of the proceedings of the Meeting today and send a copy thereof to the members of the bereaved family.

**ප්‍රශ්නය විමසන ලදින් ඒකච්ඡන්දයෙන් සභා සම්මත විය.**

வினா விடுக்கப்பட்டு, ஏகமனதாக ஏற்றுக்கொள்ளப் பட்டது.

*Question put, and agreed to,* **nemine contradicente.**

## මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු

### சபை அலுவல்

### BUSINESS OF THE HOUSE

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Does the Hon. Leader of the House wish to make a statement with regard to tomorrow's Order Paper ?

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**
*(கௌரவ சீ. பீ. டி சில்வா—காணி. நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும் )*
(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

At the discussion this morning in your Chambers, leaders of parties agreed to a few items being taken up ahead of others. Accordingly, the Order Paper for tomorrow will be changed. A cyclostyled paper will be circulated this evening so that hon. Members will know what items will be taken up in terms of the agreement arrived at.

## කොළඹ (පහත් බිම් ප්‍රදේශ) ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලය පනත් කෙටුම්පත

### கொழும்பு (தாழ்ந்த இடப்பரப்புக்கள்) மீட்டல், அபிவிருத்தி செய்தற் சபை மசோதா

### COLOMBO (LOW-LYING AREAS) RECLAMATION AND DEVELOPMENT BOARD BILL

කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාල ප්‍රශ්නය [අප්‍රේල් 7].

"කෙටුම්පත් පණත දැන් දෙවනවර කියවිය යුතුය."—[ගරු සී. පී. ද සිල්වා]

**ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.**

ஏப்றில் 7 ஆம் தேதிய வினா மீதான ஒத்திவைக்கப் பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

" மசோதா இப்பொழுது இரண்டாம் முறை மதிப்பிக்கப்படுமாக " [கௌரவ சீ. பீ. டி சில்வா]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

விவாதம், மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Order read for resuming Adjourned Debate on Question—[7th April.]*

*" That the Bill be now read a Second time ".—[The Hon. C. P. de Silva.]*

*Question again proposed.*

අ. භා. 2.34

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

I had raised a point of Order on the last occasion, namely, that the scope of this Bill is altered. Although Caluse 2 says:

" Where the Minister is satisfied that any area of land situated within the jurisdiction of any local authority specified in the First Schedule...."

and thereby apparently, according to your schedule, limits the scope of the operation of this Bill to the Greater Colombo area, Clause 26, which says, " The Minister may, by Order published in the Gazette, amend any Schedule to this Act ", alters the character of the Bill, and therefore the title " Colombo (Low-lying Areas) Reclamation and Development Board " is not appropriate. Either the title must be amended or the enabling clause, which gives the Minister limitless power, must be amended.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

May I interrupt the hon. Member? This matter was discussed at the meeting of leaders of parties today, and the Hon. Leader of the House agreed to amend the Bill, in both places, at the appropriate time, I believe, to restrict it to the Colombo District. Is that right?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

That is right.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

I raised that as a point of Order on the last occasion.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

The title of the Bill as well as Clause 26.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගරු කථානායකතුමනි, මා ගියවර කථා කරන්නට නැගී සිටියේ මෙම පනතේ බලතල ලංකාවේ කුමන ප්‍රදේශවලට කොයි ආකාරයට කුමන ප්‍රමාණයකට බල පාන වාද යන කරුණ ගැනයි. මෙම පනතෙහි තිබෙන දුර්වලකම් කීපයක්ම මේ අවස්ථා වේදී සඳහන් කරන්නට සිදු වී තිබෙන වා. ඒ හැරුණු විට, සාමාන්‍ය වශයෙන්, වගුරු බිම්, මුඩුබිම් හා පහත් බිම් දියුණු කිරීමට ගන්නා වූ පියවර ගැන නම් විරුද්ධ වන්නට අපට වුවමනාවක් නැහැ. මේ පනත දැන් මතු වී තිබෙන්නේ විශාල ප්‍රමාදයකින් පසුව බව මෙම ගරු සභාවෙහි කවුරුනුත් දන්නවා. මේ සම්බන්ධව කටයුතු කිරීමට නගර නිර්මාණ නිලධාරි මහත්මයා විසින් වාර්තාවක් ඉදිරිපත් කරන්නට යෙදුණේ මීට අවුරුදු 15 කට පෙරදීයි. නගර නිර්මාණ අධ්‍යක්ෂතුමාගේ ඒ වාර්තාව කුමන ආණ්ඩුවකවත් සැලකිල්ලට භාජන වුණේ නැ. එම නිසා මේ කටයුත්ත සම්බන්ධ යෙන් විශාල ප්‍රමාදයක් ඇති වුණු බව නම් විශේෂයෙන් ප්‍රකාශ කරන්නට ඕනෑ.

කොළඹ නගරය අවට තිබෙන පහත් බිම් පිළිබඳව මා විශේෂයෙන්ම කරුණු දන්නවා. එම බිම් දැන් යෝජනා කර තිබෙන පිළිවෙළ අනුවම නොව, යටත් පිරිසෙයින් කොළඹ නගර සභාව මාර්ග යෙන් හෝ වෙනත් මණ්ඩලයක් මාර්ග යෙන් හෝ අරගෙන, ඒවා දැනට තිබෙන තත්ත්වයෙන් මුදා ගැනීමේ යෝජනා ක්‍රමයක් නගර නිර්මාණ අධ්‍යක්ෂතුමා විසින් සකස් කර තිබෙන බව මා හොඳා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

කාර දන්නවා. මේ කාරණය පිළිබඳව මත භේද අවශ්‍ය නැහැ. එහෙත්, ඇත්ත වශයෙන්ම මෙවැනි ව්‍යාපාරයක් ගෙන යන විට, නියම සැලැස්මක් අනුව කොළඹත් ඇතුළුව මෙහි සඳහන් අනෙක් පළාත් දියුණු කිරීම සඳහා නියම වැඩ පිළිවෙළක් යොදන්නේ නැත්නම් මේ දරන උත්සාහයේ ප්‍රතිඵලවලින් කොටසක් නැති වී යනවා.

අද කොළඹ නගර සභාවේ නියම වශයෙන් නගර නිර්මාණ අධ්‍යක්ෂ කෙනකු ඇත්තේ නැහැ. ඉතා දක්ෂ මහත්මයකු ඒ ස්ථානයෙහි සිටිනවා. නීතිරීති ගැන දැනීමත් නගර නිර්මාණ කටයුතු පිළිබඳ පළපුරුද්දත් ඒ මහත්මයාට තිබෙනවා. එහෙත් එතුමා එහි දරන්නේ, තාවකාලික වැඩබලන නිලයක් පමණයි. නගර නිර්මාණ කටයුතු හරියාකාර දියුණු කිරීමේ ආයතනයක් අද නියම වශයෙන් කොළඹ නගර සභාව යටතේ නැහැ. නමින් පමණක් එවැන්නක් තිබෙනවා. නගර සංවර්ධන කටයුතු සඳහා පිහිටුවන ලද ස්ථාවර කාරක සභාවකුත් එහි තිබෙනවා. එහෙත්, නගර දියුණු කිරීමේ කටයුතු අතින් නගර සභාව කරන්නේ නගරයේ පාරවල නම් වෙනස් කිරීම පමණයි. [බාධා කිරීමක්] බුකිකාරයන්ගේ පමණක් නොව වෙනත් නොයෙක් විධියේ පුද්ගලයන්ගේ නම් නගරයේ පාරවලට යොදනවා. සමහර නම් කියවන්නට මිනිත්තු දෙකක් තුනක් ගත වෙනවා. සමහරවිට, වැඩි කල් යන්නට මත්තෙන් " යූ. බී. වන්නිනායක, ජේ. පී. යූ. එම්. මාවත" යනුවෙන් පාරක් කොළඹ නගරයෙහි ඇති වන්නට පුළුවනි.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
ඒක වැරදිද ?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
වරදක් නෑ. නාම පුවරුව කියවන්නට ගියාම පාරේ වාහන තදබදය ඇති වෙනවා. පාරේ නම ඒ තරම් දිගයි.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
දිග නම් කෙටි කරන්නට පනතක් ගේන්න.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
දිග නම් නොදමා ඉන්න.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
පාරවලට නොම්මර දැමීම ඉතාම පහසුයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඔක කොළඹ නගර සභාවෙන් කෙරෙන වැඩක්. දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) නගර සභාවේත් මන්ත්‍රීවරයෙක්.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
එහි බලය තිබෙන්නේ තමුන්නාන්සේලාගේ පක්ෂයටනේ. පාරවලට නොම්මර දැමීමේ අදහස අප අනුමත කරනවා. නාගරික කොමසාරිස්තුමා එය යෝජනා කළ අවස්ථාවේදී ඊට විරුද්ධ වුණේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් මයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කරන්න.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
මම ඉදිරිපත් කරන්නම් යෝජනාවක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

ඉදිරිපත් කරන විට තමුන්නාන්සේලා විරුද්ධ වෙනවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඔව්, ගෙවල් කුලී පනත් කෙටුම්පතටත් විරුද්ධ වුණා නොවැ. පළාත් පාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා ඒ පනත් කෙම්ටුපතට විරුද්ධ වුණේ ඒ පනත් කෙටුම්පත දැකලවත් නැතිව නොවැ. බලන්නෙත් නැතිව විරුද්ධ වුණා. [බාධා කිරීමක්].

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඇයි කලින් පනත ?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඒක සංශෝධනය කළා. සංශෝධනය කර නොතිබුණු ගුණාංගයන් කීපයක් ඇතුළත් කළා.

දැන් පිකකට කලින් විරුද්ධ වුණේ නිකම් අවසරය ඉල්ලන අවස්ථාවේදී නොවැ. එසේ විරුද්ධවීම සාමාන්‍ය පාර්ලිමේන්තු සම්ප්‍රදායටත් විරුද්ධයි. පනත් කෙටුම්පත කුමක්ද කියා බැලුවෙත් නැහැ.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

අදහසටත් විරුද්ධයි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඔව්. ගරු කථානායකතුමනි, කොළඹ නගර සභාවේ නගර සංවර්ධන කාරක සභාව මසකට දෙවරක් පමණ රැස්වෙනවා. රැස් වී පාරවල නම් වෙනස් කරනවා. එපමණයි. නගරය දියුණු කිරීමට, සැලැස්ම සම්පාදනය කිරීමට, නගර සංවර්ධනයට කෙරෙන්නෙ එපමණයි. මීට අවුරුදු දෙකකට පමණ පෙර එවැනි විශේෂ කාරක සභාවකට මාවත් පත් වුණා. මා මාසයක පමණ කාලයක් තුළ එම කාරක සභාවේ සිටියා. එම කාරක සභාව දෙවරක් රැස් වුණා. ඒ රැස්වූ දෙවාරයේදීම සැලැස්මක් සැදිය යුතුය කියා තීරණය කළා. එපමණයි සිදුවුණේ. සැලැස්මක් සෑදීමට මග සැලසුණා ; එපමණයි. ඊට වැඩි දෙයක් සිදු වුණේ නැහැ.

කොළඹ සහ කොළඹ අවට ප්‍රදේශ පිළිබඳව නගර නිර්මාන අධ්‍යක්ෂතුමාගේ කෙටුම්පත් සැලැස්මක් තිබෙන බවයි මං දැන් ගරු සභාවට මතක් කරන්නෙ. ඒ කෙටුම්පත් සැලැස්ම තුළ යම් පළාත් ආණ්ඩු සභාවකට අයිති ප්‍රදේශයක් තිබෙනවා නම් ඒ ප්‍රදේශය පිළිබඳව අංග සම්පූර්ණ සැලැස්මක් පිළියෙළ කිරීමේ කටයුත්ත පැවරෙන්නේ ඒ පළාත් ආණ්ඩු සභාවටයි. ඒ අනුව කොළඹ නගර සභා සීමාව ඇතුළත ප්‍රදේශවල ඒ කටයුතු කිරීමේ බලය පැවරෙන්නේ කොළඹ මහ නගර සභාවටයි. ඒ කටයුත්ත තවම සම්පූර්ණ වශයෙන් ඉෂ්ට වී නැහැ. එමනිසා ඕනෑම ප්‍රශ්නයක් පිළිබඳව, පාරක් පිළිබඳව හෝ වේවා ඉඩමක් පිළිබඳව හෝ වේවා ඕනෑම ප්‍රශ්නයක් පිළිබඳව විසඳුමක් ලබා ගන්නට නම් කරුණු රාශියක් ගැන සොයන්නට සිද්ධ වී තිබෙනවා. පාරක් නම් එය කුමන කටයුතු සඳහා වශී කළ ප්‍රදේශයන් අනුව වැටෙනවාද යන්න ඉක්මණින් සොයා ගන්නට බැහැ. නොයෙක් අයට වුවමනා විධියට යෝජනා ගෙනෙනවා. යම් පාරවල්, යම් ප්‍රදේශයන් වාණිජ කටයුතු වෙනුවෙන් වෙන් කළ යුතුය කියා වරක් යෝජනාවක් ගෙනෙනවා. තවත් විටක තවත් ප්‍රදේශ කාර්මික කටයුතු වෙනුවෙන් වෙන් කළ යුතුය කියා යෝජනාවක් ගෙනෙනවා. මේ ආකාරයට කිසිම සැලැස්මක් කිසිම වගවිභාගයක් නැතිව අද මේ කර්මාන්ත ශාලා ආරම්භ කරන නව ධනපතියන් කර්මාන්ත ශාලා ඉදි කරගෙන යනවා. කොයි තරම් නීතිරීති තිබුණත් කම්කරුවන්ගේ ආරක්ෂාව ගැන පවා කිසිම සැලකිල්ලක් නැතිව අද සමහර වැඩ පොළවල් පවත්වාගෙන යන බව කම්කරු ඇමතිතුමාත් පිළිගන්නවා ඇති. පහත් බිම් හැටියට සලකන ප්‍රදේශවලත් කිසිම සැලැස්මක් නැතිව මේ විධියේ වැඩ පොළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

වල් හා කම්හල් ඉදි කරගෙන යනවා. ඇයි අර ග්‍රෑන්ඩ්පාස් විදුලි බල මධ්‍යස්ථානය ගැන බලන්න. ගරු ඇමතිතුමාත් මා සමග එකඟ වෙනවා ඇති. ග්‍රෑන්ඩ්පාස් හන්දියේ ඒ මධ්‍යස්ථානය ඉදි කළේ කාගේ අවසරය ඇතිවද? කාගෙන් අහලද එය එතැන ඉදි කළේ? එය එතැන පිහිටුවන්නට තිබුණු වුවමනාව කුමක්ද?

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சீ. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

එතැන ජලයට යට වෙන්නෙ නැහැ. ඒ මධ්‍යස්ථානය පිහිටුවිය හැකි සියළුම ස්ථාන ගැන විශේෂඥයින් පරීක්ෂා කර බලා එතැන තමයි ඉතාම සුදුසු තැන හැටියට පිළිගත්තෙ.

**බර්නාඩ් සොයිසා මයා.**

*(திரு. பெர்னட் சொய்ஸா)*

(Mr. Bernard Soysa)

ගරු කථානායකතුමනි, තවත් කාරණයක් මතක් කරන්ට ඕනෑ. දැනට තිබෙන නගර සංවර්ධන පනත වැඩි වශයෙන්ම උල්ලංඝණය කරන්නෙ ආණ්ඩුවයි. කොළඹ නගර සභාවට සැලසුම් ඉදිරිපත් කරන්නෙ නැතුව නගරය තුළ නොයෙක් ගොඩනැගිලි හදනව. නගර සභාව යම් උපදේශයක් දුන්නත් ඒක පිළිගන්නෙත් නැහැ. ආශ්වාස ප්‍රශ්වාස කිරීම පහසුවීමට කොතරම් ඉඩ කඩ තිබිය යුතුද ආදි මිනිති පිළිබඳව නගර සභාවේ උපදෙස් පිළිගන්නේ නැහැ.

**ගරු වන්නිනායක**

*(கௌரவ வன்னிநாயக்க)*

(The Hon. Wanninayake)

මහ ආණ්ඩුව ඒව දන්නවනෙ.

**බර්නාඩ් සොයිසා මයා.**

*(திரு. பெர்னட் சொய்ஸா)*

(Mr. Bernard Soysa)

දන්නෙ නැහැ. මේ නීති රීති උල්ලංඝණය කරල හැදුව ගොඩනැගිලි රාශියක් මම පෙන්වා දෙන්නම්. ප්‍රධාන වරදකරු ආණ්ඩුවයි. එහෙත් දුප්පත් මිනිහෙක් පැල්පතක් ගැහුවොත් ඒක කඩා දමන්න නම් බොහොම ඉක්මන් වෙනව. මේක නගර නිර්මාන රෙගුලාසිවලින් තොරව සාදන ලද එකක්ය කියා, පදිංචි වෙන්නට තැනක් නැති දුප්පතෙක් හදාගන්න පැලපත නම් කඩා දමන්ට බොහොම ඉක්මන් වෙනව. එහෙත් මේ රෙගුලාසි සියල්ලක්ම උල්ලංඝණය කරන ආණ්ඩුව පිළිබඳව කවුරුවත් කථා කරන්නෙ නැහැ.

මම මේ අදහස් අනුමත කරනව. මේ පහත් බිම්, වගුරු බිම් මුදවා ගැනීමට යම් වැඩ පිළිවෙලක් ඇති කිරීම යෝග්‍ය යයි මා අනුමත කරනව. එහෙත් මේ කරුණු හරියාකාර සම්පූර්ණ කිරීමට කලින් කොළඹ පිළිබඳව නිසි විධියේ සැලැස්මක් අවශ්‍යයි. ඒ විධියේ සැලැස්මක් නැතිව මේ බලාපොරොත්තු වන වැඩ පිළිවෙලින් නෙළා ගන්නට පුළුවන් ප්‍රතිඵලවලින් වැදගත් කොටසක් නැති වන්ට පුළුවනි. මම එක නිදර්ශනයක් දෙන්නම්.

මම මේ කථා කරද්දී මට පෙනුනා, මේ පනත් කෙටුම්පතේ සිංහල අනුවාදය නම් කිසිම විධියකින් සැලකිය යුතු අනුවාදයක් නොවන බව. මේ විධියේ ප්‍රශ්න ගැන කල් වෙලා ඇතුව නියම විධියේ අකාරාදියක් සකස් නොකර මේ කටයුතු කරන්ට බැහැ. හදිසියේ වචනයක් හොයා ගන්ට ඕනෑ වුණාම කාගේවත් අවසරයක් නැතිව වචනයක් හදනව. එයින් ප්‍රකාශ වෙන්නෙ වුවමනා අදහස නොවෙයි. "surface drainage" කියන ඉංග්‍රීසි වචනය සිංහලට පරිවර්තනය කරල තිබෙන්නෙ කොහොමද? "විවෘත කානු මගින් ජලාපවහණය කිරීම" යනුවෙනුයි. ගරු කථානායකතුමනි, මේ "surface drainage" කියන එකට කානුවක් අවශ්‍ය වෙන්නෙ නැහැ. පොළව මත වැටෙන වතුර ගළාගෙන යාමේ පිළිවෙලටයි "surface drainage" කියන්නෙ. මේ අන්දමට කානුව යම් විධියකින් වැහුවොත් ඒක මේ වැඩේට අහු වෙන්නෙ නැහැ. මම මේ ප්‍රශ්නය ගැන විශේෂයෙන් සලකා බලන ලෙස ඉල්ලා සිටින්නෙ මේ නිසයි. අද කොළඹ නගරයේ පොළව මත වැටෙන වැහි වතුර ගලාගෙන යාමට තිබෙන පහසුකම් නැතිවී තිබෙනව. ස්වාභාවිකව තිබුණු මාර්ග ඇහිරී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගාලු පාරට ටිකක් එහායින් ප්‍රදේශය බැලුවාම විශේෂයෙන් උස්බිමක් වශයෙන් සලකා උතුරේ සිට දකුණට ඉරක් අඳින්නට පුළුවන්. එයින් දෙපැත්තට වතුර ගලා බසින ක්‍රමයක් තිබුණ. එක පැත්තකින් මුහුදටත් අනික් පැත්තෙන් කොළඹ නැගෙනහිර ප්‍රදේශය ඔස්සේ දියවන්නා ඇළ දක්වාත් ගලා ගෙන යාමේ පිළිවෙලක් තිබුණා. දැන් නිවාස හිඟය නිසා කාට හෝ ගෙයක් වුවමනා වුණාම කොහෙන් හරි ඉඩමක් අරගෙන එහි මට්ටම පහළ නම් කොහෙන් හරි පස් ටිකක් අරගෙන, පස් පාටියෙන් හෝ පස් අරගෙන, මට්ටම උස් කරගෙන ගෙයක් හදනව. එතැන් පටන් වතුර ගලා යන්නෙ කොහාටදැයි කවුරුවත් දන්නෙ නැහැ. අල්ලපු ඉඩමට වෙන්ට පුළුවනි. වතුර ගලාගෙන යාම පිළිබඳව ඇති වුණ ඝට්ටන නිසා කොළඹ නගරයේ යම් යම් උදවිය කීප විටක් මා හමුවන්ට ඇවිත් තිබෙනව. ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අසල්වාසීන් පිරිසකුත් පසුගියදා එතුමාට විරුද්ධව මට විශාල පැමිණිල්ලක් ඉදිරිපත් කළා.

තිඹිරිගස්යාය, ජාවත්ත, නාරාහේන්පිට යන ප්‍රදේශවල පස් පුරවා ඒ ප්‍රදේශවල මට්ටම උස් කරගෙන යාම නිසා, ජලය ගලාගෙන යාමට තිබුණු පිළිවෙළ නැති වී තිබෙනවා. මඳ වර්ෂාවක් ඇති වුනත් පාරවල් කීපයක්ම වතුරට යට වෙනවා. සාමාන්‍යයෙන් ධනපති කොටස් සහ උසස් මධ්‍යම පාන්තිකයන් පදිංචි වී සිටින ප්‍රදේශ හැටියට සලකන්නට පුළුවන් තර්ස්ටන් පාර, කේම්බ්‍රිජ් පෙදෙස පමණක් නොව එහා පැත්තෙන් දුප්පත් අය පදිංචි වී සිටින ප්‍රදේශත් වතුරට යට වෙනවා. ඒ යට වීම කරණකොටගෙන කොළඹ නගර සභාව අවුරුදුපතා ගංවතුර ආධාර වශයෙන් දස ලක්ෂ ගණනක් වියදම් කරනවා. වැසි වතුර එකතු වීම නිසා වතුරට යට වන ප්‍රදේශවල පදිංචි දුප්පත් උදවිය වෙනුවෙන් ගංවතුර ආධාර වශයෙන් අවුරුදුපතා වියදම් වන මේ විශාල මුදල ඉතිරි කර ගැනීම සඳහා මීට වඩා විශාල ණය මුදලක් ආණ්ඩුවෙන් හෝ බැංකුවකින් හෝ ලබාගෙන මේ ජල ගැලීම නැවැත්වීම සඳහා යම් කිසි ක්‍රමවත් වැඩ පිළිවෙළක් යොදන ලෙස යෝජනා කර තිබෙනවා. ඒ විධියේ යෝජනාවලින් ඡන්ද සොයා ගැනීමේ ව්‍යාපාරවලට කිසිම ආධාරයක් නොලැබෙන නිසා කව්රුවත් ඒ යෝජනාවට කැමති නැහැ. අවුරුදු 5 කට පමණ පෙර මා කොළඹ නගර සභාවට යෝජනාවක් ඉදිරිපත් කළා, කොළඹ නගරය මතුපිට ගලාගෙන යන වතුර නිසි විධියට පාලනය කිරීම සඳහා, විශේෂඥයකු ගෙන්වා ක්‍රමවත් වැඩ පිළිවෙළක් ඇති කළ යුතුය කියා. ඒ යෝජනාව ගැන තවම නිසි වාර්තාවක් ලැබී නැහැ.

ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් සෞඛ්‍ය නිලධාරීන් හැම දෙනාම හෙලා දකින දෙයක් අද කරන්නට සිදු වී තිබෙනවා. යම් යම් ප්‍රදේශ වතුරට යට වී ඒ වතුර ගලාගෙන යන්නෙ නැතිව තිබෙන විට කොළඹ නගර සභාව කරන්නෙ මොකක් ද ? කසළ කාණු විවෘත කර වැසි වතුර ඒ කසළ කාණුවලට ඇතුළු කරනවා. ඒ කසළ කාණුවලට මේ වතුර ගිහින් වෙනත් පහත් බිම්වල තිබෙන වැසිකිළිවලින් මතුවෙනවා. ඒ වතුර මතු වන්නේ ඒ කාණුවල තිබුණු කසළත් සමගයි. මේක කීපවිටක්ම සිදු වී තිබෙනවා. මේ විධියේ කරුණු ගැන නිසි වැඩ පිළිවෙළක් ඇති කරන්නට මත්තෙන් පහත් බිම් දියුණු කිරීමට ගෙන යන ව්‍යාපාරයෙන් නිසි ප්‍රතිඵල ලබා ගන්නට බැහැ. මුළු කොළඹ නගරයේම නියම සංවර්ධනය සඳහා නිසි විධියට නිර්මාණය කරන ලද ව්‍යාපාරයක් පළමු වෙන්ම තිබෙන්නට ඕනෑ. අද ඒ කටයුත්ත පිළිබඳව වැඩ බලන නිලධාරි මහත්මයාට මා දොස් කියනවා නොවෙයි. ඒ මහත්මයා ඉතාමත්ම දක්ෂයි. සැලැස්මවල් නම් කොළඹ නගරයේ හමස් පෙට්ටියේ ඕනෑ තරමක් තිබෙනවා. හැලොක් විජේනාදන් මහත්මයා නාගරික ඉංජිනේරු නිලය දැරූ කාලයේ පටන්ම ඒ නිලයට පත් වූ ඕ. පී. එස්. සේනාරත්න මහත්මයා, මීගම මහත්මයා, කුමාරනායගම් මහත්මයා ආදි ඉංජිනේරු මහත්වරුනුත්, අද ඒ නිලය දරණ කනගරායර් මහත්මයත් යන සියළු දෙනාම මේ පිළිබඳව ඉතාමත්ම දක්ෂ අය. ඒ අයගේ යෝජනාවල්, කෙටුම්පත් ඕනෑ තරම් සොයා ගන්නට පුළුවන්. එහෙත් ඒවා ක්‍රියාත්මක කරන්නට නම් තවම කව්රුවත් පියවරක් අරගෙන නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

ගරු කථානායකතුමනි, මේ අදහස් දෙකයි, මා විශේෂයෙන් ඉදිරිපත් කරන්නෙ. පළමුව වතුර ගලාගෙන යාමේ පිළිවෙළ සම්බන්ධව නිසි වැඩ පිළිවෙළක් ඇති කර නොගෙන, දෙවැනිව, මේ සමගම නියම නගර සංවර්ධන සැලැස්මක් ඇති කර නොගෙන, මේ කාරණය සම්පූර්ණ කර ගන්නට බැහැ.

දෙවනුව මේ පනතේ දුර්වලකම් කීපයක් තිබෙන බව පෙන්වා දෙන්නට කැමැතියි. මේ පනතින් යෝජනා කරන්නේ මේ ප්‍රදේශයන් පළාත් ආණ්ඩු සභාවකට අයිති වුණත් එය ඒ පළාත් ආණ්ඩු සභාවේ පාලනයෙන් ඉවත් කර මේ මණ්ඩල යට බාර දෙන්නටයි. එමෙන්ම ඒ කාලය තුළ ඒ පළාත් ආණ්ඩු සභාවට වුවමනා කරන නීති මේ ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වීම නතර කරන්නත් බලයක් ගන්නවා. ගරු කථානායකතුමනි, දිසාසභා පනතක් ඉදිරිපත් කරන්නට යෝජනා කරන මේ ආණ්ඩුව ඒ වෙනුවෙන් ආත්මාරක්ෂාවට ඉදිරිපත් කරන එකම කරුණ නම් පළාත් පාලන ස්වතන්ත්‍රය වැඩිකිරීමේ අදහසින් එය ඉදිරිපත් කරනවාය කියන එකයි. එසේ කියන ආණ්ඩුවක් මෙවැනි අණ පනත් කීපයක් මගින් පළාත් ආණ්ඩු සභා ස්වතන්ත්‍රය විනාශ කර දමන්න යනවා. එය මේ ආණ්ඩුව විශේෂයෙන්ම කරන දෙයක්. මීට පෙරත් එසේ කර තිබෙනවා. 1954 දී ආරක්ෂක ස්ථාන ඉදිරිපත් කළා. වාසනාවකට එය ක්‍රියාත්මක වී නැහැ. 1954 දී පැනවූ ඒ පනත අනුව ආරක්ෂක ස්ථානයක් හැටියට නියම කරන යම් ප්‍රදේශයක් ඇත්නම් පළාත් පාලන ඇමතිතුමාගේ කැමැත්ත ඇතිව එය පළාත් ආණ්ඩු සභාවෙන් ඉවත් කරනවාය කියා වෙන් කරන්නට පුළුවන්. ඔය බලය පවරා ගත්තේ Defence Stations Act, No. 38 of 1954 එකෙන්. මෙන්න එහි 2 වැනි ඡේදයේ 1 වැනි උප ඡේදය:

"2. (1) Where the Minister is satisfied that the whole or a major part of the land in any area is land on which defence establishments are situated, the Minister may, after consultation with the Minister of Local Government, by Order declare that the area, the limits of which shall be defined by the Order, shall be a defence station for the purposes of this Act."

මේ ඉදිරිපත් කර තිබෙන පනතේ 2 වැනි ඡේදයේ 1 වැනි උපඡේදය කුමක් ද? මම කියවන්නම්:

"2. (1) Where the Minister is satisfied that any area of land situated within the jurisdiction of any local authority specified in the First Schedule to this Act is a low-lying, marshy, waste or swampy area, he shall after consultation with the Minister of Local Government, by Order published in the Gazette, declare such area to be a Reclamation and Development Area for the purposes of this Act."

ගරු කථානායකතුමනි, එම විධියමයි; එම වචනමයි. පළාත් ආණ්ඩු සභාවලට අයිති ප්‍රදේශයන් ඒවායේ පාලනයෙන් ඉවත් කරන පනතක් තමයි මේ "ඩිෆේන්ස් ස්ටේෂන්ස් ඇක්ට්" කියන එක. අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල පනතත් එවැනි එකක්. මා එයට විරුද්ධ නැහැ. මා කියන්නේ එයිනුත් ඇතැම් ප්‍රදේශ පළාත් ආණ්ඩු සභාවේ පාලනයෙන් ඉවත් කර තිබෙන බවයි. ගංගා නිම්න සංවර්ධන මණ්ඩල පනත තවත් එකක්. කලින් තිබුණු ගල්ඔය සංවර්ධන මණ්ඩල පනත තවත් එකක්. ඕනෑම ප්‍රදේශයක් පළාත් ආණ්ඩු සභාවේ පාලනයෙන් ඉවත් කර පවරා ගන්නට ගරු ඉඩම් ඇමතිතුමාට පුළුවන්.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

කලින් තිබුණු කැලෑ ප්‍රදේශයන් ඒ මගින් අපි එළි කර, දියුණු කර, නගර බවට පත් කර ආපසු බාරදී තිබෙනව.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඒක තමයි චේතනාව.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

හුඟක් දුරට ක්‍රියාත්මක කරලත් තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
එහෙත් ඇමතිවරයකුගේ හිතේ තිබෙන අදහස් අනුව නීති සම්පාදනය කරන්නට අපට බැහැ. එසේ කරන විට ඒවා වැරදි විධියට පෙරළා ගන්නටත් ඉඩකඩ තිබෙනවාය කියන අදහසත් ඇතිවයි නීති සම්පාදනය කරන්නේ. ඕනෑම ප්‍රදේශයක් දියුණු කළ යුතු ප්‍රදේශයක් හැටියට නියෝගයක් මගින් නම් කළ වහාම එය පළාත් ආණ්ඩු සභාවෙන් ඉවත් වී ගරු ඇමතිතුමාගේ නැත්නම් මණ්ඩලයේ පාලනයට යටත් වෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
දියුණු කළාට පසුව ආපසු දෙනවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
එහෙත් ගරු ඇමතිතුමා ඒ පනතින් බලය ගන්නේ ලංකාවේ ඕනෑම ප්‍රදේශයක් දියුණු කළ යුතු ප්‍රදේශයක් හැටියට නියෝගයක් නිකුත් කළ වහාම ඒ පිළිබඳව ඒකාධිපති බලයක් ගරු ඇමතිතුමාට ලැබෙන අන්දමටයි; නැත්නම් ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයට ලැබෙන අන්දමටයි. ආණ්ඩුවක් තුළ තවත් ආණ්ඩුවක්.

ගරු කථානායකතුමනි, ඔය සියල්ලක්ම මදිවාට රාජ්‍ය කටයුතු භාර ගරු ඇමතිතුමා සංචාරක කටයුතු සඳහා පනතක් ඉදිරිපත් කළා. සංචාරක කටයුතු සංවර්ධන පනත යටතේ අණපනත් 52ක් තිබෙනවා. ඕනෑම මොහොතක එතුමාගේ නියෝගයක් මගින් යම් යම් දේවල් ක්‍රියාත්මක කිරීම නතර කරන්නට එයින් බලය ලැබෙනවා. පළාත් පාලන කටයුතු භාර ගරු ඇමතිතුමා සමග කරනු ලබන සාකච්ඡාවකින් පසු ඕනෑම ප්‍රදේශයක් සංචාරක කටයුතු සම්බන්ධයෙන් දියුණු කළ යුතු ප්‍රදේශයක් හැටියට තීරණය කරන්නට හැකි වෙනවා. ඉන් පසු ඒ ප්‍රදේශ පළාත් පාලන ආයතනවලින් ඉවත් කර එතුමාගේ මණ්ඩලයට පවරන්නට පුළුවනි. මම එකක් කියන්නම්. මේ සම්බන්ධයෙන් කරුණු පෙන්නුම් කර දුන් විට ඒ සමග ඉදිරිපත් කරන ලද සංශෝධන කිහිපයක් ස්ථාවර කාරක සභාව භාර ගත්තා. ඒ ගැන මම පසුව විස්තර කරන්නම්. එහෙත් ඒ යෝජනාවෙන් ඉදිරිපත් කළේත් මේ විධියේ අදහසක් බව කියන්නට ඕනෑ.

දැන් ගරු ඉඩම් ඇමතිතුමා කොළඹ අවට ප්‍රදේශ (පහත් බිම් ප්‍රදේශ) දියුණු කිරීමේ 'පනතක්'ය කියා 'මෙතැනට පනතක් ගෙන එනවා. එය යටතට එන්නේ කවර ප්‍රදේශද? පනත් කෙටුම්පතේ සඳහන් වන නාම ලේඛනය මම කියවන්නම්: කොළඹ මහ නගර සභාව, දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාව, කෝට්ටේ නගර සභාව, කොළොන්නාව නගර සභාව, පෑලියගොඩ නගර සභාව, වත්තල-මාබෝලෙ නගර සභාව, මොරටුව නගර සභාව, පිළියන්දල සුළු නගර සභාව, මහරගම සුළු නගර සභාව, හැඳල සුළු නගර සභාව, දලුගම සුළු නගර සභාව, කැළණිය සුළු නර සභාව, බත්තරමුල්ල-තලංගම සුළු නගර සභාව, මුල්ලේරියාව සුළු නගර සභාව, කොටිකාවත්ත සුළු නගර සභාව, අඹතලෙන් පහළ ගම් සභාව, කෝට්ටේ-ගල්කිස්ස ගම් සභාව, මාම්පෙ-කැස්බෑව ගම් සභාව. මේ මහ නගර සභා, නගර සභා, සුළු නගර සභා සහ ගම්සභාවලට අයත් ප්‍රදේශවලින් ඉඩමක් අරන්, කොටසක් වෙන් කර, "මම තමයි මේකට ඒකාධිපති නිලය දරණ තැනැත්තා" කියාගෙන එනවා.

මේ කෙටුම්පත් පනතේ තිබෙන අදහස් මා පිළිගන්නවා. එහෙත් එය කරන්නට ඉදිරිපත් කරන නීතියේ තිබෙන දුර්වලකමයි මා පෙන්නුම් කරන්නේ. විශේෂයෙන් ඒ ගැන කරුණු කිහිපයක් පෙන්වන්නට තිබෙනවා. එපමණක් නොවෙයි. 26 වැනි වගන්තියේ එන කරුණු ගැන එදා ගරු ඇමතිතුමාට මා පෙන්වා දුන්නා. පනත් කෙටුම්පතේ එන පළමුවැනි උපලේඛනයේ ප්‍රදේශ සඳහන් කර තිබෙනවා. දෙවැනි උපලේඛනයෙන් පෙන්නුම් කරන නීති ක්‍රියා විරහිත කරන්නට එතුමාට බලය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

ලැබෙනවා. මොනවාද ඒ නීතිමය කොටස් ? මහ නගර සභා ආඥාපනත, නගර සභා ආඥාපනත සුළු නගර සභා ආඥාපනත, ගම්සභා ආඥාපනත, නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත, නිවාස සහ නගර සංවර්ධන ආඥාපනත, ජාතික නිවාස පනත. ගරු ඇමතිතුමාට ඕනෑම මොහොතක මේවා ක්‍රියා විරහිත කරන් නට පුළුවනි, නියෝගයක් දමා. මේ කරුණ ගැන නම් අපේ කැමැත්තක් නැහැ.

මේ මණ්ඩලය ගැන ඊළඟට කියන් නම්. මේ මණ්ඩලයේ හත් දෙනෙක් ඉන්නවා. කවුද ඒ හත් දෙනා ? එක් කෙනෙක් වාරිමාර්ග අධ්‍යක්ෂතුමායි. ඊළඟට නගර නිර්මාණ අධ්‍යක්ෂතුමා ඉන්නවා. තුන්වැන්නා හැටියට ජාතික නිවාස කොමසාරිස්වරයා ඉන්නවා. ඒ තුන් දෙනාට අමතරව තවත් හතර දෙනෙක් මේ මණ්ඩලයේ ඉන්නවා. ඒ අය ගරු ඇමතිතුමා විසින් පත් කරනු ලබනවා. මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු එක් කාරණයක් තිබෙනවා. ඇයි එක ඉංජිනේරු මහත්මයකුවත් පත් කරන්නෙ නැත්තෙ ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

Director of Irrigation ?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඔව්, වාරිමාර්ග අධ්‍යක්ෂතුමා ඉන්නවා තමයි. එතුමාත් ඉංජිනේරු මහත්මයකු ගේ වැඩ දන්නවා වෙන්නට පුළුවනි. එහෙත් ඒ කටයුත්ත පිළිබඳව විශේෂඥ යකු හැටියට ගත හැකි කෙනෙක් ඉන් නවාද ?

ගරු කථානායකතුමනි, මේ විධියේ ප්‍රශ්නයක් ගැන මා වාරිමාර්ග දෙපාර්ත මේන්තුවේ අධ්‍යක්ෂතුමාට හෝ ඒ දෙපාර්තමේන්තුවට හෝ ගැරහීමක් කරන්නට අදහසක් කරන්නේ නැහැ. ඒ කාටවත් මා දොස් තබන්නට අදහස් කරන්නේ නැහැ. එහෙත් එකක් කියන් නට ඕනෑ. මෙතෙක් ඒ දෙපාර්තමේන් තුවට අයිතිව තිබුණු යම් යම් කටයුතු වග යක් තිබුණ නම්—කොළඹ කටයුතු ගැනයි මා අදහස් කරන්නේ—ඒ එකක්වත් හරි යාකාර ඉෂ්ට කර නැති බවයි මා කියන්නෙ.

දෙමටගොඩ ඇළක් තිබෙනවා. ගරු ඉඩම් ඇමතිතුමා එය දන්නවා. වැල්ල වත්තේ තිබෙන මෝඩ ඇළ නම් ඇළ ගැනත් ගරු ඇමතිතුමා දන්නවා. දෙහි වලත් ඇළක් තිබෙනවා. සාමාන්‍යයෙන් මේවා පාලනය වන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගිනුයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

නැහැ, දැන් අවුරුදු තුනක හතරක කාලයක සිටයි. ළඟදී වාරිමාර්ග දෙපාර්ත මේන්තුව ගත්තේ. මම ඇමති වුණාට පස්සෙ මගේ නියෝගය උඩ පී. ඩබ්ලිව්. ඩී. එකෙන් ගත්තා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඒවා නිසි විධියට සිද්ධ වුණාද, නිසි විධි යට භාරනවාද, වතුර හරියට බැස යනවා දැයි සෝදිසි කළාද ? ඒ වැඩ කෙරෙනවා ද ? කිසිම දෙයක් කර නැහැ. ඒවායේ ඉවුරු කැඩීගෙන යනවා. විශේෂයෙන් මෝඩ ඇළේ උතුරු ඉවුර දිය වීගෙන යන වා. එසේ දිය වී යාම වළක්වන්නැයි ඉල්ලු වාම ඒ අවට පදිංචි දුප්පතුන්ට කියා තිබෙනවා, ඔවුන්ගේම වියදමෙන් සිමෙන් තියෙන් පවුරක් බැඳ ගන්නය කියා. ඒ දුප්පතුන්ට එය කිරීමට තරම් වත්කමක් නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

කලින් ඒ ඇළවල් අයිතිව තිබුණේ පළාත් පාලන ආයතනවලට හා රජයේ වැඩ දෙපාර්තමේන්තුවටයි. සුද්ධ නොකර අවුරුදු ගණන් තිබීම නිසා ඒ ඇළවල් ගොඩ වීගෙන ආවා. ඒ නිසා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පවරාගෙන දැන් ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇළවල් හාරා තිබෙනවා. ඒවා සුද්ධ කර බඳින්නට මේ අය-වැය ලේඛනයෙන් පවා මුදල් වෙන් කර තිබෙනවා. අවුරුදු ගණනාවක් සුද්ධ නොකර තිබුණු ඒවා එක් වරම සුද්ධ කරන්නට බැහැ. එම නිසා ක්‍රම ක්‍රමයෙන් එම වැඩ කටයුතු කර ගෙන යනවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
**(Mr. Bernard Soysa)**

කොළඹ නාගරික ඉන්ජිනේරු මහතාත්, වාරිමාර්ග අධ්‍යක්ෂතුමාත්, විශේෂයෙන් කොළඹ ප්‍රදේශයට අයත් මන්ත්‍රීවරුනුත් කැඳවා මේ ප්‍රශ්නය විසඳීම සම්බන්ධයෙන් සාකච්ඡාවක් පවත්වන්නැයි කොළඹ සම්බන්ධතා කමිටුවෙන් මා ඉල්ලීමක් කර තිබෙනවා. එහෙත් තවමත් ඒ අනුව කටයුතු කෙරී නැහැ.

අපේ ප්‍රදේශයට අයත් මෝඩ ඇළ ගැන විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. නියම විධියට සුද්ධ කර නැති නිසා වර්ෂා කාලයේදී වතුර ඒ ඇළ මාර්ගයෙන් මුහුදට නියම විධියට ගලාගෙන යන්නේ නැහැ. නියං කාලයේදී ඒ ඇළෙන් ගඳ ගහනවා; මැස්සන්, මදුරුවන් බෝ වෙනවා. එම නිසා ඒ පළාතේ වත් ඉන්න බැරි තරම්. මේ ගැන යම් පියවරක් ගත යුතුය යන අදහස මා විටින් විට ඉදිරිපත් කර තිබෙන්නේ ඒ නිසයි.

ඒ වාගේම, දෙමටගොඩ ඇළ නිසා දෙමටගොඩ-කිරුළපනේ ප්‍රදේශයේ බරවා රෝගය පැතිරෙනවා. ඉඩම් ඇමතිතුමාගේ පාලනය යටතේ තිබෙන මේ ඇළවල් පිළිබඳව——

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
**(The Hon. Wanninayake)**

මෙය සම්මත වුණාම සේරම හරියයි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
**(Mr. Bernard Soysa)**

නීති-රීති සම්මත කර ගන්නා නමුත් ඒ පිළිබඳව නිසි වැඩ පිළිවෙළක් සකස් කෙරෙන්නේ නැහැ. ඒ කාරණය ගැන සලකා බලා තමයි මා කියන්නේ, වාරිමාර්ග අධ්‍යක්ෂතුමා හැරෙන්නට මේ නියෝජිත පිරිසට ඉන්ජිනේරු මහතකුත් සිටියා නම් හොඳය කියා.

පළාත් පාලන ආයතන සතු ස්වතන්ත්‍රය නැති කිරීමේ අදහසක් මේ රජය තුළ නැත්නම්, සංවර්ධනය කරන්නට බලාපොරොත්තු වන ප්‍රදේශ අයත් පළාත් පාලන ආයතනවල නියෝජිතයන්ද මේ මණ්ඩලයට ඇතුළත් කර ගත යුතුයි. උදාහරණයක් වශයෙන්, කොළඹ නගර සභා ප්‍රදේශය සම්බන්ධයෙන් නම් කොළඹ නගර සභාවේ ඉන්ජිනේරු මහතාත්, නගර සභාව මඟින් පත් කරන නියෝජිතයකුත් මේ කටයුත්තට සහභාගි කර ගත යුතුයි. ඒ විධියට කටයුතු නොකරනවා නම් තමුන්නාන්සේලා ඒ පළාත් පාලන ආයතනත් සමඟ වුවමනා නැති ඝට්ටනයක් ඇති කර ගන්නවා. එම නිසා, මා කී විධියට කටයුතු නොකෙරෙනවා නම් තමුන්නාන්සේලාගේ පරමාර්ථය හොඳ වුණත් ගන්නා පියවර නම් ඒ තරම් හොඳ නැති බව කිව යුතුව තිබෙනවා.

මේවා රජයට ගෙන දියුණු කරනවා. මේවා දියුණු කළාට පස්සේ කරන්නට යන්නේ කුමක් ඇයි මේ පනත් කෙටුම්පතේ සඳහන් වී නැහැ. අනාගත තත්ත්වය ගැන කිසිම වචනයක් මෙම පනතේ සඳහන් නොවන නිසා කොළඹ පහත් බිම් ප්‍රදේශ ගොඩ කිරීමේ සහ සංවර්ධන කිරීමේ මණ්ඩලය තව කලක් යන විට කොළඹ ප්‍රදේශයේ විශාලම ඉඩම් හිමියා බවට පත් වෙනවා ඇති. කොළඹ දිස්ත්‍රික්කයේ මුතුරාජවෙලින් පටන්ගෙන කොළඹ නගරයේ මාලිගාවත්තට එනතුරු වගුරු බිම් තීරයද, ඊළඟට පුරාණ නාරාහේන්පිට ගමේ සිට කෝට්ටේ දියවන්නා ඇළ දක්වා ඇති වගුරු බිම් ද පවරා ගත්තොත් ඇත්තෙන්ම මෙම මණ්ඩලය කොළඹ දිස්ත්‍රික්කයේ ලොකුම ඉඩම් හිමියා වෙනවා. ඒ විතරක්ද? මෙම මණ්ඩලයට බොල්ගොඩ දක්වා වූ වගුරු බිම් පවරා ගන්නට පුළුවනි.

මහජනයාගේ මුදල් වියදම් කොට මෙම වගුරු බිම් ගොඩකොට ඒවා පාවිච්චිය සඳහා සූදානම් කර ගත්තාට පසුව ඒවාට කරන්නට යන්නේ මොකක්ද? මේ ඉඩම් අයිති මණ්ඩලය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

මේවාට කරන්නට යන්නේ මොනවාද? ඒ සම්බන්ධයෙන් වචනයක්වත් මෙම පනතේ සඳහන් වන්නේ නැහැ. [බාධා කිරීමක්] මා මෙම පනත සම්බන්ධයෙන් යෝජනා වගයක් ඉදිරිපත් කරන්නට ඕනෑ. මගේ පනත ඉදිරිපත් කරන්නට දුන්නේ නැහැ නොවැ? මෙම මණ්ඩලය ඉඩම් අයිති කර ගත්තාම මේ ඉඩම්වලට කරන්නේ මොනවාද? මෙම ඉඩම් රජයේ කටයුතු සඳහා යොදවනවාද? නියම සැලැස්මක් අනුව මෙම ඉඩම් දියුණු කොට පාවිච්චියට ගන්නවාද? එසේ නැත්නම් විශේෂ බදු ක්‍රමය යටතේ ඉඩම් දෙන ලද ආකාරයටම පුද්ගලයන් කිප දෙනකු තෝරාගෙන මෙම ඉඩම් දෙන්නට යනවාද? ස්වල්ප දෙනකු තෝරාගෙන ඒ අයගේ වාසිය සඳහා මෙම ඉඩම් දෙන්නට යනවාද?

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

දුප්පත් මිනිසුන්ගේ ප්‍රයෝජනය සඳහා මෙම ඉඩම් දෙනවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

මොරටුවේ ගරු මන්ත්‍රීතුමා (එම්. රස්කින් ප්‍රනාන්දු මයා.) වැනි දුප්පතෙකුට ඉඩම් දෙන්නට යෝජනා කළ හොත් එය අනුමත කරන්නට නම් අපට බැහැ. අපේ ගරු මුදල් ඇමතිතුමා නම් දුප්පත් මිනිසකු බව පිළි ගන්නට ඕනෑ. එතුමා මුදල් ඇමති නිලය දැරුවත් එතුමාට මුදල් නැහැ. එතුමාගේ භාණ්ඩාගාරයේත් මුදල් නැහැ. දැන් පිටරටින් මුදල් අරන් ඒවි යයි බලාපොරොත්තුවෙන් සිටිනවා.

මේ ඉඩම්වලින් කරන්නට බලාපොරොත්තු වන දේ කුමක්ද යන්නට පිළිතුරක් දෙන්න. මේ මණ්ඩලය පවරා ගන්නා ඉඩම් ගොඩ කිරීමෙන් පසුව පෞද්ගලික ධනපතියන්ට, එසේ නැත්නම් කොම්පැනිවලට ඒවා දෙන්නට යනවාද? එසේ නොමැතිව රජයේ නිවාස ක්‍රම සඳහා හෝ වෙනත් රජයේ වැඩ කටයුතු සඳහා හෝ ඒවා යොදවා ගන්නට යනවාද? නියම සැලැස්මක් ඇතිව ඒවා වැඩි දියුණු කර සාමාන්‍ය ජනතාවගේ ප්‍රයෝජනය සඳහා ඒවා යොදවන්නට යනවාද? ඇත්තෙන්ම පුද්ගලයන් ස්වල්ප දෙනකුට මෙම ඉඩම් පවරා දෙනැයි මගේ හිතේ ලොකු භයක් තිබෙනවා. විශේෂ බදු ක්‍රමය යටතේ ඉඩම් දුන්නා වාගේ පුද්ගලයන් කිප දෙනකුගේ වාසිය තකා මෙම ඉඩම් දෙන්නට පුළුවනැයි භයක් තිබෙනවා.

අද ඉතාමත් වටිනා දෙයක් හැටියට "පිට්" සැලකිල්ලට භාජන වී තිබෙනවා. මෙම "පිට්" සම්බන්ධයෙන් කුමන විධියේ පියවරක් ගන්නට බලාපොරොත්තු වෙනවාද? විශේෂයෙන්ම මුතුරාජවෙල දක්වා මේවා සොයා ගන්නට පුළුවනි. මීට ප්‍රථම කිසිදු වටිනාකමක් නැති හැටියට සලකන ලද නමුත් අද විශෙෂ වටිනාකමක් ඇති හැටියට සලකනු ලබන මේ ඉඩම් පිළිබඳව කුමන පියවරක් ගන්නවාදැයි මා ප්‍රශ්න කරනවා. මෙම ඉඩම් පිළිබඳව යම්කිසි වැඩ පිළිවෙළක් යෝජනා කරන අවස්ථාවක ඒ වෙනුවෙන් කුමන අන්දමේ පියවරක් ගන්නවාද යන්නට සාක්ෂියක් අපට අවශ්‍යයි.

Mr. Speaker, I wish to say a few words in English on this matter. I shall be brief. I shall not repeat everything I said in Sinhala.

The principal question is that this Bill, which aims at the reclamation of the low-lying areas in and about Colombo or in the greater Colombo area, cannot in fact produce valuable results unless it is geared to the planned development of Colombo also or the local government areas within which this Bill in supposed to operate.

At the moment the Colombo Municipal Council has an acting planning officer, a very able officer, who has risen from the rank of inspector. He is now only acting planning officer. I think the hon. Parliamentary Secretary to the Minister of Local Government knows him very well.

There have been several attempts made by the Colombo Municipal Council to have a permanent planning officer. The fair member for Hunupitiya in the Colombo Municipal Council moved a motion

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

asking that, if a planning officer could not be found in Ceylon, a person be obtained from abroad, and that one of the officers of the council be sent for special training in planning work and brought back to the service of the council.

This matter was, of course, debated and the matter was referred to the engineers for report. That report has come back from the engineers.

I know that in the meantime, for purely prestige reasons, with the pettiness that operates very often in certain sections at least of the United National Party, they have decided to shelve that motion ; and others are now conducting independent negotiations regarding planning officers. It is a question of who should get the credit for something—a very important matter these days, I believe.

However, I must mention this. In the absence of a real planning arrangement in the Colombo Municipal Council, I was once asked to serve on a special committee in respect of planning. I must confess I did not attend any meeting of that committee, because I found that that planning committee was constantly meeting in order to plan how to plan. For one year they planned to plan and the committee was dissolved and no plan was produced.

The Housing and Town Improvement Committee meets regularly, once a month, and changes street names. That is the only town improvement that is done, and you get some impossible names. All the titles, sub-titles, and designations must be given before you come to " Mawatha ". By the time one has repeated all the names before " Mawatha " one is out of breath. By the time you have given the designation, whether it be " Sir " or " Doctor ", then the name, and then the surname, which is polysyllabic like Senanayake, Wanninayake or Jayewardene, and then such titles as J.P.U.M., M.B.E. and C.B.E., by the time you have said all that, before you come to " Mawatha ", you are out of breath.

One of these days they might adopt an Indian practice. In one of the more civilized states in Northern India, there was a practice that before the subject mentioned aloud the name of the King or the Maharajah, he had to repeat the titles 108 times. 108 වරක් කියවා ජීවම් කළාට පසුවයි නම කියවෙන්නේ.

One of these days you will find the Colombo Municipal Council adopting that formula. I say this, Sir, because we have seen within Colombo very little town improvement. The surface-draining in the city of Colombo is in a woeful condition. People buy land in order to build houses ; they raise the level of the land, and the natural surface-draining of the city of Colombo has been disturbed consequently, with the result that there is constant flooding and the Municipality is engaged in spending vast sums of money every year on flood relief.

Now, Sir, I have to ask the Hon. Minister of Land to have a proper surface-draining scheme drawn up before he proceeds to implement this Bill.

The second matter is that there should be a proper plan of development of the city of Colombo instead of merely name-changing before he can implement this Bill.

Then I have also to point to certain defects in this Bill. Everybody wants to become a dictator today. In 1954, there was this Defence Stations Act which took away from the local authorities areas under their purview. If an area was called a defence area, you took away that area from the purview of the local authority.

Various preservation boards are set up. I do not object to them they are meant for the purpose of protecting shrines, but they take away the powers of local authorities.

The Hon. Minister of State brought the Tourist Development Bill in which he proposed to suspend the operation of a large number of local government laws and to take away areas from local authorities under the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

purview of the board. I am glad that he accepted a number of amendments in the Committee stage, in the Standing Committee, which mitigated somewhat the otherwise dire effects of that Bill.

The Hon. Minister of Land brought his River Valleys Development Board under which by Order he declares an area to be an area for development and takes away that from the purview of the local authority.

And now the Hon. Minister of Land is bringing another Bill in which he gives himself the power by Order—of course, with the consent of the Minister of Local Government—to declare any area within the limits mentioned in the Schedule an area for reclamation, and the moment he declares an area for reclamation it goes out of the purview of that local authority. He becomes a dictator. The Hon. Minister of Land is a Mussolini Cabinet by himself—Land, irrigation and power, a number of boards and corporations, are all under him. He is a Mussolini Cabinet!

Now, Sir, he has several of these Acts which give him all these powers—the Crown Lands Ordinance, Land Development Ordinance, River Valleys Development Act, Colombo (Low-Lying Areas) Reclamation and Development Act. Does the Hon. Prime Minister realize that under Clause 26 he can keep on adding to the Schedule? The Hon. Minister can add areas to this First Schedule.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

Within the Colombo District.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

That has to be tested in a court of law.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

We are amending it.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

You are going to amend it? Then you can amend the Second Schedule to include the ordinances and laws that you suspend. I would be very glad if one of these days you include the Public Security Ordinance in that Schedule.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

You want that amended?

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

Yes. If that be one way of getting rid of the Public Security Ordinance. Under this the Hon. Minister can bring almost any law.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

They must be passed in both Houses.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

This Order need not be passed in either House. None of these Orders come here. Only the Regulations come here. No Order that he makes will come before this House.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

We can amend that also.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

You are prepared to amend that also?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
Democratic dictatorship !

බර්නාඩ් සොයිසා මයා.
*(திரு. பெர்ஞட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

You talk of extension of democracy at local government level. You are progressively destroying democracy at the local government level. Local autonomy is being destroyed by Bills of this kind. You may want special instruments for the purpose of executing development programmes. I grant that. Then why do you not include in this a representative of the local authority in whose area you are going to operate ? If you are operating in Colombo, the Municipal Engineer and at least one representative elected by the council can be included. Why do you not include the Municipal Engineer and at least one representative elected by the council so that there can be regular consultation at all levels—the council level and the executive level—for the purpose of giving effect to the provisions of this Bill ? You had the same arrangement in the Special Areas Development Board. The Colombo Special Areas Development Board which took away certain areas from the purview of the Colombo Municipal Council provided that the council shall be represented on that board. You had the Deputy Secretary to the Treasury; you had the Public Works Department and various other persons on that board. You also had the Colombo Municipal Council represented there. There were the Municipal Engineer, the Municipal Commissioner and members elected by the council. The Mayor was an ex-officio member on that board. I am not suggesting that there should be large representation from Colombo, but certainly from the area within which you operate. The local government authority functioning in that area should have some representation. Is the Hon. Minister prepared to accept an amendment for that also ?

The last matter I raised was this. We are not told what will happen to the lands that are acquired by this board. This board will be acquiring large tracts of land from the north of Ja-ela right down to Mampe-Kesbewa area. After some time, within Colombo District this board will be the largest landowner. What are you going to do with these lands ? Are those lands to be given out to private parties, firms or private individuals, by way of gift or grant or lease or long lease or special lease ? Are these lands to be developed by the State in accordance with housing needs or for the development of industrial areas ? Sir, I want to mention for the information of the Hon. Minister of Land, Irrigation and Power, that there have been some very competent engineers in Colombo from the days of Mr. Hallock Wijenathan, Mr. O. T. F. Senaratne, Mr. Meegama, Mr. R. Kumaranayagam and Mr. Canagarayer, who is holding the office today. In their time there were various development schemes drawn up but none of them have been put into effect.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

By whom ? The Minister of Housing ?

බර්නාඩ් සොයිසා මයා.
*(திரு. பெர்ஞட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

Yes.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I am not responsible for that.

බර්නාඩ් සොයිසා මයා.
*(திரு. பெர்ஞட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

You are not.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I shall use all those plans.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பேர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

The Hon. Minister has made no provision in this Bill to obtain the slightest degree of co-operation of the Council.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

The Board will do it, if necessary.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பேர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

Will you accept an amendment that there shall be on the board a representative of the local authority of the area in which you operate? We do not want the Colombo Municipal Council to operate in Mampe-Kesbewa or Piliyandala. At least when you operate within a certain area the local authority representative from the area should be there. You can easily provide for that so that their point of view too will be known.

There are so many ways in which this question of the low-lying areas can be looked into. I want to state for the information of the Hon. Minister—I am not a technical man myself—that when the scheme for the resuscitation and restoration of the old Dutch canals was mentioned to me, it caught my imagination. If, in fact, the old Dutch canals are restored and properly maintained—

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

On that point, I want to point out to the hon. Member that at page 226 of the current Estimates of Revenue and Expenditure, that is, the 1967-68 Estimates, under Head 60, Vote No. 7, Item 16, there is provision for " Reconditioning of drainage lines in Colombo area " in a sum of Rs. 1 million. These include the old Dutch canals, mostly, and some other canals.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பேர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

I am glad the Hon. Minister has provided the money——

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

Long before you told me to do so.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

We give you credit for it.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I do not want the credit for it.

බර්නාඩ් සොයිසා මයා
(திரு. பேர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

The idea was mentioned to me even before the 1967-68 Estimates were drafted. Some other source had the inspiration for what he has proposed to do in the course of this year, but I wish something is done because if these canals are restored and properly used, they will not only help in surface drainage but also take some of the traffic away from the principal trunk routes by providing water transport to passengers and goods, principally goods from the harbour of Colombo right into various areas. Around these areas you will be able to develop industrial regions without disturbing the residential sections of greater Colombo by your method of industrial development or by developing roads to carry fairly heavy traffic.

I want to recommend this idea to the Hon. Minister and I also want a safeguard introduced in this Bill in order that the democracy at the local government level might not be destroyed by the operation of this Bill.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I would request the Hon. Minister to see that the amendments made at the proper stage are accepted.

As far as this matter is concerned, subject to these amendments being properly accepted, we are in support of the principles embodied in the Bill.

අ. භා. 3.32

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

මමත් මේ පනත් කෙටුම්පත් සම්බන්ධව වචන ස්වල්පයක් කථා කරන්නට අදහස් කරනවා. දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) තම කථාවේ ඉංග්‍රීසියෙන් කළ කොටසේ අග හරියේදී වැදගත් අංශයක් ගැන සඳහන් කළා. මේ කොළඹ නගරයේ සහ ඒ අවට තිබෙන ඇලවල් ගැන එතුමා සඳහන් කළා. ඕලන්ද ඇලවල් හැටියට හඳුන්වන මේ ඇලවල්වලින් තවම නියම ප්‍රයෝජනයක් ගෙන නොමැති බව එතුමා සඳහන් කළා. ඒක සම්පූර්ණ ඇත්තක්. මේ ඇලවල් දැනට මඩවලින් පිරී ගෙන යනවා. විශේෂයෙන්ම ගමනාගමනය සඳහා මගීන්ට බෝට්ටු මගින් ගමන් බිමන් කරන්නට පමණක් නොවෙයි නොයෙකුත් ද්‍රව්‍ය, බඩු බාහිරාදිය එහා මෙහා ගෙන යාමටත් මේ ඇලවල් පාවිච්චි කරන්නට පුළුවන්කම තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ ඇලවල් වල පිහිටීම ගැන කල්පනා වන විටත් මේවායින් විශේෂ ප්‍රයෝජනයක් ගන්නට පුළුවන්කම තිබෙන බව අපට පෙනී යනවා.

දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) එතුමාගේ කථාවේදී සඳහන් කළාක් මෙන්ම පොළව මතු පිටට වැටෙන ජලය බැස යන්නට අද තිබෙන මාර්ග හුඟක් දුරටම ඇහිරී තිබෙන නිසා අද මිනිත්තු 5 ක් තුළ වුවත් වර්ෂාවක් ඇතිවුණොත් නගරයේ ප්‍රධාන පාරවල් ගණනාවකම මෝටර් රථයකටවත් යන්නට බැරි තත්ත්වයක් ඇති වෙනවා. ඔය අළුතෙන් පුරවන ලද ප්‍රදේශවල පමණක් නොවෙයි හයිඩ් පාක් කෝනර් වැනි ස්ථානත් අද මේ උවදුරට ගොදුරු වෙනවා. එමනිසා පොළව මතු පිටට වැටෙන ජලය බස්වා හරින්නට මේ ඇලවල් හැකි තරම් හාරා ඒවායේ නඩත්තුව පිණිස නැත්නම් ඒවායේ පැවැත්ම පිණිස යම් වැඩ පිළිවෙළක් යෙදීම ඉතාමත්ම අවශ්‍යයි.

විශේෂයෙන්ම මා මුලින් සඳහන් කළා වාගේ මේ ඇලවල් ගමනාගමනය සඳහා ප්‍රයෝජනවත් කර ගන්නට පුළුවනි. අප වරක් මේ කාරණය පිළිබඳව නගර නිර්මාණ අධ්‍යක්ෂතුමා සමග සාකච්ඡා කළා. අද මගීනට කොළඹ නගරයට එන්නට තිබෙන බස් රථ, දුම්රිය ආදී පහසුකම් වලට අමතරව මේ ඇලවල් හරහා බෝට්ටු මගිනුත් මගීනට කොළඹ නගරයට එන්නට පහසුකම් යොදන්නට පුළුවන් කම තිබෙන බව එම සාකච්ඡාවේදී අපට පෙනී ගියා. එවැනි වැඩ පිළිවෙළක් ඇති කළොත් අද තිබෙන ගමනාගමන අපහසුව සැහෙන තරමකින් විසඳා ගන්නට පුළුවනි. උදාහරණයක් වශයෙන් ග්‍රෑන්ඩ් පාස් කෙළවරේ සිට, කැළණියේ සිට කොළඹ කොටුවට පැමිණෙන මගීන්ට මේ ඇලවල් මාර්ගයෙන් බෝට්ටුවලින් එන්නට පුළුවනි. ඒවාගේම දකුණු කොළඹ පැත්තෙන් එන මගීන්ටත් ඒ ආකාරයට බෝට්ටුවලින් ගමනාගමනය කරන්නට වැඩ පිළිවෙළක් යොදන්නට පුළුවන්කම තිබෙනවා. ඔය විධියට බඩු බාහිරාදිය එහා මෙහා ගෙන යාමට පමණක් නොවෙයි මගීන්ගේ ගමනාගමනයටත් මේ ඇලවල් පාවිච්චි කරන්නට පුළුවන්කම තිබෙනවා.

ගරු කථානායකතුමනි, අද මේ නගරය තුළ නගරයේම තිබෙන්නට අවශ්‍යතාවක් නැති කර්මාන්තශාලා විශාල සංඛ්‍යාවක් තිබෙනවා. නගරයේ සෑම තැනම වාගේ එවැනි කර්මාන්තශාලා තිබෙනවා. ඒ කර්මාන්තශාලාවලින් නිකුත් වන ජලය සහ වෙනත් නිකුත් කළයුතු ද්‍රව්‍යවලින් අද මේ සමහර ඇලවල් පිරී ගොස් තිබෙනවා. ග්‍රෑන්ඩ්පාස්, මාළිගාවත්ත ප්‍රදේශවල තිබෙන ඇලවල් සම්පූර්ණයෙන්ම වාගේ ඒ කර්මාන්තශාලාවලින් නිකුත් වන ඒ ද්‍රව්‍යවලින් පිරී ගොස් තිබෙනවා. ඒවා පවිත්‍ර කිරීමේ කිසිම වගකීමක් ඒ කර්මාන්තශාලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

හිමියන්ට නැහැ. ඉඩම් ඇමතිතුමා නම් පසුගිය කාලයේ යන්ත්‍රයක් දමා ඒ ඇලවල් ශුද්ධ කළ බව මා දන්නවා. නමුත් එපමණකින් ඒ ඇලවල්වලින් ප්‍රයෝජනයක් ලබා ගන්නට පුළුවන් කමක් නැහැ.

වගුරු බිම් සැලැස්ම අරගෙන බැලුවොත් කොළඹ නගරය තුළ වගුරු බිම් අක්කර 700ක් පමණ තිබෙන බවත් කොළඹ අවට ප්‍රදේශයේ වගුරු බිම් අක්කර 2,500ක් පමණ තිබෙන බවත් අපට පෙනෙනවා. වාසනාවකට වාගේ කොළඹ නගරයේ තිබෙන වගුරු බිම් අසළින්ම මේ ඇලවල්ද ගලා ගෙන යනවා. ඒක ලොකු වාසියක්. සංවර්ධනය කිරීමේදී නිකම් පස් පුරවා වගුරු බිම් ගොඩ කිරීමෙන් පමණක් අපට මේ ප්‍රශ්නයට මුහුණ දෙන්නට බැහැ. දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා කීවාක් මෙන් එයින් සිදු විය හැක්කේ පොළව මතු පිටට වැටෙන ජලය බැස යන්නට මාර්ග නොමැතිවීමෙන් වැඩි වැඩියෙන් පාරවල්, ගෙවල් දොරවල් ජලයෙන් යටවීමයි. ජලය බැස යැවීම සඳහා මෙම ඩ්‍රේනේජ් ක්‍රමය නියමිත පිළිවෙළට සකස් කිරීමේදී මේ ඇලවල් ඉතාමත් ප්‍රයෝජන වන බව වාරිමාර්ග දෙපාර්තමේන්තුව මෙන්ම තමුන්නාන්සේත් පිළිගන්නවාට කිසිම සැකයක් නැහැ. මේ නගරයේ සහ නගරය අවට ඇති ඇලවල් නියම අන්දමට ප්‍රතිසංස්කරණය කර ඒවායේ මඩ ඉවත් කොට මෙම ජලය බැස යාමට සුදුසු වැඩ පිළිවෙළවල් යෙදීම ඉතාමත් අවශ්‍යයි. එසේ කිරීමෙන් ප්‍රයෝජනවත් කරුණු දෙක තුනක් ඉටු වෙනවා. පොළොව මතුපිටට වැටෙන ජලය බැස යැවීමට අවශ්‍ය ප්‍රධාන මාර්ගයක් හැටියට එය පාවිච්චි කරන්නට හැකි වීම ඉන් එක් කාරණයක් හැටියට සලකන්නට හැකියි. ඊළඟට, බඩු බාහිරාදිය එහා මෙහා ගෙන යාම පිණිසත් මගීන්ට ගමන් බිමන් කිරීම පිණිසත් ප්‍රයෝජන ගත හැකි මාර්ගයක් හැටියට මෙය පාවිච්චි කරන්නට හැකියි. ගරු කථානායකතුමනි, මා මෙම කරුණු විශෙෂයෙන් සඳහන් කරන්නට කල්පනා කළේ වගුරු බිම් සංවර්ධන කටයුත්තේදී මේවා පිළිබඳව කිසි සේත් නොසලකා හරින්නට පිළිවෙළක් නොමැති හෙයිනුයි.

කොළඹ නගරය පමණක් නොව ඒ අවට නගර පවා දැන් සංවර්ධන වේගන එන හිතුවක්කාරී විලාසය ගැන අප විශෙෂයෙන් කනගාටුවට පත් විය යුතුයි. කුමන අන්දමක හෝ සැලැස්මක් නැතුව හිතුවක්කාර ආකාරයට මේ නගර සංවර්ධනය වේගන එන බව පෙනී යනවා. කෙටියෙන් කියතොත්, නගර නිර්මාන ආඥා පනතටත් පටහැණි වන අන්දමට මෙම නගර සංවර්ධනය වේගන එන බව තමුන්නාන්සේ වුවත් පිළිගන්නවා ඇති. එසේ නම් මෙම වගුරු බිම් සංවර්ධන කටයුත්තෙහිදී ප්‍රධාන තැනක් දිය යුත්තේ කුමන කරුණු සඳහාද? අඩු වශයෙන් මේ අක්කර 700 ගැනවත්—නගරය ඇතුළේ තිබෙන අක්කර 700 ගැනයි, මා කතා කරන්නේ—යම්කිසි සැලකිල්ලක් ප්‍රථමයෙන් දැක්විය යුතුයි. ඒ සඳහා යම්කිසි සැලැස්මක් ප්‍රථමයෙන් ඇති කළ යුතුයි. ඒ අක්කර ප්‍රමාණයෙන් මොන මොන ප්‍රදේශද කාර්මික සංවර්ධනය සඳහා වෙන් කරන්නේ, කියා සොයා බැලිය යුතුයි; මොන මොන ප්‍රදේශද වෙළඳ අංශය සඳහා වෙන් කරන්නේ, කියා සොයා බැලිය යුතුයි; මොන මොන ප්‍රදේශද නිවාස තැනීම සඳහා වෙන් කරන්නේ, කියා සොයා බැලිය යුතුයි. එපමණක් නොවෙයි, වෙනත් කරුණු සඳහා, ඒ කියන්නේ ක්‍රීඩා පිට්ටනි යනාදී එදිනෙදා ජන ජීවිතයට අවශ්‍ය අංග සඳහා වෙන් කරන්නේ මොන මොන ප්‍රදේශදැයි තව දුරටත් සොයා බැලිය යුතුයි. එවැනි සැලැස්මක් ඇතුවයි, මෙම සංවර්ධනයට බැසිය යුත්තේ.

මා එක්තරා රටකදී දුටු පරිදි මීට අදාළ කරුණක් සම්බන්ධයෙන් වචන කීපයක් මෙහිලා සඳහන් කරන්නට කැමතියි. එම රටේ ප්‍රයෝජනයට ගත නොහැකිව පැත්තකට දමා තිබුණු නිඃශ්‍රීක වගුරු බිම් ප්‍රදේශ බොහෝ දුරට සංවර්ධනය කර ගෙන යන්නේ රජයේ මුදල් යෙදවීමෙන් නොවෙයි. එම භූමි ප්‍රදේශවල සිතියම් අනුව රජයේ සැලැස්මක් පළමුකොට පිළියෙල කරනු ලබනවා. එම ඉඩම්වල ජලය බැස යැවීමට සහ එම ඉඩම් සංවර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රම පළමුකොටම එහි සඳ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හන් කරනවා. ඒවාට වුවමනා කරන පාරවල්ද එහි සඳහන් කරනවා. රජයේ ගොඩනැගිලිවලට වුවමනා කරන භූමි ප්‍රදේශත් සඳහන් කරනවා. අළුතින් තනනු ලබන නිවාසවලට වුවමනා කරන ප්‍රදේශත් සඳහන් කරනවා. කාර්මික සහ වෙළඳ අංශවලට වුවමනා කරන ප්‍රදේශත් එහි සඳහන් කරනවා. Zoning යනුවෙන් හඳුන්වනු ලබන ප්‍රදේශ සලකුණු කිරීමේ ප්‍රතිපත්තිය අනුව, රජයට වුවමනා කොටස් තිබෙනවා නම් ඒ අන්දමට ඒවා වෙන් කර ගන්නවා. රජයට අනවශ්‍ය අනික් කොටස් රජයේ මුදල් වැය කොට සංවර්ධනය කරන්නේ නැතුව පුද්ගලික අංශයට විකුණා දමනවා. මට පෙනෙන්නේ නැහැ, එහි කිසි වරදක් තිබෙනවාය කියා. ඒ සියලුම වගුරු බිම් අප විසින්ම සංවර්ධනය කොට අප විසින්ම දියුණු කොට පුද්ගලික අංශවලට දෙනවා නම් මා ඊට සම්පූර්ණයෙන්ම විරුද්ධයි. ගරු කථානායකතුමනි, මා දුටු සංවර්ධන ක්‍රමයක් තමයි, මේ ඉදිරිපත් කරන්නේ. යම් කිසි සැලැස්මක් අනුව රජයට අවශ්‍ය කොටස්—නිවාස සඳහා සහ වෙනත් අවශ්‍ය කටයුතු සඳහා වුවමනා කරන කොටස්—වෙන් කරගෙන ඉතිරි හරිය ඒවා ලබා ගන්න අයවලුන් විසින්ම රජයේ සැලැස්ම අනුව සංවර්ධනය කළ යුතුයි. එසේ කළ යුත්තේ නියම සැලැස්මක් අනුවයි. එසේ කටයුතු සිදු නොවුණොත් අද කොළඹ නගරයට සිදු වී ඇති දේ ඒ අන්දමටම සිදු වී ගෙන යන්නට ඉඩ තිබෙනවා.

දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) කොළඹ නගර සභාවේ දීර්ඝ කාලයක් මුළුල්ලේ සේවය කරන ගරු මන්ත්‍රීවරයකු වශයෙන් අද එක් ඇත්තක් එළි කළා. දේශපාලන වශයෙන් එක් කොටසකට දොස් පැවරීමේ අදහසින් එතුමා ඒ ප්‍රකාශය කළායයි මා අදහස් කරන්නේ නැහැ. කොළඹ නගර සභාව ගැන එතුමා සඳහන් කළා. නගරයේ දියුණුවට බාධා වන යම් යම් පියවරවල් ගෙන තිබෙන බව එතුමා පෙන්වා දුන්නා. මා හුඟක් දුරටම එතුමා සමග එකඟ වෙනවා. නගර සභාව නියම සැලැස්මක් අනුව ක්‍රියා නොකරන බවත්, දවසින් දවස සතියෙන් සතිය යම් යම් පියවරවල් වෙනස් කිරීම නිසා නියම සැලැස්මක් අනුව කොළඹ නගරය සංවර්ධනය කරන්නට පුළුවන්කමක් නැති බවත් එතුමා ප්‍රකාශ කළා. තත්ත්වය එහෙම නම්, මේ සංවර්ධනයත් කොළඹ නගර සභාවටම බාර දිය යුතුයයි ඒ ගරු මන්ත්‍රීතුමා කියනවාද? ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් ඇති තැනකට මෙවැනි කටයුත්තක් බාර දීම සුදුසුය යන්න එතුමාගේ අදහස බව මා දන්නවා. එහෙත්, කොළඹ නගර සභාව සැලැස්මක් නැතිව කටයුතු කරන අවස්ථාවකදී, නගරය තුළ තිබෙන අක්කර 700 ක බිම් ප්‍රදේශයක් සංවර්ධනය කිරීම නගර සභාවට බාර දෙන්නට පුළුවන්ද යන කරුණ අප කල්පනා කර බැලිය යුතුයි. එම නිසා, මා මේ අවස්ථාවේ දී විශේෂයෙන්ම ගරු ඇමතිතුමාට මතක් කරන්නේ, මේ අක්කර 700 පමණක් නොව මේ සංවර්ධනයට යටත් වන අක්කර 2500 ක පමණ මුළු ප්‍රදේශයම සංවර්ධනය කිරීම සඳහා—කාර්මික සංවර්ධනය හෝ වේවා, වෙළෙඳ සංවර්ධනය හෝ වේවා, නිවාස හා රජයේ කාර්යාල ආදිය සඳහා අවශ්‍ය බිම්වල සංවර්ධනය හෝ වේවා—නියම සැලැස්මක් ඇති කිරීම ඉතාම වැදගත් බවයි. එසේ නොවුණොත්, වතුර බැස යාමේ ක්‍රමවල තත්ත්වයත් වගුරු බිම්වල ගොඩනැගිලි තැනීම පිළිබඳ තත්ත්වයත් මොන විධියේ සංවර්ධනයකට පත් වේද යන්න කීම අමාරුයි. එම නිසා නීතිය මගින්ම ඒ ප්‍රදේශ පිළිබඳ පාලනයක් ඇති කිරීම අවශ්‍යයි. මේ අක්කර 700 පමණක් නොව, මේ මණ්ඩලයට යටත්වන තවත් අක්කර 2500 ක් පමණ වගුරු බිම් නගරය තුළ තිබෙනවා. නිවාස සැපයීම සඳහා තවත් විශාල ප්‍රදේශයක් මීට යටත් කරන්නට සිදු වනවා ඇති. ඒ තරම් දරුණු නිවාස හිඟයක් මේ කාලයේදී පවතිනවා. අද ගෙවල්කුලී ආඥා පණත් අවශ්‍ය වී තිබෙන්නේ ඒ නිවාස හිඟය නිසායි.

මේ අවස්ථාවේදී මතක් කළයුතු විශේෂ කරුණක් තිබෙනවා. මේ සම්බන්ධයෙන් දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවකට මා විරුද්ධ වුණු බව එතුමා ප්‍රකාශ කළා. එය සම්පූර්ණ ඇත්ත. එහෙත්, අප ගිය වාරයේදී ගෙවල් කුලී ආඥාපණතට සංශෝධන පණතක්



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]
ඉදිරිපත් කළ බව් ඒ ගරු මන්ත්‍රීතුමා පිළිගන්නවා ඇති. විරුද්ධ පක්ෂය මේ රට පාලනය කළ අවුරුදු 9 ක කාලය මුළුල්ලේ එතුමන්ලාට කරන්නට බැරි වුණු දෙයක් මේ රජය විසින් කොට, දුප්පත් ගෙවල් කුලී ගෙවන්නන්ට සහනය සලසා දුන් බව එතුමා පිළිගන්නවා ඇති. 1962 සිටම, නඩු දමා ගෙවල්වලින් දොට්ට දැමීමට සිටි උදවියට ආරක්ෂාවක්, අප ඉදිරිපත් කළ ඒ සංශෝධනයෙන් ලැබුණු බවත් එතුමා පිළිගන්නවා ඇති. [බාධා කිරීම්]

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

1962 දී සංශෝධනයක් ඇති වුණා. ඊට පසු 1964 දී තවත් සංශෝධනයක් ඉදිරිපත් කරන්නට තිබුණු අවස්ථාවේදී —[බාධා කිරීම්]

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

මා කථා කරන්නේ, 1966 සංශෝධනය ගැනයි. එය ඉදිරිපත් කරන අවස්ථාව වන විට කොළඹ නගරයේ සිදු වී තිබුණේ කුමක්ද? නොයෙක් උදවිය ඉඩම් අර ගෙන ඒවායේ තිබුණු ගෙවල් වෙන් වෙන් වශයෙන් වෙන්දේසියේ දමනු ලැබ වෙන්දේසියෙන් ඒවා ගත් අය ඒවායෙහි සිටි උදවියට නඩු දමා ඔවුන් දොට්ට දමන්නට සූදානම් වුණු අවස්ථාවේදී ඔවුන්ට සහනයක් ලැබුණේ අපේ සංශෝධන පණත නිසායි. 1962 සිට——

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

තාවකාලිකව නතර කර තිබුණා. [බාධා කිරීමක්]

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

අප ස්ථිරව නතර කළා. දමා තිබුණු නඩු අහෝසි වුණා. ඒ පණතට විරුද්ධව ඇපිල් නඩුවක් උසාවියට පවා ගෙන ගිය බව තමුන්නාන්සේ දන්නවා. ඒ පණත අහෝසි වේදෝයි එතුමාගේත් බියක් තිබුණා, නමුත් වාසනාවකට මෙන් එසේ වුණේ නැහැ. මා හිතන හැටියට පවුල් 10,000 කට වැඩි ගණනකට ඒ පණත නිසා සහනයක් සැලසුණා. දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමාත් ඒ බව දන්නවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

තාවකාලිකව සහනයක් ලැබී තිබුණු නමුත් පසුව එය අහෝසි වුණා. අප නැවත වරක් පණතක් ගෙනෙන්නට සූදානම් වන අවස්ථාවේදී ආණ්ඩුව වැටුණා.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ඒක හරි. දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමාත් (බර්නාඩ් සොයිසා මයා.) බද්දේගම ගරු මන්ත්‍රීතුමාත් (නීල් ද අල්විස් මයා.) පෙන්නුම් කර දෙන්ට වෑයම් කළා, මේ රජය ඉඩම් හිමියන්ගේ පැත්ත අර ගෙන ක්‍රියා කරනවාය කියා. අද රුපියල් 100ට අඩු ගෙවල්වල පදිංචිව සිටින අයට යම් සහනයක් සැලසී තිබෙනව නම් ඒ මා කලින් සඳහන් කළ අපේ සංශෝධනය නිසා බව සාධාරණ අදහස් ඇති කවුරුත් පිළිගන්නවා ඇති. ඒ අවස්ථාවෙදි මම කිව්ව තවත් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කරන්ට බලාපොරොත්තු වන බව. ප්‍රමාද වුණු බව ඇත්ත. නොයෙක් විධියේ කොටස්වලින් නොයෙක් විධියේ කරුණු දැක්වීම් ආදි කටයුතු නිසා ප්‍රමාද වුණා. පළාත් පාලන අමාත්‍යාංශය දැන් පනතක් සකස් කරගෙන යනව.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

මේක අනුව නම් අපට එපා.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ඒ මොකක්දැයි මා දන්නෙ නැහැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

තමුන්නාන්සේ මේ ගරු සභාවට ඉදිරිපත් කළ වාර්තාවක්. මේ කාරණා ගැන සොයා බලන්ට පත් කළ කොමිෂන් සභාවක වාර්තාවක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

අපි පත් කළ කොමිෂන් සභාවක වාර්තාවක් ? ඒක රජය පිට දමන එක වැරදියි. ඒ වාර්තාවෙ සඳහන් කරුණු හැම එකක්ම පිළිගන්නව කියා මම හිතන්නෙ රජය ප්‍රකාශ කර නැහැ. දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා අද ඉදිරිපත් කරන්ට ගිය පනතට අපි විරුද්ධ වුණේ රජය දැනට පනතක් සකස් කර ගෙන යන නිසයි. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමනි, මම එහෙම කිව්වෙ දකුණු කොළඹ මන්ත්‍රීතුමා ඒ කාරණය සඳහන් කළ නිසයි. මේ සංවර්ධනය කරන භූමි ප්‍රදේශයෙන් ඉතා විශාල කොටසක් කුඩා ගෙවල් තැනීම පිණිස වෙන් කරන්ට සිද්ධ වෙයි. අද නගරයේ පවතින බරපතල ප්‍රශ්නය එයයි. ඒ නිසා මේ මණ්ඩලය පත් කරන විට ඒ කාරණය හිතේ තබාගෙන මණ්ඩලයට සුදුස්සන්ම පත් කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. මේ ඇති කරන්ට යන සංවර්ධන ක්‍රමයේ නිවාස ගොඩනැඟීමේ කාර්‍යයට ප්‍රධාන තැනක් දිය යුතු බව හිතට ගෙන මේ වගුරු බිම් සංවර්ධනය කිරීමේ පාලක මණ්ඩලයට මාණ්ඩලිකයන් වශයෙන් ඊට සුදුසු පිරිසක් පත් කිරීම ඉතාම අවශ්‍යයි. ඒ වගේම දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා කිව්ව විධියට කොළඹ නගර සභාවේ නියෝජිතයින් මේ මණ්ඩලයේ සිටීම නොයෙක් කාරණා අනුව ඉතා ප්‍රයෝජනවත් වෙනව. මේ කටයුතු නියම විධියට කරන්ට නගර සභාවේ සහාය හුඟක් දුරට වුවමනා කරනව. මේ අක්කර දෙදහස් ගණනට පළාත් පාලන ආයතනවලට අයත් ප්‍රදේශ ගණනාවක් ඇතුළත් වන බව පෙනී යනව. ඒ ප්‍රදේශ මොනවාදැයි පනතේ සඳහන් වෙනව. ඒ ඒ ප්‍රදේශ සංවර්ධනය කිරීමේදී ඒ ඒ පළාත් පාලන ආයතනවල නියෝජිතයන්ගේ අදහස් උදහස් බොහොම ප්‍රයෝජනවත් වන බවට කිසිම සැකයක් නැහැ. මේ කාරණා සැලකිල්ලට ගෙන නිවාස ගොඩනැගීමට විශේෂ තැනක් ලබා දී මේ සංවර්ධන ව්‍යාපාරය ක්‍රමානුකූල සැලැස්මක් අනුව —හිතුවක්කාර අන්දමේ සංවර්ධනයක් ඇති නොවන ආකාරයට—නගර නිර්මාණ සැලැස්මක් අනුව සිදු කරන්ට විධිවිධාන යොදයි කියා මා විශ්වාස කරනව.

අ. භා. 3.50

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
(අකුරැස්ස)
*(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ—அக்குறஸ்ஸை)*
(Dr. S. A. Wickremasinghe—Akuressa)

ගරු කථානායකතුමනි, අපේ ගම්බද කතාවක් තිබෙනව, තොවිලය අවසාන වෙන කොටයි, හොඳ හොඳ නැටුම් බලන්ට පුළුවන් කියා. ඒ වගේ මේ විවාදය අවසාන වෙන්ට කිට්ටු වේගෙන එන විට දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමාත් (බර්නාඩ් සොයිසා මයා.) පළාත් පාලන ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාත් වැදගත් කරුණු වගයක් මේ විවාදයට එකතු කළා. මේ පිළිබඳව මාත් වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්ට අදහස් කරනව. මේ පනත අනුව සිදු කරන්ට යන්නෙ කොළඹ පහත් බිම් ප්‍රදේශ ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලයක් පත් කරන්ටයි. ප්‍රධාන වශයෙන් මෙයින් සිදු වෙන්නෙ පහත් බිම් ගොඩ කිරීමයි. පොළව මතු පිට වතුර බැස යෑම සඳහා පමණක් නොව වරායේ සිට ඇළවල් දිගේ බඩු ගෙන යෑම සඳහාත් ඇළවල් සකස් කිරීමේ අවශ්‍යතාව දැන් මන්ත්‍රීවරුන් දෙපොළක් විසින්ම ප්‍රකාශ කළා. දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමාගේ (බර්නාඩ් සොයිසා මයා.) අදහස මා පිළිගන්නවා. ඕලන්ද කාලයේ සිටම ඇති වූ ඇලවල් සම්බන්ධව පරීක්ෂා කර, මහා පාරවල ඉඩ මදිකම නිසා පමණක් නොව පාරවල්වලින් මෝටර් රථ මගින් බඩු අදිනවාට වඩා ඉතාමත්ම අඩු වියදමකින්—සිය ගුණයකින් පමණ අඩු වියදමකින්—ජල මාර්ගවලින් බඩු ගෙන යන්නට පුළුවන් නිසා ඇලවල් පාරවල් වශයෙන් ප්‍රයෝජනයට ගැනීම ඉතාමත් අවශ්‍යයි. ඒ සම්බන්ධව කල්පනා කරන විට කොළඹ සුළු කොටසකට පමණක් සීමා කර සැලැස්මක් හැදීමෙන් ඒ කටයුත්ත කරන්නට බැහැ. එපමණක් නොවෙයි, පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් අසන්නට ලැබුනා, අක්කර 700 ක මඩ වගුරු ප්‍රදේශයක් සම්බන්ධයෙන් සැලැස්මක් ඇති කළ යුතු බව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

සැලැස්මක් තියෙනවා. ඒ බව මා මගේ මූලික කථාවෙදි කිව්වා. ඒ සැලැස්ම අච්චු ගසා තිබෙනවා. 1966 විසි හය වැනි සැසි වාර්තාව හැටියට.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

ගරු කථානායකතුමනි, මේ උවදුර තිබෙන්නේ කොළඹ පමණක් නොවෙයි. අද මාතර නගරය මඩ වගුරක් වෙලා තියෙනවා. ගාලු නගරය අද මහා විශාල මඩ වගුරක් වෙලා තියෙනවා. මීගමුව වැනි නගරවලත් අද මේ ප්‍රශ්නය පැන නැගී තිබෙනවා. මේ ප්‍රශ්නය කොළඹටම සීමා කරන්නට බැහැ. ගමනාගමනය සම්බන්ධයෙන් ඇලවල් හදනවා නම් හලාවත සිට අඩු ගණනේ පානදුර දක්වා තිබුණු ඇලවල්වත් ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩ පිළිවෙළක් ඇති කරන්නට ඕනෑ. එසේ නැතිව හැතැප්ම තුනක, හතරක ඇලක් කපා බඩු ඇදීමේ කටයුතු සම්බන්ධයෙන් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කිරීමෙන් වැඩක් වෙන්නෙ නැහැ. හලාවත ප්‍රදේශයේ සිට මාතර ප්‍රදේශය දක්වා වගා කරන්නට පුළුවන් ඉතාමත්ම සරු සාර ඉඩම් අක්කර 5,00,000ක් පමණ තිබෙනවා, මඩ වගුරු නිසා වගා කරන්නට බැරිව. එපමණක් නොවෙයි, බරවා රෝගය සහ වෙනත් නොයෙක් රෝග ඇති වීමට ඒවා හේතු වී තිබෙනවා. ඒ නිසා මුහුදුකරය දිගට තිබෙන මේ පහත් බිම් සම්බන්ධයෙන් සැලැස්මක් ඇති කර තිබෙනවාය කියන කථාව මා පිළිගන්නෙ නැහැ. සැලැස්මක් ඇති කර තිබෙනවා නම් කොළඹට පමණක් සීමා කර කටයුතු කරන්නට ගියාම අනික් දෙපැත්තේ සැලැස්ම ක්‍රියාත්මක කරන්නට බැහැ. පානදුර සිට හලාවත දක්වා තිබෙන සැලැස්ම කොළඹට පමණක් සීමා කර කොළඹ පමණක් ගොඩ කරන්නට යාමෙන් අනික් ප්‍රදේශ මේ සැලස්මට ඇතුළත් කර ගන්නට බැරි වෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

This is one catchment area.

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

ඉස්සර වෙලා ඇලවල් ශුද්ධ කරලයි, ගොඩ කරන්නෙ. ගොඩ කරලා ඇලවල් කපන්නෙ නැහැ. ගොඩ කරලා, ගෙවල් හදලා, ඊට පස්සෙ ඒ ගෙවල් උඩින් ඇලවල් කපන්නේ නැහැ. එහෙම කරන්නෙ එක තාලෙක මිනිස්සු.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)
(Dr. S. A. Wickremesinghe)

මෙපමණ කල් කොළඹට වෙලා තියෙන දේ පාර්ලිමේන්තු ලේකම්තුමත් මතක් කළා නේද? මෙපමණ කල් ඉංජිනේරුවනුත් සිටිද්දී, ධනවතුන්ට වුවමනා විධියට, පස් කපා ගන්නට පුළුවන් අයට වුවමනා විධියට කොළඹ නගරයත්, වෙනත් නගරවලුත් ගොඩ කර වැඩ පිළිවෙළවල් යොදා තිබෙනවා. ඒ ක්‍රමය වෙනස් කර සැලැස්මක් ඇතිව කටයුතු කිරීමට නම් කොළඹට සීමා නොකර අඩු ගණනේ පානදුරේ සිට මීගමුව දක්වාවත් මේ සැලැස්ම සකස් වන්නට ඕනෑ. ඒ නිසා මා මතක් කරන්නේ මෙයයි: දෙහිවල, ගල්කිස්ස, මොරටුව, පානදුරය, කළුතර, ගාල්ල, මාතර, මීගමුව ආදී අනිකුත් නගරවලටත් මෙය භයානක ප්‍රශ්නයක් වී තිබෙන නිසා, මෙය කොළඹට පමණක් සීමා කරන්න එපා. හැම අවුරුද්දකම පාහේ තද වැස්සක් ඇති වූ හැටියේ ම මේ ප්‍රදේශ සියල්ලක්ම ගංවතුරට අසු වී විශාල අලාභහානි හා සනීපාරක්ෂාවට බාධා ඇති වන අන්දමට කටයුතු සැලසී තිබෙනවා. ඒ නිසා මේ පනත ක්‍රියාත්මක කරන්නට කලින් දැනට සකස් කර ඇති සැලැස්ම මුහුදුකරය දිගටම බලපානසේ පුළුල් කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

මේ සැලැස්ම සීමා වී තිබෙන්නේ කොයි ප්‍රදේශවලටද කියා කරුණා කර කියන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
කොළඹ දිස්ත්‍රික්කයට.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ඒ මදි. කළුතර, ගාල්ල, මීගමුව ආදී දිස්ත්‍රික්කවලත් වතුර බස්සන්නට බැරි පහත් බිම් හා මඩවගුරු බිම් මේ සැලැස්මට ඇතුළත් කර තවත් වාර්තාවක් ලබා ගන්න.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

You have brought that to the notice of the hon. Parliamentary Secretary. Let us discuss what is before the House.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

මා පෙන්වා දෙන්නේ ඉදිරිපත් කර තිබෙන මේ සැලැස්මේ ඇති දුර්වලකම්. මෙය කොළඹට පමණක් සීමා කිරීමෙන් මෙයට සම්බන්ධ දේවල් සාර්ථකව ක්‍රියාත්මක කරන්නට බැරි බවයි මා කියන්නේ ඒ නිසා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලන්නේ මෙය සංශෝධනය කරන්නය කියලයි. ඒ කියන්නේ "කොළඹ" කියන වචනය පමණක් සංශෝධනය කිරීම නොවෙයි. අඩු වශයෙන් මීගමු දිස්ත්‍රික්කයේ සිට කළුතර දිස්ත්‍රික්කය දක්වාවත් මෙය එකම සැලැස්මක් වශයෙන් කටයුතු සම්පාදනය වන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, දැනටමත් අපට ඇති වී තිබෙන විපත් පෙනෙනවා නේද? "හාවඩ් ස්කීම්" කියා එකක් හැදුවා. එක කොටසකට ජලගැල්ම නතර කරන විට තවත් කොටසකට විශාල වශයෙන් හානි පැමිණෙන්නට වුණා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please. The Sitting is suspended till 4.30 P.M. On resumption the Hon. Deputy Chairman of Committees will take the Chair.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 4.30 ට කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමාගේ [ජී. ජේ. පාරිස් පෙරේරා මයා.] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

இதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று, குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் [திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா] தலைமை தாங்கினார்கள்.

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. G. J. PARIS PERERA] *in the Chair.*

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැඩි වේලාවක් කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. වැදගත් එක් කාරණයක් පමණයි, ඉදිරිපත් කරන්නට අදහස් කරන්නේ. කොළඹට පමණක් සීමා කර තිබෙන මේ වැඩ පිළිවෙළ ඊට වඩා විශාල ප්‍රදේශවලට බලපාන අන්දමට ක්‍රියාත්මක කරන ලෙසයි මා ඉල්ලන්නේ. අඩු ගණනේ මෙය මීගමුවේ සිට කළුතර දක්වා වූ ප්‍රදේශයට—මීගමු දිස්ත්‍රික්කයත් කළුතර දිස්ත්‍රික්කයත් ඇතුළත් වන පරිදි—ප්‍රයෝජනවත් වන විධියට සකස් කළ යුතුය යනු මගේ පිළිගැනීමයි. මේ ප්‍රදේශය තුළ විශාල ගංගාවල් ගණනාවක් මෙන්ම ඇළ, දොළ, කලපු ආදිය තිබෙනවා. ඒ හැම එකකටම මෙය සම්බන්ධ විය යුතු නිසා එක් ප්‍රදේශයකට පමණක් සීමා වන ආකාරයට මේ සැලැස්ම පිළියෙල කර සම්පූර්ණ කරන්නට ගියොත් මතුවට එයින් සංවර්ධන කටයුතුවලට විශාල හානියක් සිදු වන්නට ඉඩ තිබෙනවා. ඒ නිසා සීමාසහිත අන්දමට මෙය ක්‍රියාත්මක කරන්නට මත්තෙන් මීට සම්බන්ධකම් තිබෙන අනිකුත් ගංගා, ඇළ, දොළ, කලපු ආදියත් ඇතුළත් කර ඒ පහත් ඉඩම්වල තිබෙන වතුර බැස්සීමේ වැඩ කටයුතු විධිමත් කරන්නට ඕනෑ. ඒ හැම ප්‍රදේශයකම තිබෙන වගුරු බිම් වගා කරන්නට පුළුවන් බිම් බවට පරිවර්තනය කරන්නට ඕනෑ. ජාඇල ප්‍රදේශයේ මුතුරාජවෙල වැනි ස්ථාන වැඩි දියුණු කළොත්, වී වගාවෙන් විශාල ප්‍රයෝජනයක් ගන්නට පුළුවනි. ඒ සම්බන්ධවත් කල්පනා කර බලා ක්‍රියා කරන්නැයි මා යෝජනා කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

වගුරු බිම් පිළිබඳ භයානක ප්‍රශ්නය ගාල්ල, මාතර ආදී පහත් ප්‍රදේශවලත් තිබෙනවා. විශේෂයෙන්ම මුදුකර ප්‍රදේශ වලට මේ තත්ත්වය බෙහෙවින් බල පානවා. පල් වන වතුර නිසා සනීපාරක්ෂාව වත් විශාලම තර්ජනයක් එල්ල වන බව ගරු ඇමතිතුමා කල්පනා කරන්නට වටි නවා. ඒ නිසා මෙය කොළඹ නගරයට පම ණක් සීමා කරන්නට වටින්නේ නැහැ. මෙය මුළු රටටම බල පාන්නක් හැටියට කල්පනා කරන්නට ඕනෑ. මුලින් එක් ප්‍රදේශයක් සම්බන්ධයෙන් ක්‍රියා කර ඊළ ගට අනෙකුත් ප්‍රදේශ ගැනත් සැලකිල්ල යොමු කරන්නට පුළුවනැයි කියන්නට සුදුසු නැහැ. මෙය එහෙම කොටස් දෙකකට බෙදා වෙන් කරන්නට පුළුවන් ප්‍රශ්න යක් නොවෙයි. ඒ නිසා එක සැලැස්මක් හැටියට වැඩ පිළිවෙළක් යොදා ගත යුතුයි කොටසින් කොටස ක්‍රියාත්මක කරන්නට පුළුවන් විධියටත් කටයුතු කරන්නට පුළු වන් බව මා පිළිගන්නවා. එහෙත් එක සැලැස්මක් හැටියට පිළියෙල කර මුදුකරය දිගටම තිබෙන පහත් බිම්වල වතුර බැස් සීමේ වැඩ පිළිවෙළක් ඇති කර නියම ප්‍රයෝජනයක් ගැනීමට කටයුතු කරන්නැයි ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 4.34

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

There are just one or two matters I wish to refer to. I was a little surprised when I saw this Bill. One cannot seriously object to the idea of developing and reclaiming the low-lying areas. But are we satisfied? Is this going to be another long-term project? We have had various boards of one type or another. I remember we had a board for the development of the fire gaps. How many years did we take to get that work done? I have a similar suspicion about this board.

Let us look at the composition of the board. You find as members of the board the Director of Irrigation, the Director of Town and Country Planing, the Commissioner of National Housing and four other members are going to be. The Director of Irrigation is a busy man already with any amount of work on his hand. What amount of time is he going to devote to this business of reclaiming land?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

He will not be a working member.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

He will not be a working member? But he is likely to be the chairman of this board.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

No.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

No? Who is going to be the chairman? There is nothing to indicate, but I presume that the person itemized as No. 1 of the lot, the Director of Irrigation, is the most important person and is going to be the chairman. Who is going to be the chairman?

**ටී. බී. ඉලංගරත්න මයා.**
*(திரு. ரீ. பி. இலங்கரத்ன)*
(Mr. T. B. Ilangaratne)

Unsuccessful candidate!

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

If you are thinking in terms of a board which is going to sit and do serious work——

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

Definitely so. It will be a board of persons who will be delivering the goods.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

You are putting more persons who are very busy. What about the Director of Irrigation's own work that he has at the moment? Look at the work he has not completed.

Obviously, the local authorities who had these marsh lands and so on under their purview have not done this job, and therefore we are now going to hand it over to a board. If you are going to hand it over to a board, let us have a board that will function. You should appoint some first-class engineers for the purpose who are not already burdened with work and who will devote a considerable amount of their time to this work.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I can give you an assurance that work will be done. I give you the assurance that the chairman will be a very competent engineer whose capabilities you will not question, but I cannot divulge the name until I get the Prime Minister's approval of it.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

All I am saying is that the three people whom you have named in the Bill are all busy men who will not find the time to devote to this work. I do not think the Commissioner of National Housing has much work now. He has not much work to do. Perhaps he is the only person who will be able to devote some time. The other two people will not have much time.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

Look at Clause 7 (1). The chairman shall be somebody other than an *ex officio* member.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I see it states:

"The Minister shall appoint as the Chairman of the Board one of the members of the Board other than an *ex officio* member."

My fear is that you will appoint somebody—

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

You can watch and see.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I shall watch and see. I have watched your River Valleys Development Board. All are working directors including Mr. R. P. Jayawardene. The only work that he is doing is drinking. He is drunk from morning till evening. That is what he is doing and you are paying him Rs. 1,500 a month. Why are you shaking your head?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

We are not paying him Rs. 1,500.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

That is the kind of board that you are going to establish. I have no faith in this.

But there arises one other important question. This is a matter to which I should like to draw the attention of the Minister of State too because he likes to dabble in problems like this.

What are we doing now? We are taking away from the local authorities, little by little and under some guise or another, some of the work they are doing. For instance, the Tourist Board took away a certain portion of their work. You started by saying that we must spread out democracy and give local authorities

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

more power and get them to do more work. Now you find that local authorities are unsuitable to do certain work, and little by little you are eating into the powers that they have. What is contemplated under this Bill is going to affect a large number of local authorities. As some of the Members urged, if you are going to set up a competent board that will carry out reclamation of all the swamp land throughout the island and have a really first class job done, then we are agreed. And then the best thing to do would be to try and see, when the board deals with a particular area, whether there should not be some co-ordination with the local authority of the area in carrying out that work. Otherwise, you will be eating into the democratic rights that these local authorities have. I am trying to see whether there is no means by which we can draw them also in when we develop the land and make up for their inability for various reasons to conduct the bigger tasks. That is one of the reasons why I should like a reconsideration of Clause 1 when we come to the Committee stage.

I do not wish to delay this, except to say that one has to come to some definite decision one way or the other. Why should we restrict this to Colombo? If the intention is to develop all the low-lying areas by a board, then let us spread it out to cover the entire island unless the Hon. Minister wants to try it first in the Colombo District and if it is successful spread it out to cover the whole island.

I am sorry the hon. Member for Panadura (Mr. Leslie Goonewardene) is not here, because I remember he discussed this question with me. He mentioned the Bolgoda area in Panadura.—[*Interruption*].

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I want to start work on that. I have provided the money in the Estimates: Head 60, Vote 7, Sub-head 26 —Construction of Groynes at Bolgoda Ganga Sea Outfall at Panadura —Rs. 3 million.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

You have provided the money, but nothing is being done.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

They have already started dredging it.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

How many things have you started?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

What about the things he has to finish?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

There is one thing I must say about him: he has a knack of hitting upon an idea, and then—[*Interruption*]. He wanted to export electricity to Madras. He has plenty of ideas, but they are all non-starters!

We have no serious objection to this Bill. One other point that has to be seriously considered is this. There is nothing very clear in the Bill as to what is going to happen to the land that is reclaimed? There is nothing very clear here as to the utilization of the land. Once you reclaim land, the value of it goes up. What is going to happen to it? Does it become the property of the local authority concerned? You will have a tussle as to who should get the land.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

Crown land.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

You know, there was a claim by local authorities that all Crown land within their areas should be handed over to them.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

Under the law it must first be vested.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

You vested our land also the other day.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

Where ?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

The land at the Beira Lake set apart for our purposes. You signed it off without any consideration.—[*Interruption*]. That is neither here nor there. But let us in this Bill at least, make the position clear as to what happens to the land that is reclaimed. If this Bill is put before a Committee of the Whole House now I do not know whether we shall have enough time to consider all these aspects. But one point that I should like to urge is that all this land should be subject to the control of the planning officer so that he can work out a plan before anything else happens to the land.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I agree.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

So, instead of rushing this Bill through, you had better give some thought to the ideas that we have put forward. As I said before, we have no particular objection to the whole conception of reclaiming these lands, and I see the point in centralizing the work because the local authorities have not perhaps got the resources for undertaking it themselves. Let us provide the means so far as they are necessary in the local areas, but at the same time let us also give some thought to the question of developing these lands in a proper way, as several hon. Members have urged.

We have certain suggestions to make, and we shall do so at the Committee stage. I hope the Hon. Minister will give heed to them.

අ. භා. 4.46

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ගරු කථානායකතුමනි, දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) සිංහලයෙන් සහ ඉංගිරිසියෙන් කරුණු පැහැදිලි කරමින් කොළඹ නගර සභාවට අවුරුදු ගණනාවක් තිස්සේ ක්‍රියා කරලත් වගුරු ඉඩම් පිළිබඳ ප්‍රශ්නය සතුටුදායක අන්දමට විසඳා ගන්නට බැරි වුණු බව ප්‍රකාශ කළා. නොයෙකුත් සැලැස්මවල් ලබා ගත්තත් කිසිම වැඩක් නොසිදු වුණු බව සඳහන් කළා. කොළඹ නගර සභාව වගුරු ඉඩම් පිළිබඳව කිසිවක් නොකළ නිසයි, අප මෙවැනි මණ්ඩලයක් පත් කොට එයට ඒ පිළිබඳ කටයුතු භාර දෙන්නට හදන්නේ. දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන්ම අප කරන වැඩේ නිවැරදිභාවය පෙනී යනවා. අනෙක් අතට මෙම මඩ වගුරු දියුණුකිරීම පළාත් පාලන මණ්ඩලවලින් ඉවත් කොට වෙනම මණ්ඩලයක් මගින් කළ යුතු බව එතුමාම ප්‍රකාශ කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

මෙම පනත පිළිබඳ විවාදය ආරම්භයේ දීම, මඩ වගුරු පිළිබඳ ප්‍රශ්නය විසඳිය යුතු ආකාරය සම්බන්ධයෙන් කරුණු සොයා බැලීමට පත් කරන ලද කාරක සභාවක් ගැන මා සඳහන් කළා. එම කාරක සභාවෙන් ලැබුණු වාර්තා හා සැලැස්මයන් සලකා බැලීමෙන් පසුවයි මෙම පනත සකස් කොට මෙම ගරු සභාවට ඉදිරිපත් කෙළේ. මෙම මඩ වගුරු ගොවිතැන් කටයුතු සඳහා නොයොදවා ගොඩනැගිලි සෑදීම සඳහා යොදවා ගැනීම අපේ ප්‍රධාන අදහසයි. යම් යම් අත්හදා බැලීම් කරන බවත් ඇත්තයි. කොළඹ දිස්ත්‍රික්කයට මෙය සීමා කෙළේ මේවායේ ගොඩනැගිලි සෑදීමේ ප්‍රධාන අරමුණ ඇති වයි.

නොයෙකුත් දේවල් කරන ලෙසට දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමාත් (බර්නාඩ් සොයිසා මයා.) යටියන්තොට ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය එන්. එම්. පෙරේරා) ඉල්ලා සිටියා. කොළඹ ප්‍රදේශයේ ඇළවල් ශුද්ධ කිරීම සම්බන්ධයෙන් විශෙෂයෙන් ඒ මහතුන් කරුණු ඉදිරිපත් කළා. කොළඹ ප්‍රදේශයේ තිබෙන කුණු ඇළවල් ශුද්ධ කිරීම සඳහා 1967-68 මුදල් වර්ෂයේදී රුපියල් දශ ලක්ෂයක් වෙන් කර තිබෙනවා. ඉංගිරිසි ඇස්තමේන්තු පිටපතේ "Reconditioning of drainage lines in Colombo area" යනුවෙන් එය සඳහන් වෙනවා. එය වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ඇති 16 වන පොදු විෂයයයි. ඊළඟට 24 වැනි පොදු විෂයය, "Reclamation of Swamps in and around Colombo" යනුවෙන් සඳහන් වෙනවා. කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල වගුරු බිම් සංවර්ධන කිරීම සඳහා 24 වන පොදු ශීර්ෂයෙන්, රුපියල් ලක්ෂ 15 ක් වෙන්කර තිබෙනවා. 26 වෙනි පොදු ශීර්ෂයෙන් Construction of groynes at Bolgoda Ganga Sea Outfall at Panadura—පානදුර මුහුදු බැම්ම අසළ බොල්ගොඩ ගඟේ මුදුහු වැටි තැනීම—සඳහා රුපියල් ලක්ෂ 30ක් වෙන් කර තිබෙනවා. මේ විධියටම 27 වන පොදු ශීර්ෂයෙන් මාලිගාවත්ත ප්‍රදේශයේ වගුරු බිම් සංවර්ධනය සඳහා රුපියල් ලක්ෂ 90 ක් වෙන් කර තිබෙනවා. 28 වන පොදු ශීර්ෂයෙන් මාදිවෙල හැරවීමේ යෝජනා ක්‍රමය සඳහා රුපියල් ලක්ෂ 80ක් වෙන් කර තිබෙනවා.

ජල ගැලීම් නවත්වා වගුරු ඉඩම්වල ගොවිතැන් කටයුතු සඳහා පහසුකම් සලස්වන ලෙස අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) ඉල්ලීමක් කළා. දැනටමත් ඒ විධියේ වැඩ කරගෙන යනවා. බෙන්තර ගඟ දැල කීප පොළක මාදු ගඟ දැල කීප පොළක සහ තංගල්ලේ වෙල් යායේ ජලය බැස්වීමේ හා කරදිය ඉවත් කිරීමේ යෝජනා ක්‍රම අනුව වැඩ කරගෙන යනවා. 50 වන පොදු ශීර්ෂයේ "Development of Gin Ganga Basin-Project Report" නමින් ගිංගඟ නිම්නය සංවර්ධනය කිරීම—යෝජනා ක්‍රම වාර්තාව ලබා ගැනීම සඳහා රුපියල් ලක්ෂ 13 ක් වෙන් කර තිබෙනවා. අනෙක, ඇස්තමේන්තු පොතේ ඉංග්‍රීසි පිටපතේ 230 වැනි පිටුවේ සඳහන් අංක 51. Development of Nilwala Ganga Basin-Project Report. නිල්වලා ගඟ මිටියාවත සංවර්ධනය කිරීම. ඒ සඳහා රුපියල් ලක්ෂ 19 ක් වෙන් කර තිබෙනවා. මහවැලි ගඟ මිටියාවත වාගේම නිල්වලා ගඟ මිටියාවතත් කලු ගඟ මිටියාවතත් දැන් පරීක්ෂා කරගෙන යනවා. ඒ කටයුත්ත ඊ. සී. අයි. නමැති ඇමෙරිකන් කොම්පැණියකට භාර දී තිබෙනවා. දැන් ඒ වැඩ අවසාන වේගෙන එන බව එම කොම්පැණියෙන් මට දැනුම්දී තිබෙනවා. ඒ පිළිබඳ සැලැස්ම අපට ලැබුණාම හැමෝගේම දැනගැනීම සඳහා ප්‍රසිද්ධ කරන්නට බලාපොරොත්තු වෙනවා.

කොළඹ ප්‍රදේශයේ සංවර්ධන කටයුතු කළාට පස්සෙ ගොඩනැගිලි, තට්ටු නිවාස, කර්මාන්තශාලා, වෙළඳ සමාගම් ආදිය සඳහා බිම් කොටස් වෙන් කරාවි.

ඒ වාගේම, හයියෙන් වැස්සාම වතුර එකතු වීම සඳහා පොකුණු හදන්නටත් සිදු වෙනවා. අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) කී විධියට කටයුතු කරන්නට දන්න කිසිම ඉංජිනේරු මහත්මයෙක් නැහැ. ඒ විධියට කොහේවත් කෙරෙන්නේ නැහැ. අප අදහස් කරන්නේ කලින්ම ඇළවල් කපා ඒ පස් ප්‍රයෝජනයට ගනිමින් පාරවල් තනන්නයි. දැන් මාළිගාවත්තේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරගෙන යන්නෙත් ඒ විධියටයි. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් "ඩ්‍රෙජර්ස්" තුනකින් මාළිගාවත්තේ මඩ වගුර සුද්ධ කර, ඒ පස් උපයෝගි කරගෙන මෝටර් රථ යන්නට පුළුවන් පාරක් හදාගෙන යනවා. ඊට පස්සෙ අතුරු ඇළවල් කපා වතුර බස්සනවා. ඒ සැලැස්ම අනුව පහත් බිම්වල පොකුණු කනවා ඒවායේ පස් මා කලින් කී විධියට ප්‍රයෝජනයට ගන්නවා.

අක්කර 3 ක ඉඩමක් තිබෙනවාය යි හිතමු. එයින් එක අක්කරයක් අඩි 2 ක් හෑරුවොත් එයින් ගන්න පස්වලින් ඉතිරි අක්කර දෙක අඩියකින් උස්සන්න පුළුවනි. ඒ ප්‍රතිපත්තිය අනුව, කනිනු ලබන පොකුණුවලින් ගන්න පස්වලින් අවට බිම් උස්සන්න පුළුවනි. අනෙක, හයියෙන් වැස්සොත් ඒ වතුර අර පොකුණුවල රඳවන්න පුළුවනි. ඒ නිසා සමහර තැන් වල පොම්ප සවි කරන්නටත් සිදු වෙනවා. මාළිගාවත්තේ ඇළවල් කපා විශාල පොම්ප සවි කරනවා. ස්වභාව ධර්මය අනුව මඩ වගුරු ඇති වන්නේ පහත් බිම්වලයි; උස් බිම්වල නොවෙයි.

දකුණු කොළඹ ගරු සම මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) පාරවල් නම් තැබීම ගැනත් කිව්වා. එතුමාගේ යෝජනාව අනුව කොළඹ නගර සභා ප්‍රදේශය තුළ දැනටමත් තිබෙන පාරවල නම් තැබීම බොහොම කරදරයි. අළුතින් ප්‍රදේශ දියුණු කරන විට, 1 වැනි මාවත, 2 වැනි මාවත, 3 වැනි මාවත යනුවෙන් නම් තබන ලෙස මම මේ මණ්ඩලයට නියම කරන්නම්. අනෙක්වා හරස් පාරවල් හැටියට, 1 වැනි හරස් පාර, 2 වැනි හරස් පාර යනුවෙන් නම් කරන්නට පුළුවනි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
පටු මාවත්.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

පටු නැහැ, පළල්. අරවා කෙළින් මාවත්, මේවා හරස් මාවත් ඒ ක්‍රමය ඇමෙරිකන් ක්‍රමයක් වන්නට ඇති. අප හදන්නේ පළල් මාවත් මිස පටු මාවත් නොවන නිසා මා කලින් කී විධියට "මාවත් හා හරස් පාරවල්" යනුවෙන් නම් කිරීම වඩා හොඳ යයි මා කල්පනා කරනවා. එය ඇමෙරිකන් ක්‍රමයක් වුණත් දකුණු කොළඹ ගරු සම මන්ත්‍රීතුමා ඊට විරුද්ධ නැතැයි මා හිතනවා.

කොළඹ ප්‍රදේශයේ ඇළවල් සුද්ධ කරන්නට රුපියල් ලක්ෂ 10 ක් වෙන් කර තිබෙනවා. ඒ සැලැස්මේ සඳහන් වන්නේ, දැනට බේරේ වැවේ බැමි බැඳ තිබෙන්නා වාගේ බැමි බැඳීමටයි. එහෙත් අපට අවශ්‍ය තරම් මුදල් නැති නිසා හැම තැනම ඒ විධියට බැමි බඳින්නේ නැහැ.

කොළඹ නගර සභාව විසින් පිළියෙළ කර තිබෙන සැලැස්මවල් අපතේ යැවෙන්නේ නැහැ. විශේෂඥයන් සමග සාකච්ඡා කර, ඒ හැම සැලැස්මක් ගැනම මේ මඩ වගුරු ගොඩ කරන්නට කලින් පරීක්ෂා කර බලන හැටියට මම මේ මණ්ඩලයට නියම කරන්නම්. ඒ වාගේම කොළඹ නගර සභාවේ බලතල අඩු කරන්නටත් අප තුළ අදහසක් නැති බව කියන්න කැමතියි. ගල්ඔය මිටියාවතේ අප විසින් සංවර්ධනය කරන ලද කුඹුරු අක්කර 35,000 ක් පමණ ගම්කාර්ය සභාවලට පවරා දී තිබෙනවා. ඒ විධියට මෙම ඉඩම් ද සංවර්ධනය කොට පළාත් පාලන මණ්ඩලවලට පවරනවා. මේවා හැමදාම මේ මණ්ඩලය යටතේම පාලනය කිරීමේ අදහසක් රජයට නැහැ. එසේ බාර දුන්නායින් පසු ඒවායේ පාලනයත් නඩත්තුවත් සාමාන්‍ය විධියට ඒ ඒ පළාත් පාලන මණ්ඩල මාර්ගයෙන් කෙරෙනවා ඇති.

විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ කරුණු සියල්ලටම මා පිළිතුරු දුන්නායයි මා අදහස් කරනවා. තවදුරටත් ඒ කරුණු පිළිබඳව පරීක්ෂා කර බලා කටයුතු කරනවා. ඉදිරිපත් කරන ලද සංශෝධනත් මා බාර ගන්නවා.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**කෙටුම්පත් පණත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, மசோதா இரண்டாம் முறையாக மதிப்பிடப்பெற்றது.

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

**මතු පළ වන යෝජනාව සභාසම්මත විය.**

"කෙටුම්පත් පණත පූර්ණ මන්ත්‍රී මණ්ඩල කාරක සභාවට පැවරිය යුතුය."—[ගරු සී. පී. ද සිල්වා.]

பின்வரும் பிரேரணை ஏற்றுக்கொள்ளப்பட்டது.

" மசோதா முழுச்சபைக் குழுவுக்குச் சாட்டப்படுமாக "
[கௌரவ சி. பீ. டி சில்வா]

*Resolved :*
*"That the Bill be referred to a Committee of the Whole House."—[The Hon. C. P. de Silva.]*

**කාරක සභාවේදී සලකා බලන ලදී.**

**[කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ විය.]**

குழுவில் ஆராயப்பெற்றது.

[குழு உப அக்கிராசனர் தலைமை தாங்கினார்]

*Considered in Committee.*

[MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *in the Chair.*]

CLAUSE 1.—(*Short title and date of operation*)

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
I move,

"In page 1, lines 6 to 8, leave out 'Colombo (Low-lying Areas) Reclamation and Development Board Act, No. . . . of 1967,' and insert 'Colombo District (Low-lying Areas) Reclamation and Development Board Act, No. . . . . of 1968.'"

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
ගරු සභාපතිතුමනි, ඒ සම්බන්ධව මා කථා කරන්නට ඕනෑ. මේ පණත කලින් තිබුණේ කොළඹ දිස්ත්‍රික්කයට පමණක් නොව ඕනෑම දිස්ත්‍රික්කයකට බලපාන ආකාරයටයි. [බාධා කිරීම්] කොළඹ දිස්ත්‍රික්කයට යාබදව තිබෙන කළුතර දිස්ත්‍රික්කයේ බොල්ගොඩ නම් ස්ථානයෙහි මේ රජය විසින් විශාල වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඔය කාරණය අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමාත් කිව්වා.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
බොල්ගොඩ ගැන කරුණු දන්නේ මායි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
නෑ, අපිත් දන්නවා.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
මොනවාද දන්නේ ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
තමුන්නාන්සේ නොදන්න දේවල්.

අ. භා. 5

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
ඒවා වැරදි දේවල් වෙන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, 1956 දී මා පානදුර කොට්ඨාශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වශයෙන් පත් වුණු වහාම, බොල්ගොඩ ප්‍රදේශයේ අධික ජලය මුහුදට බැස්සීමේ වැඩ පිළිවෙළක් ඇති කරන්නට පෙර එහි තත්ත්වය පිළිබඳ පරීක්ෂණයක් කළ යුතුයයි ඉංජිනේරු මහත්වරුන් කළ නියමය අනුව එහි දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවේදී මා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවේ ප්‍රතිඵලයක් වශයෙන් එහි "ලෙවල් සර්වේ" එකක් කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒකට මට්ටම් මැනීමකැයි සිංහලෙන් කිව්වොත් හරිද කියන්නට මා දන්නේ නැහැ. කෙසේ වෙතත් කවුරුත් දන්නා හැටියට "ලෙවල් සර්වේ" යනුවෙන් මම ඊට නම් තබනවා. 1958 අවසාන වන විට ඒ කියන්නේ අවුරුදු 2කට පමණ පසු ඒ පිළිබඳ වැඩ අවසන් වෙලා තිබුණා. අවුරුදු ගණනාවක් මුළුල්ලේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ලෙවල් සර්වේ ක්‍රමයට අනුව එක්තරා වැඩ ප්‍රමාණයක් කිරීමෙන් පසුව මෙම වර්ෂයේ පටන් යම් කිසි වැඩ කොටසකට බැස තිබෙන බව පෙනෙනවා. පානදුරා මුහුදු බැම්ම අසල ගඟේ මුහුදු වැටි නැනීම සඳහා ලක්ෂ 30ක් විතර දනට වියදම් කිරීමට අදහස් කර තිබෙනවා. ඒ මගින් ප්‍රතිඵල දෙකක් ඇති වේයැයි සිතනවා. ඉන් එකක් නම් මේ ගඟේ කට නිතරම ඇර තිබෙන නිසා ධීවර වරායක් ඇති කරන්නට පහසු වේවිය කියන කාරණයයි. අනික් කාරණය නම් මෙහි ඇති ජලය වඩාත් ඉක්මණින් බැස් සවා ගන්නට අවස්ථාව සැලසේවිය යන්නයි.

තල්පිටි ගඟේ බැම්මක් දමන්නට තවම තීන්දුවක් නැති වුවත් එතැනින් මුහුදට වතුර පොම්ප කරන්නට වැඩ පිළිවෙළක් තිබෙනවා. එහි වැඩ කටයුතු කරන ඉංජිනේරු තැන්පත් සෝමසුන්දරම් මහතාගෙන් ඒ පිළිබඳව විමසා බැලූ විට ඔහු කිව්වේ මේ නිසා අළුතින් අක්කර 3,000 ක් පමණ අස්වද්දන්නට අවස්ථාව සැලසේවිය කියායි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ලක්ෂ 30ක් වෙන් කර තිබෙනවා.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

ඒ අන්දමට වැඩ කෙරෙන නිසා එම කටයුතු ක්‍රමවත් පිළිවෙළට සකස් කිරීම සඳහායි මම මේ අදහස් ඉදිරිපත් කරන්නේ. ඒ සඳහා මේකත් ඔය කොළඹ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන්නට යන වැඩ පිළිවෙළට ඇතුළත් කිරීම නුවණට හුරු නැද්ද? මාම්පේ-කැස්බෑව පළාත් පාලන මණ්ඩල ප්‍රදේශයත් මීට ඇතුළත් කර තිබෙනවා. එම ප්‍රදේශයේ බස්නාහිර පැත්තේයි, බොල්ගොඩ ගඟ තිබෙන්නේ. මාම්පේ-කැස්බෑව පළාත් ආණ්ඩු සභා ප්‍රදේශයත් මීට ඇතුළත් කර තිබෙනවා නම් ඇයි කෙසෙල්වත්ත සුළු නගර සභා ප්‍රදේශයත් ඇතුළත් කර ගන්නට බැරි? [බාධා කිරීමක්] දිස්ත්‍රික්කය යන්නෙහි තේරුම කුමක්ද? අධිරාජ්‍යවාදීන් මේ රට පාලනය කරද්දී ඒ උදවියගේ වුවමනා වන් ඉටුවන පරිද්දෙන් දිස්ත්‍රික් මායිම් ඇඳ දැම්මා. අධිරාජ්‍යවාදීන් අප්‍රිකාව බෙදූ හැටි බලන්න. ඒ රටේ සිතියමක් අරගෙන බැලුවොත් පෙනේවි, දිගටම කෙළින් ඉරි ඇඳ තිබෙන ආකාරය. අපේ රටේත් දිස්ත්‍රික් ඇඳ තිබෙන්නේ ඔය ආකාරය ටයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

Is this amendment regarding the Title?

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

"ටයිට්ල්" එක දමා ඇණ ගහපු ගමන් ඒකට බොල්ගොඩ අසුවන්නේ නැහැ. ඒක ටිකක් බුරුල් කරන්න තමයි මේ කතා කරන්නේ. [බාධා කිරීමක්] ඇයි, කොළඹ දිස්ත්‍රික්කයට සීමා කරන්නේ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

The principle of it has been accepted.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

අතුරු යෝජනාවක් තිබෙන නිසා ඒ උඩයි මා කතා කරන්නේ. අතුරු යෝජනා වෙන් කියන්නේ මෙය කොළඹ දිස්ත්‍රික්කය යැයි නම් කරන්නට නේද?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඒකට එකඟ වුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

මම එකඟ වුණාද? මා මේ කතා කරන්නේ පානදුරේ මන්ත්‍රීවරයා වශයෙ නුයි. පානදුරේටම ඉන්නේ මන්ත්‍රීන් දෙ දෙනායි. මා ඉන් එක් මන්ත්‍රීවරයකු වන අතර එක්සත් ජාතික පක්ෂයේ පරාජිත අනියම් මන්ත්‍රීවරයා අනික් තැනැත්තායි. ඒ හැර වෙනත් මන්ත්‍රීවරයෙක් නැහැ, පානදුරේට. මෙම වැඩ පිළිවෙළට අනුව කොළඹ දිස්ත්‍රික්කය තුළ යම්කිසි ක්‍රමයක් ක්‍රියාවේ යොදවන්නට අදහස් කරනවා නම් බොල්ගොඩ ක්‍රමයත් එම වැඩ පිළිවෙළට ඇතුළත් කළොත් හොඳයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

මේකෙන් ලැබෙන්නේ නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මේක නැතිවත් කරගෙන යනවා.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

එහෙම නම් මා කියන එක පිළිගන්නවා නම් ආණ්ඩුවට වැඩිපුර වියදමක් යන්නේ නැහැ. දැන් කොහොමටත් කරගෙන යන එක නොවැ. ඉතින් වැඩිපුර වියදමක් දරන්නටය කියා මා කියන්නේ නැහැ. නමුත් ඒ කෙරෙන වැඩවලට මේ මණ්ඩලයෙන් ප්‍රයෝජනයක්, වගබලා ගැනීමක්—

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඒවා ආණ්ඩුවෙන් කරනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මේ මණ්ඩලයේ සහයෝගය හා සම්බන්ධය ඇතිව වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඒ වැඩ කරාවි. දැනට කරගෙන යනවා. කෝට්ටේ පැත්තේ වතුර බස්වන්නෙ පානදුර ගඟ මාර්ගයෙන්.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

එසේ නම් මාම්පේ-කැස්බෑව පළාත් පාලන සභා සීමාවලට අයිති ප්‍රදේශත් මේකට ඇතුළත් කිරීමේ තේරුම කුමක්ද? මාම්පේ-කැස්බෑව පළාත් පාලන සභා සීමාවට අයිති ප්‍රදේශයත් මේකට ඇතුළත් කර තිබෙනවා. ඒ කියන්නෙ, ඒක බොල්ගොඩ ගඟෙන් එක පැත්තක තිබෙන ප්‍රදේශයක්. බොල්ගොඩ ගඟෙන් අනිත් පැත්තෙ තිබෙන ප්‍රදේශ ඇයි ඇතුළත් නොකරන්නෙ? අනික් පැත්තෙ තිබෙන්නෙ කෙසෙල්වත්ත සුළු නගර සභා ප්‍රදේශයයි.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටයි.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

ඒ අධිරාජ්‍යවාදීන් ඇඳි සීමාව උඩයි. තමුන්නාන්සේ ඒ අධිරාජ්‍යවාදීන් ඇඳි සීමාවට යට වී ක්‍රියා කරන බවයි මේකෙන් පෙනෙන්නෙ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

26 වන වගන්තිය වෙනස් නොකළොත් ඒක හරිගස්සා ගන්නට පුළුවනි.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

මම කියන්නේ මේකයි. මාම්පේ-කැස්බෑව පේරුවට මේක බලපානවා. එසේ නම් කෙසෙල්වත්ත සුළු නගර සභා ප්‍රදේශයටත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

*Question, that the words proposed to be left out stand part of the Bill, put and negatived.*

24 වන වගන්තියේ සිට 28 වන වගන්තිය තෙක් කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

24 ஆம் வாசகத்திலிருந்து 28 ஆம் வாசகம் வரை மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணை யிடப்பட்டது.

*Clause 24 to 28 ordered to stand part of the Bill.*

බර්නාඩ් සොයිසා මයා.
*(திரு. பேர்னுட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

I move the following New Clause 27:

"The House of Representatives may by resolution revoke any Order made by the Minister under Section 24 or Section 26 of this Act within fifty days of the publication of such Order in the Gazette, and in the computation of such period of fifty days no account shall be taken of any priod during which Parliament is prorogued. Such revocation shall be without prejudice to anything previously done thereunder."

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I accept that.

NEW CLAUSE 27

"27. The House of Representatives may by resolution revoke any Order made by the Minister under Section 24 or Section 26 of this Act within fifty days of the publication of such Order in the Gazette, and in the computation of such period of fifty days no account shall be taken of any period during which Parliament is prorogued. Such revocation shall be without prejudice to anything previously done thereunder."

ඉදිරිපත් කරන ලදින් පළමුවන වර කියවන ලදී.

கொண்டு வரப்பட்டு, முதல் முறை மதிப்பிடப்பட்டது.

*Brought up, and read the First time.*

බර්නාඩ් සොයිසා මයා.
*(திரு. பேர்னுட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

I move,

"That the clause be read a Second time."

වගන්තිය දෙවන වර කියවිය යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

වගන්තිය කෙටුම්පත් පණතට එකතු කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

27 වන අළුත් වගන්තිය කෙටුම්පත් පනතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

வாசகம் இரண்டாம் முறையாக மதிப்பிடப்படவேண்டு மென்றும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

வாசகம் மசோதாவில் சேர்க்கப்பட வேண்டுமெனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

27 ஆம் புதிய வாசகம் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොළඹ (පහත් බිම් ප්‍රදේශ) සංවර්ධන මණ්ඩල පනත් කෙටුම්පත

*Question, that the Clause be read a Second time, put, and agreed to.*

*Question, that the Clause be added to the Bill, put, and agreed to.*

*New Clause 27 ordered to stand part of the Bill.*

පළමුවන උපලේඛනය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

முதலாம் அட்டவணை மசோதாவின் பகுதியாயிருக்கக் கட்டளையிடப்பட்டது.

*First Schedule ordered to stand part of the Bill.*

දෙවන උපලේඛනය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

இரண்டாம் அட்டவணை மசோதாவின் பகுதியாயிருக்கக் கட்டளையிடப்பட்டது.

*Second Schedule ordered to stand part of the Bill.*

ප්‍රඥප්ති වගන්තිය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சட்டமாகு வாசகம் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

*Enacting Clause ordered to stand part of the Bill.*

## TITLE

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I move,

"That after the word 'Colombo' insert 'District'".

එම වචනය එතැනට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින් සභාසම්මත විය.

නාමය, සංශෝධිතාකාරයෙන්, කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

නාමය, සංශෝධිතාකාරයෙන්, කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

அந்தச் சொல் இங்கே சேர்க்கப்பட வேண்டும் எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு திருத்தப் பெற்றவாறு மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென்றும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு, திருத்தப்பெற்றவாறு மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.



*Question, that that word be there inserted, put, and agreed to.*

*Question, that the Title, as amended, stand part of the Bill, put, and agreed to.*

*Title, as amended, ordered to stand part of the Bill.*

කෙටුම්පත් පණත, සංශෝධන සහිතව, වාර්තා කරන ලදී.

மசோதா திருத்தத்துடன் ஏற்றுக் கொள்ளப்பட்டதாக அறிவிக்கப்பட்டது.

*Bill reported with Amendments.*

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I move,

"That the Bill, as amended, be now read the Third time."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කෙටුම්පත් පණත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වනවර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, மசோதா மூன்றும் முறையாக மதிப்பிடப்பெற்று திருத்தப்பெற்றவாறு நிறைவேற்றப் பெற்றது.

*Question put, and agreed to.*

*Bill accordingly read the Third time, and passed, as amended.*

## පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත : නියෝග

*பாடசாலை ஆசிரியர் உபகாரச் சம்பளச் சட்டம் : பிரமாணங்கள்*

## SCHOOL TEACHERS' PENSION ACT : REGULATIONS

අ. භා. 6

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

I move,

"That the Regulations made by the Minister of Finance by virtue of the powers vested in him by Section 9 of the School Teachers' Pension Act (Cap. 432) and published in Gazette No. 14,785 of January 19, 1968, which were presented on February 22, 1968, be approved."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු වන්නිනායක]

The first amendment relates to the School Teachers' Pension Act. When the schools were taken over in 1960 the Cabinet decided that pensionable teachers serving in unaided schools should not be eligible for pension if they were transferred from one unaided school to another—vide Cabinet decision No. CPA/164/60 of 7.10.60. Accordingly, the Teachers' Pension Regulations were amended on December 16, 1961, with retrospective effect as from December 1, 1960, by the inclusion of sub-paragraph (*h*) and (*i*) under paragraph (IX) of Regulation 2.

The teachers in unaided schools which were created under the Schools Take Over Act and teachers who enjoyed the pension rights when transferred from one school to another in other unaided schools also were subject to this restriction. This caused much hardship to teachers in unaided schools who were compelled to get transfers due to ill-health and other reasons. It was therefore decided that this restriction be removed with retrospective effect.

The Pension Regulations then in force did not allow the recognition of promotions given to teachers in unaided schools for the purpose of pension. It was therefore decided to amend the regulations so as to recognise for pension purposes the promotions and enhanced salary scales of teachers who were promoted as principals and special post holders.

The second amendment concerns female teachers. Female teachers who had served in urban areas for long periods when transferred to outstations were reluctant to go out. They were also unable to retire as the provisions did not permit them to do so until they completed 20 years of service or had reached 50 years of age whichever was the earlier. It was therefore considered unfair to "throw" them out of service, and in order to enable them to leave with something to their advantage it was decided to permit all female teachers

පාසැල් ගුරු විශ්‍රාම වැටුප් නියෝග

who had completed 5 years' teaching to retire from service only with a gratuity.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
*Question proposed.*

අ. භා. 6.4

**තුඩාවේ මයා.**
(திரு. துடாவ)
(Mr. Tudawe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳව ගරු මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කර ඇති මේ නියෝගවල පළමුවැන්න පිළිබඳව අපේ විරුද්ධතාවයක් නැහැ. එමෙන්ම දුර බැහැර ප්‍රදේශවලට මාරු කරනු ලබන ගුරුවරියන් එම ස්ථාන මාරු පිළිගන්නට අකමැති නම් විශ්‍රාම යන්නට ඔවුන්ට අවස්ථාව සලසා දී තිබෙනවා.

**ගරු වන්නිනායක**
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

Gratuity.

**තුඩාවේ මයා.**
(திரு. துடாவ)
(Mr. Tudawe)

පාරිතෝෂික මුදලක් දෙන්නට ලැහැස්ති කර තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දුර බැහැර ප්‍රදේශවලට යන්නට අකමැති ගුරුවරියන් පමණක් නොවෙයි ගුරුවරුනුත් සිටිනවා. නගරබද ප්‍රදේශවල සිට දුරබැහැර දුෂ්කර ප්‍රදේශවල සේවයට යන ගුරුවරුන්ට යම්කිසි පාරිතෝෂික මුදලක් දිය යුත්තේ විශ්‍රාම ගන්නට කලිනුයි. අද තිබෙන ප්‍රශ්නය නම් නාගරබද ප්‍රදේශවල සිට දුෂ්කර ප්‍රදේශවලට යන ගුරුවරුන්ට නොයෙකුත් අමාරුකම්වලට මුහුණපෑමට සිදු වීමයි. පදිංචියට සෑහෙන ගෙයක්දොරක් නැහැ. ආහාර් ද්‍රව්‍ය ලබාගන්නට විශාල මුදලක් වියදම් කරන්නට සිදු වෙනවා. තම දරුවන්ට ලෙඩ දුක් ඇති වූ විට වියදම් දරාගෙන නගරවලට ගෙනෙන්නට සිදු වෙනවා. සමහර ගුරුවරුන් හා ගුරුවරියන් නාගරබද ප්‍රදේශවල සිට ගම්බද ප්‍රදේශවලට යන්නට අකමැති වන්නේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාසැල් ගුරු විශ්‍රාම වැටුප් නියෝග

ඒ නිසයි. එයට යෙදිය යුතු පිළියම මෙය නොවෙයි. නගරබද ප්‍රදේශයක වැඩ කරන ගුරුවරියක් ගම්බද ප්‍රදේශයකට යන්නට කැමති නැත්නම් එමෙන්ම අවුරුදු 5 ක සේවාකාලයකුත් තිබෙනවා නම් එතෙක් කල් විශ්‍රාම වැටුප් සඳහා කපා ගෙන ඇති මුදල ආපසු දෙන අතරම, එතෙක් ලබා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ ක පාරිතෝෂික මුදලකුත් දීම නොවෙයි එයට පිළියම විය යුත්තේ. එයට පිළියම විය යුත්තේ නගරවලින් බැහැරව ඇත දුෂ්කර ප්‍රදේශවල වැඩ කරන ගුරුවරුන්ට විශේෂ දීමනාවක් දීමයි.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
එතකොට ඔක්කොම යාවි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
බොහොම හොඳයිනේ. ප්‍රශ්නය නිකම්ම විසඳෙනවානේ. සමාජවාදී රටවල නම් දුර බැහැර දුෂ්කර ප්‍රදේශවල සේවය කරන ගුරුවරුන්ට විශේෂ දීමනාවක් ගෙවනවා. ඒ රටවල් මේ ප්‍රශ්නය විසඳා තිබෙන්නේ ඒ ක්‍රමයෙන්. අද සිදු වී තිබෙන්නේ කුමක්ද? ගුරුවරියක් දුර බැහැර ප්‍රදේශයකට යන්න කැමති නැත්තේ දේශපාලන හේතුන් උඩ පළිගැනීම් උඩ ගුරුවරුන් දුර බැහැර ප්‍රදේශවලට මාරු කරන නිසයි. එවැනි අයට යම් දීමනාවක් දෙනවා නම් ඒ ප්‍රශ්නය පැන නඟින්නේ නැහැ. දුර බැහැර ප්‍රදේශවලට මාරුවීම් කරන්නේ ගුරුවරුන් අමාරුවේ දමන්නයි. ගුරුවරුනුත් සේවයට බැඳෙන්නේ ලංකාවේ ඕනෑම තැනක සේවය කරන්න කැමති වෙලයි. එහෙත් දැන් පළිගැනීම් උඩත් ගුරුවරුන් මාරු කරනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ගුරුවරුන් දහස් ගණනක් මාරු කර තිබෙනවා. ඔවුන් වැඩ කළ ප්‍රදේශවලට වඩා ඉතාමත්ම දුෂ්කර ප්‍රදේශවලට මාරු කර තිබෙනවා. එසේ මාරු කළේ ඒ ගුරුවරුන් අමාරුවේ දමන්නයි. මාරු කර ගුරුවරුන් අමාරුවේ දමන්නේ කොහොමද? ඒවායේ සෞඛ්‍ය පහසුකම් නැහැ. ගමනාගමන පහසුකම් නැහැ. ආහාර ද්‍රව්‍ය ලබාගැනීමට අමාරුයි. ඒ නිසා වියදම වැඩි වෙනවා. ඒ අනුව ලබන වැටුපෙන් ජීවත් වන්නට බැරි තත්ත්වයට පත් කර ඒ මගින් දඬුවම් කරන්නටයි ගුරුවරුන් දුෂ්කර ප්‍රදේශවලට මාරු කිරීමෙන් වෑයම් කරන්නේ. එහෙත් දුෂ්කර ප්‍රදේශවල වැඩ කරන ගුරුවරුන්ට යම්කිසි දීමනාවක් දෙනවා නම් සෞඛ්‍ය පහසුකම් හෝ ගමනාගමන පහසුකම් නැතිවත් කරදර විඳගෙනත් සේවය කරන්නට ඔවුන් කැමති වෙනවා. මෙය හැම රජයකටම මුහුණපාන්නට සිදු වන ප්‍රශ්නයක්. හැම කෙනෙක්ම කැමති පහසුකම් තිබෙන ප්‍රදේශවල ඉන්නයි. ඒ නිසා මෙයට යම්කිසි පිළියමකුත් තිබෙන්නම ඕනෑ. එයට යෙදිය යුතු පිළියමත් දුෂ්කර ප්‍රදේශවල සේවය කරන ගුරුවරුන්ට යම්කිසි දීමනාවක් ලබාදීමයි. එවිට කිසිම කරදරයක් නැතිව දුෂ්කර ප්‍රදේශවල තිබෙන ගුරු පුරප්පාඩුත් නිකම්ම පුරවා ගන්නට පුළුවන් වේවි. ගරු මුදල් ඇමතිතුමා කිව්වා වාගේ කිසිම අකැමැත්තක් නැතිව කවුරුනුත් යාවි. එහෙත් දැන් කර තිබෙන්නේ මොකක්ද? දුෂ්කර පළාත්වලට යෑමට අකමැත්තක් දක්වන උදවියට විශ්‍රාම යන්නැයි කියනවා. ඇයි, ගුරුවරියන්ට පමණක් එසේ කියන්නේ? ඒ තත්ත්වය ගුරුවරුන්ට නොදෙන්නේ ඇයි? අද රටේ ස්ත්‍රී පුරුෂ භේදයක් නැහැ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
ඇයි නැතෙයි කියන්නේ? එහෙම භේදයක් තියෙනවා නොවැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ස්ත්‍රී පුරුෂ භේදයක් තිබෙනවා තමයි. මා අදහස් කෙළේ එය නොවෙයි. ස්ත්‍රීන්ය, පුරුෂයින්ය කියා අයිතිවාසිකම් සම්බන්ධයෙන් අසමානත්වයක් නැහැ. මට කියන්නට වුවමනා කෙළේ එයයි. මේ රටේ ස්ත්‍රී පුරුෂ දෙකොටසටම සමාන අයිතිවාසිකම් තිබෙනවා. එහෙත් මේ වරප්‍රසාදය දෙන්නට බලාපොරොත්තු වන්නේ ගුරුවරියන්ට පමණයි. ඇත්ත වශයෙන්ම කියනවා නම් හැම කෙනකුටම මෙය දිය යුතුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

තිබෙනවා. දුෂ්කර ප්‍රදේශවලට යන්නට ඇකැමති ගුරුවරියන්ට පමණක් නොව ගුරුවරුන්ටත් මේ වරප්‍රසාදය දෙන හැටියට මෙය වෙනස් කරනවා නම් කැමතියි. ඒ කොයි හැටි වෙතත් දැනට උද්ගත වී තිබෙන ප්‍රශ්නයට නම් මෙය විධිමත් පිළියමක් නොවෙයි. එහෙත් ගරු මුදල් ඇමතිතුමා යෝජනා කර තිබෙන ආකාරයට නම් මෙය ලැබෙන්නේ ගුරුවරියන්ට පමණයි. ඒ නිසා ගුරුවරුන්ටත්, ගුරුවරියන්ටත් යනුවෙන් මෙය වෙනස් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳ ප්‍රශ්නයත් මේ රටේ අධ්‍යාපනය වාගේම ඉතාමත් අවුල් සහගත ප්‍රශ්නයක් හැටියටයි තිබෙන්නේ. උපකෘත ගුරුවරුන් හැටියට සිටි කාලයේදී ගුරුවරුන්ගෙන් විශ්‍රාම වැටුප් සඳහායයි මාස්පතා වැටුපින් සියේට හතරක් කැපුවා. මේ ක්‍රමයට එක් දහස් නවසිය විසි ගණන්වල සිටම කැපුවා. වැන්දඹු අරමුදලටත් සියේට 2 ක් කැපුවා. ඔය විධියට, ආධාර ලබන පාඨශාලාවල හිටපු අයගෙන් සියේට හයක්ම කැපුවා. රජයේ සේවකයන් අතරත් වෙනසක් තිබුණා. එක් දහස් නවසිය හතළිස් ගණන්වලට කලින් හිටපු අයගෙන් එක් ආකාරයකටත්, 1943 න් පස්සේ බැඳුණු අයගෙන් තවත් ආකාරයකටත් මුදල් අඩු කර ගත්තා. මෙසේ බලන කල ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් වෙනුවෙන් කපා ගනු ලැබූ මුදල් වල විවිධාකාර තත්ත්වයක් පවතිනවා. තවමත් එය පවතින බවයි මා කියන්නේ. එහෙත් එය වෙනස් කරන්නට තවමත් නියෝගයක් මේ ගරු සභාව ඉදිරියට ගෙනැවිත් නැහැ. ආධාර ලබන පාඨශාලාවල ගුරුවරුන්ගෙන් සියේට 4 ක් කැපුවා. පසුගිය ආණ්ඩුව පැවති කාලයේදී යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මුදල් ඇමති නිලයේ කටයුතු කළ කාළයේ එතෙක් ගුරුවරුන්ගෙන් කැපූ ප්‍රමාණය වූ සියේට 4 රේ මුදල සියේට දෙක දක්වා අඩු කළා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wannınayake)

හතරම කැපුවා නම් ඉවරයි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

තමුන්නාන්සේ ඉතිරි දෙක කපන්න. තමුන්නාන්සේටත් කපන්නට යමක් ඉතිරි කරන්නට එපායැ. එදා සියේට දෙකක් අඩු කළා. අනෙක් දෙකත් කපන්නට එදා එතුමා පොරොන්දු වුණා. එහෙත් එතුමාට දිගටම ඒ වැඩ කොටස කරගෙන යන්නට ඉඩ දුන්නේ නැහැ. එදා හිටපු මුදල් ඇමතිතුමා එසේ පොරොන්දුවක් දුන් නමුත් ඒ පොරොන්දුව මෙතෙක් මේ ආණ්ඩුවෙන්වත් ඉටුවෙලා නැහැ. දැන් විශ්‍රාම වැටුප් වෙනුවෙන් ගුරුවරුන්ගෙන් සියේට දෙකක් කපනවා. ඒ අතර, වැන්දඹු සහ අනත් දරු අරමුදල වෙනුවෙන් සියේට දෙකක් කපනවා. ඔය විධියට මුළු ප්‍රමාණය සියේට හතරක් කැපෙනවා. 1943 ට පෙර පත් වූ ගුරුවරුන්ට රජයේ අනෙකුත් සේවකයන්ට වාගේ ම විශ්‍රාම වැටුප් ලැබෙනවා. මෙය සුදුසු තත්ත්වයක් නොවෙයි. විශේෂයෙන්ම, පාඨශාලා රජයට ගැනීමෙන් පසු සියලුම ගුරුවරුන් රජයේ සේවකයන් බවට පත් වී සිටිනවා. එහෙම නම්, ඒ අයගෙනුත් රජයේ සේවකයන්ගෙන් ඉටු විය යුතු යුතුකම් බලාපොරොත්තු වෙනවා නම්, මුදල් රෙගුලාසි, පාලන රෙගුලාසි ආදී විධිවිධාන වලට ඒ හැම දෙනාම යටත් වෙනවා නම්, මේ සියලු දෙනාම සම්බන්ධයෙන් යුතුකම්ද අකුරටම ඉටු විය යුතුයයි අප කල්පනා කරන්නට ඕනෑ. ගුරුවරුන්ටත් රජයේ අනෙක් සේවකයන්ට ලැබෙන වරප්‍රසාද ලැබෙන්නට ඕනෑ. එතකොට සමහර ගුරුවරුන්ට ඒ විධියට විශ්‍රාම වැටුප් නොදෙන්නේ මන්දැයි මා අහන්නට කැමතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේ වෙත ඉතා කනගාටුවෙන් එක් කරුණක් ඉදිරිපත් කරන්නට සිද්ධවෙලා තිබෙනවා. ගුරුවරුන්ද රජයේ සේවකයන් හැටියට සැලකුවත් සමහර දෙපාර්තමේන්තුවල ඉන්න කාර්යාල කාර්ය සහායකයකුට ලැබෙන අයිතිවාසිකම් පවා සමහර දේවල් සම්බන්ධයෙන් ගුරුවරුන්ට ලැබෙන්නේ නැහැ. දෙපාර්තමේන්තුවල සේවය කරන කාර්යාල කාර්ය සේවකයන්ට බයිසිකලයක් හෙවත් පා පැදියක් ගන්නට මුදල් අත්තිකාරමක් ලබා ගන්නට පුළුවනි. එහෙත් ගුරුවරුන්ට ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අයිතිවාසිකම පවා නැහැ. ඒ නිසා දැන් රජයේ සේවයට ඇතුළත් වී සිටින ගුරුවරුන්ටත් රජයේ අනෙකුත් සේවකයන් විසින් අනුගමනය කළ යුතු රෙගුලාසි ඇති කරනු පමණක් නොව අයිතිවාසිකම්ද භුක්ති විඳින්නට පුළුවන් හැටියට විධිවිධාන සැලැස්සිය යුතුව තිබෙනවා. විශේෂයෙන්ම විශ්‍රාම වැටුප් පිළිබඳ නියෝග වහාම වෙනස් කරන්නට ඕනෑ. එදා තිබුණු තත්ත්වයට වඩා අද මේ රටේ අධ්‍යාපන තත්ත්වය වෙනස් වී තිබෙනවා. පෞද්ගලික පාඨශාලා නැති කර සියලුම පාඨශාලා රජයට ගෙන පාලනය කරන්නට කටයුතු කර තිබෙනවා. එහෙත් තවමත් රජයේ පාලනය යටතට නොපැවරුණු පාඨශාලා කීපයක් තිබෙන බව ඇත්තයි. ඒවාත් රජයේ පාලනය යටතට ගත යුතුයි. එසේ නැතිව අප බලාපොරොත්තු වන ජාතික අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක කරන්නට බැහැ. සියලුම පාඨශාලා රජයට පවරාගෙන සියලුම ගුරුවරුන්ට සමාන අයිතිවාසිකම් දෙන්නට ඕනෑ.

ගුරු සංගම් කාලයක් තිස්සේ ගෙන ගිය විශාල සටන ගැන ගරු මුදල් ඇමතිතුමා දන්නවා ඇති. ගුරුවරුන්ගේ ඉල්ලීම් ඉෂ්ට කරන බව ගරු මුදල් ඇමතිතුමා එදා ප්‍රකාශ කළා. දැන් ඉතින් බලය ලැබී තිබෙන අවස්ථාවේදී ඒ ඉල්ලීම් ඉෂ්ට කරන්නට පුළුවනි. ගුරු සටනට සහයෝගය දුන් කෙනකු වශයෙන්, ගුරුවරුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කළ කෙනකු හැටියට නියම අන්දමට ක්‍රියා කිරීමට අද ගරු මුදල් ඇමතිතුමාට අවස්ථාව සැලසී තිබෙනවා. ඉදිරිපත් කොට තිබෙන මේ වෙනස් කරන ලද නියෝගවලින් පමණක් නම් ගුරුවරුන්ගේ වුවමනා එපාකම් පිරිමසන්නට පුළුවන්කමක් නැහැ. ඒ නිසා සියලුම ගුරුවරුන්ට රජයේ අනෙක් සේවකයන් භුක්ති විඳින සියලුම වරප්‍රසාද ලබා දෙන්නට ක්‍රියා කළ යුතුයි. එසේ නොකරතොත් මෙම නියෝගවලින් කිසිම ප්‍රයෝජනයක් නැහැ. ආධාර නොලබන පාඨශාලාවල සේවය කරන ගුරුවරුන්ද මෙම නියෝගයෙන් කියවෙන අයිතිවාසිකම් ලැබීමට සුදුස්සන් කර තිබීම වැදගත් කාරණයක්.

එහෙත් මෙහිදී එක් ප්‍රශ්නයක් මතු වෙනවා. මේ නියෝග මේ විධියට සකස් කිරීමෙන් පෙනී යන්නේ ආධාර නොලබන පාඨශාලා ඉදිරියටත් පවත්වාගෙන යන්නට තමුන්නාන්සේලා බලාපොරොත්තු වන බවයි. එහෙම බලාපොරොත්තුවක් නැද්දැයි මා ගරු මුදල් ඇමතිතුමාගෙන් ප්‍රශ්න කරනවා. මේ රෙගුලාසිවලින් මට පැහැදිලි වන්නේ නම් රජය ඉදිරියට මෙම ආධාර නොලබන පාඨශාලා පවත්වාගෙන යෑමට මිස ඒවා රජයට පවරා ගැනීමට කැමති නොවන බවයි. ආධාර නොලබන පාඨශාලාවල ගුරුවරුන්ද මෙම රෙගුලාසි බල පැවැත්වෙන්නවුන් හැටියට කටයුතු යොදා තිබෙන්නේ ඒ නිසයි. ආධාර නොලබන පාඨශාලාවල ගුරුවරුන්ගේ සේවය දැනට තිබෙන රෙගුලාසි යටතේ පිළිගත යුතු වුණත්, ඒ සේවය අගය කළයුතු වුණත් මේ වාගේ විශේෂ වරප්‍රසාද සලස්වන්නේ සියලුම පාඨශාලා රජයට ගැනීමට නොකැමති හෙයිනැයිද, ඊට අවහිර කිරීම සඳහා යයිද අප සිතනවා.

ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රශ්නය ගැන තව කාරණයක් මතක් කරන්නට කැමතියි. ගුරුවරුන් නියමිත කාලයක් සේවය කළායින් පසුව විශ්‍රාම වැටුප්වලට හිමිකාරයන් හැටියට නොයෙකුත් රටවල් වෛද්‍යවරුන්ගේ සහ විශේෂඥයන්ගේ උපදෙස් අනුව තීරණය කර තිබෙනවා. අවුරුදු 25ක සේවයෙන් පසුව සියලුම ගුරුවරුන්ට විශ්‍රාම වැටුප් හිමි විය යුතු බවට ලෝකයේ බොහෝ රටවල් නීති සකස් කර තිබෙනවා. අවුරුදු 25කට වඩා සේවය කරන්නට කැමති නම් වෛද්‍යවරුන්ගේ උපදෙස් අනුව ඒ සඳහා ඉඩකඩ ලැබෙනවා. කෙසේ වෙතත් අවුරුදු 25ක් සේවය කළායින් පසුව විශ්‍රාම වැටුප් ලබන්නට සියලුම ගුරුවරුන්ට අයිතිවාසිකම් ලැබෙනවා. අපත් ඒ විධියට නීති සකස් කළ යුතුයි. අවුරුදු 5 කට වඩා සේවය කළ ගුරුවරියන්ට සේවයෙන් විශ්‍රාම ලබන්නට දැන් ඉඩ දෙනවා. ඔවුන්ට විශ්‍රාම වැටුප් දෙන්නේ නම් නැහැ. පාරිතෝෂික මුදලක් දෙනවා. විශ්‍රාම වැටුප් සඳහා කපා ගත් මුදල්ද ආපසු දෙනවා. එහෙම කරන්නට පුළුවන් නම් අවුරුදු 25ක් සේවය කළ ගුරුවරුන්ට විශ්‍රාම වැටුප් සහිතව විශ්‍රාම ලබන්නට නීති රීති සකස් කරන්නට අපහසුවක් නැහැ. ඒ විධියට කළහොත් රැකී රක්ෂා ප්‍රශ්නයටත් එය සැහෙන විසඳීමක් වෙනවා. දැනට සේවයේ යෙදී සිටින


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

ගුරුවරුන් හුඟ දෙනකු විශ්‍රාම ලබා ගිය විට අලුත් ගුරුවරුන් බොහෝ දෙනකු සේවයට බඳවා ගන්නට ඉඩකඩ සැලසෙනවා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

අවුරුදු 25ක සේවයෙන් පසුව විශ්‍රාම යන්නට ඉඩ දෙතොත් සමහරුන්ට වයස අවුරුදු 43 දීත් විශ්‍රාම ලබන්නට පුළුවන් වෙනවා නොවැ ?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඔව්, යම් කෙනකු ශරීර ශක්තියෙන් දුර්වල නම් ඒ වයසේදී විශ්‍රාම යන්නට පුළුවනි. එහෙත් ශරීර ශක්තියෙන් අඩුවක් නැතිනම් ඒ වයසේදී විශ්‍රාම යන්නට වුවමනාවක් නැහැ. ඒ වයසේදී විශ්‍රාම ලබන්නට කැමති නම් ඒ සඳහා ඉඩ දුන්නාට කමක් නැහැ. එය තමුන්නාන්සෙලාගේ රුකීරක්ෂා ප්‍රශ්නය බොහෝ දුරට විසඳා ගන්නටද හොඳ අවස්ථාවක් වෙනවා. දැන් අපේ ගුරුවරුන් එකම ගණයකට වැටී සිටින නිසා, ඒ කියන්නේ සියලුම ගුරුවරුන් රජයේ සේවකයන්ගේ ගණයට වැටී සිටින නිසා, අරහෙන් මෙහෙන් ඇති රෙගුලාසි සම්පූර්ණයෙන්ම වෙනස් කර දමා ඔවුන් වෙනුවෙන් අළුත් විශ්‍රාම වැටුප් පනතක් සකස් කරන ලෙස ගරු මුදල් ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. එසේ නොකර මේ ආකාරයට දවසෙන් දවස සුළු සුළු වෙනස්කම් කරන්නට යාමෙන් මෙම ප්‍රශ්නය තව දුරටත් අවුලෙන් අවුලට පත් වී යනවා. මා බොහොම වෙහෙස ගත්තා මෙහි යම් යම් කොටස් වටහා ගන්නට. මට යම් යම් තැන් වටහා ගන්නට පුළුවන් වුණේත් නැහැ. එයින්ම පෙනී යනවා විශ්‍රාම වැටුප් නීති රීති කොතෙක් දුරට අවුල් වී තිබෙනවාද යන්න.

අද අපේ රටේ ගුරුවරුන් එකම ගණයකට ඇතුළත් වී සිටින හෙයින්, ඔවුන්ටත් රජයේ අනිකුත් සේවකයන්ට බල පවත්වන නීති රීතිම බල පවත්නා අන්දමට අළුත් විශ්‍රාම වැටුප් පනතක් සකස් කළ යුතුය කියා මා නැවත වරක් ප්‍රකාශ කර සිටින අතර ගුරුවරියන්ට පමණක් දී තිබෙන වරප්‍රසාද සියලුම ගුරුවරුන්ටද ලැබෙන ආකාරයට සකස් කරන ලෙස ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය හමාර කරනවා.

අ. භා. 6.21

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)

ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප්වල සැහෙන ප්‍රමාදයක් සිදු වන බව පෙනී යනවා. මේ අයගේ විශ්‍රාම වැටුප් කටයුතු කෙරෙන්නට අනිකුත් අංශවලට වඩා ප්‍රමාද වෙනවා. සමහර ගුරුවරුන්ට අවුරුද්දක් පමණ ගියත් විශ්‍රාම වැටුප් ලැබෙන්නේ නැති තත්ත්වයක් පවතිනවා. සමහරවිට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වරදක් නිසා වන්නට පුළුවනි, එසේ නැතිනම් විශ්‍රාම වැටුප් නිතිරීතිවල පවත්නා අවුල් තත්ත්වයක් නිසා වෙන්නට පුලුවනි, අද දවසේ මේ උදවියගේ විශ්‍රාම වැටුප් කටයුතු රජයේ අනිකුත් අංශවලට වඩා සැහෙන අන්දමකින් ප්‍රමාද වන බව පෙනෙනවා. මේ පිළිබඳව කාරුණාකර ගරු මුදල් ඇමතිතුමාගේ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 6.22

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

යෝජනා දෙකක් තිබෙනවා. ඒ ගැනයි මා කතා කරන්නට යන්නේ. ඉස්සර ආධාර ලැබූ පාසල් රජයට ගන්න අවස්ථාවේදී ඒවායේ සිටි ගුරුවරුන් විශ්‍රාම වැටුප් හිමියන් හැටියට සිටියා. එවකට රජය තීරණය කළා, එම ගුරුවරුන් ඒ පාසල්වල සිටින තුරු වැටුප්වලට හිමිකාරයන් වන නමුත්, ඒ උදවිය යම් විධියකින් වෙනත් පාසල්වලට මාරු කළොත් හෝ මාරුවක් ඉල්ලාගෙන ගියොත් හෝ, එම විශ්‍රාම වැටුප් වරප්‍රසාදය ඒ උදවියට අහිමි වන හැටියට. එම නීතිය තද වැඩියයි කල්පනා කරන හෙයින් ඉන් ඇති වන විෂමතාව නැති කිරීම සඳහායි, මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. ගුරුවරයා කුමන පාඨශාලාවක සේවය කළත් කරන්නේ ඉගැන්වීමේ කටයුතුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) කරුණු වගයක් ඉදිරිපත් කළා. පිටිසර පළාත්වලට ගුරුවරුන් නොයැමේ ප්‍රශ්නය විසඳීමට ඇති එකම ක්‍රමය නම් වැඩිපුර ගෙවීමක් එම පළාත්වල සිටින ගුරුවරුන්ට ගෙවීම බව එතුමා සඳහන් කළා. නව අවුරුදු කිපයක් ගත වන විට ඔය ප්‍රශ්නය බොහෝ දුරට විසඳන්නට ඉඩ තිබෙනවා. මේ ශිෂ්‍ය ගුරු ක්‍රමය යටතේ ඒ ඒ ආසන වෙනුවෙන් සෑහෙන ප්‍රමාණයක් බඳවා ගන්නවා. ඒ ඒ ආසනවල ඇති ඇබෑර්තු අනුවයි, එසේ බඳවා ගන්නේ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඒ ශිෂ්‍ය ගුරුවරු.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரோா)*
(Dr. N. M. Perera)
පුහුණු වුවායින් පස්සේ එම තත්ත්වය එන්නේ නැහැ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
ඒ ඒ පළාත්වලිනුයි, බඳවා ගන්නේ

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ශිෂ්‍ය ගුරුවරුන්ගෙන් මෙම ප්‍රශ්නය විසඳන්නට බැහැ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
යාපහුව වැනි පළාත්වලට යන්නට ඉස්සර බොහෝ දෙනා අකමැතියි. සෑම අවුරුද්දක් තුළම ඇබෑර්තු අනුව ඒ ඒ පළාත් වලින් තිස් දෙනා හතලිස් දෙනා බැගින් ශිෂ්‍ය ගුරුවරුන් බඳවා ගන්නවා. පුහුණුව ලැබීමෙන් පසුත් ඒ අය යන්නේ එම පැත්තටයි. ඒ අනුව බොහෝ දුරට එම ප්‍රශ්නය විසඳෙනවා. මේ ශිෂ්‍ය ගුරු ක්‍රමය නව අවුරුදු ගණනක් පවත්වාගෙන යන විට මෙම ප්‍රශ්නය ක්‍රම ක්‍රමයෙන් විසඳෙනවා ඇති.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
අවුරුදු 50 ක් විතර යාවි.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
නැහැ. ඒ තරම් කල් යන්නේ නැහැ. දැන් කලින් තිබුණාට වඩා හොඳයි. දැන් මීට අවුරුදු හත අටකට ඉහත පැවති තත්ත්වයට වඩා හොඳ තත්ත්වයක් අපේ ආසනවලත් පවතිනවා. ඒ ඒ ප්‍රදේශවලින් දැන් සෑහෙන ගුරු පිරිසක් බිහි වී සිටිනවා. දැන් කරන්නට තිබෙන්නේ ගුරුවරුන් හිඟ පළාත්වලින් ගුරුවරුන් වැඩිපුර බඳවා ගන්නටයි. ඒ වාගේම ගුරුවරුන් වැඩි පළාත්වලින් අඩුවෙන් බඳවා ගන්නට ඕනෑ. ඒ අනුව කටයුතු කෙරෙනවා නම් කාලයක් යන විට මේ ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම නොවුණත් සෑහෙන තරමකටවත් විසඳේවි. දැනටමත් ගම්බද දුෂ්කර ප්‍රදේශවල මහා විද්‍යාල, මධ්‍ය මහා විද්‍යාල තිබෙනවා. ඒවායේ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් විශ්වවිද්‍යාලවලට පවා ඇතුළු වෙනවා.

ඇත්ත වශයෙන් මේ සම්බන්ධයෙන් පිළිතුරු දිය යුත්තේ ගරු අධ්‍යාපන ඇමතිතුමායි. බස්නාහිර පළාතේ සිටින ගුරුවරියන් පිටිසර පළාත්වලට යැවීම අධ්‍යාපන ඇමතිතුමාට බලවත් හිසරදයක් වී තිබෙනවා. මට දැන ගන්නට ලැබී තිබෙන හැටියට නම්—එය ඇත්තද නැත්තද කියන්න මා හරියට දන්නේ නැහැ—බස්නාහිර පළාතේ පාසල්වල ඉන්නා ගුරුවරුන් අතුරින් සියයට 75 ක් පමණම ගැහැණු.

**කේ. වයි. එම්. විජේරත්න බණ්ඩා මයා.**
(සොරනාතොට)
*(திரு. கே. வை. எம். விஜேரத்ன பண்டா—சொரணத்தோட்டை)*
(Mr. K. Y. M. Wijeratne Banda—Soranatota)
අපේ පළාත්වල ගුරුවරියන් හිඟයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

බස්නාහිර පළාතේ ගුරුවරියන් වැඩියි. ඊට යම් යම් හේතුන් තිබෙනවා. ගැහැණුන්ගේත පිරිමින්ගේත් වෙනස මොකක් දැයි මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) ඇහුවා. කොහොම කීවත් යම්කිසි වෙනසක් තිබෙනවා. එම නිසා ගැහැණුන් පිරිමින් එක විධියටම මාරු කරන්නට බැරි බව එතුමා වුණත් පිළිගන්නවා ඇති.

ආධාර ලබන පාඨශාලාවල සේවය කළ ගුරුවරයකු වශයෙන් මාත් දන්නවා විශ්‍රාම වැටුප් වෙනුවෙන් ඒ දවස්වල ගුරුවරුන්ගෙ වැටුපෙන් සියයට 4 ක් කපා ගත් බව. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මුදල් ඇමති කාලයේදී එය සියයට 2 දක්වා අඩු කළා. එතුමා සමහර ප්‍රශ්න බාගෙට විසඳුවා. මේකත් ඒ විධියට බාගෙට විසඳු ප්‍රශ්නයක්.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

ඇයි තමුන්නාන්සේ අනෙක් බාගෙ විසඳන්නේ නැත්තේ ?

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

ඒ විෂමතාව ගැන රජයේ අවධානය යොමු වී තිබෙනවා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

අවධානය යොමු වන්න තුන් අවුරුද්දක්ම ගියා.

**ගරු වන්නිනායක**
*(கௌ._வ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

ඊළඟට විශ්‍රාම වැටුප් ප්‍රමාදය ගැන වචන කීපයක් සඳහන් කරන්න කැමතියි. මේ කාරණය සම්බන්ධයෙන් කටයුතු කරන්නේ මගේ පාර්ලිමේන්තු ලේකම්තුමායි. දැන් හුඟක් දුරට ඒ ප්‍රමාදය අඩු කර තිබෙනවා. එසේ ප්‍රමාද වීමට මූලික හේතුව සමහර දෙපාර්තමේන්තුවලින් විශ්‍රාම වැටුප් ලියකියවිලි කලට වේලාවට නොලැබීමයි. සමහර දෙපාර්තමේන්තුවලින් නම් ඉතාමත් පැහැදිලි අන්දමට ඒ ලියකියවිලි එවනවා. එහෙත් හදිසියෙන් පිහිටුවූ අළුත් දෙපාර්තමේන්තුවලින් ඒ ලියකියවිලි නිසියාකාරව එවන්නේ නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

අධ්‍යාපන දෙපාර්තමේන්තුව දැන් විමධ්‍ය ගතකර තිබෙනවා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

ඒ, වැඩ හුඟක් වැඩි නිසා වන්න ඇති. මේ තත්ත්වය ලිහිල් කිරීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂතුමාට මා නියෝග කර තිබෙනවා. ඒ ඒ කච්චේරිවලට ගිහින් ඒ කටයුතු පරීක්ෂා කර බලන්න බොහොම අමාරුයි. එතුමා රජයේ අනෙකුත් දෙපාර්තමේන්තුවල නම් ඒ පිළිබඳ කටයුතු පරීක්ෂා කරනවා. විශේෂයෙන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ විශ්‍රාම වැටුප් අංශයක් වෙනම පිහිටුවා තිබෙන බව සඳහන් කරන්න කැමතියි. එතැනින් ලියකියවිලි ආවාට පස්සේ තමයි, භාණ්ඩාගාරයෙන් කටයුතු කරන්නේ. මා ඒ ගැනත් අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය යොමු කිරීමට බලාපොරොත්තු වෙනවා.

ගුරු සේවයේ නොයෙකුත් අඩුපාඩුකම් තිබෙන බව මා පිළිගන්නවා. ඒවා හැකි තාක් දුරට අඩු කිරීම සඳහා දිය හැකි සෑම සහයෝගයක්ම දෙන්නට මම සූදානම්.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## විදේශ විදුලි සන්දේශ පනත: රෙගුලාසිය

## கடல் கடந்த தொலைச் செய்திப் போக்குவரத்துச் சட்டம்: பிரமாணம்

## OVERSEAS TELECOMMUNICATION ACT: REGULATION

අ. භා. 6.29

**ගරු වන්නිනායක**

*(கௌரவ வன்னிநாயக்க)*

(The Hon. Wanninayake)

I move,

"That the Regulation made by the Minister of Finance by virtue of the powers vested in him by Section 6 of the Overseas Telecommunication Act, No. 61 of 1957, as amended by Act, No. 8 of 1963, which was presented on February 24, 1968, be approved."

The Overseas Telecommunication Service which was administered by Messrs. Cable & Wireless Limited was taken over by the Government on June 1, 1951. The Ceylonese staff employed by the company were adsorbed into the service of the Ceylon Government and a separate pension scheme on the basis of the scheme obtaining under the company was formulated for these employees. The Overseas Telecommunication Act, No. 61 of 1957, as amended by Act No. 8 of 1963, provided, *inter alia*, the new pension scheme and also vested in the Minister of Finance the authority to make regulations in regard to the administration of this scheme.

In accordance with Treasury Circular No. 700 of September 4, 1966, old-entrant officers in the Public Service, that is those who were first appointed or who qualified for appointment to the Public Service prior to September 24, 1956, who are unable to work in the Sinhala language are allowed to apply for retirement, and if permission to retire is granted by the Secretary to the Treasury, they are granted the pensions or gratuities which they would have received had they retired on grounds of ill-health. They are not entitled to any compensation for loss of career. The Minute on Pensions applicable to pensionable public officers has been amended accordingly. A similar amendment is proposed to the Pensions Regulations made under the Overseas Telecommunication Act as the officers who are governed by these Regulations were all in the service of the Government prior to September 24, 1956.

In terms of Section 6 of the Overseas Telecommunication (Amendment) Act, No. 8 of 1963, the regulation relating to the amendment is presented for the approval of the House of Representatives.

We are trying to bring the officers in the Telecommunication Service in line with the rest of the officers. I do not think there is any controversy on this matter.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

අ. භා. 6.31

**ඉලංගරත්න මයා.**

*(திரு. இலங்கரத்ன)*

(Mr. Ilangaratne)

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව වචනයක් දෙකක් මා කථා කරන්නට ඕනෑ. මේ රෙගුලාසිවලින් බලාපොරොත්තු වන්නේ රාජ්‍යභාෂා පණත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දැන් තිබෙන රෙගුලාසිවල කිසියම් වැඩිපුර වෙනසක් කිරීමයි. සිංහලය රාජ්‍ය භාෂාව කිරීමේ පණතත් ද්‍රවිඩ භාෂා විශේෂ විධිවිධාන පණතත් නිසා මේ රටේ විශාල ආන්දෝලන ඇති වුණු බව ඔබතුමා දන්නවා. මැතිවරණ කාලයේදී ඒවා ඉතා විශාල වශයෙන් බල පෑවා. මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසු විශේෂයෙන්ම භාෂා ප්‍රශ්නය සම්බන්ධයෙන් වෙනස්කම් කීපයක් කර තිබෙන බව අප දන්නවා. අප රට පාලනය කරන කාලයේදී අප වෙත එල්ල කරන ලද විශාල චෝදනාව වූණේ අප සිංහල භාෂාවට දෙන තැන මදි බව හා දෙමළ භාෂාවට දෙන තැන වැඩි බවයි. මේ කරුණු උඩ මේ රටේ විශාල අර්බුද ඇති වුණා. සමහර අය "පයින් ගමන්" ගියා. පදවියේ සිංහල-දෙමළ ඝට්ටන ඇති වුණා. මේ සියල්ලම ඇති වුණේ සිංහලය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]
රාජ්‍ය භාෂාව කර දෙමළ භාෂාවට සාධාරණ තැනක් දෙන්නට අප සූදානම් වුණු අවස්ථාවේදීයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
නෑ, නෑ.

**ඉලංගරත්න මයා.**
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
රාජ්‍ය ඇමතිතුමා මොනවාට "නෑ නෑ" කියනවාදැයි මා දන්නේ නැහැ. අප එදා එසේ කටයුතු කරන්නට යන විට, අද රජයේ සිටින බොහෝ කොටස් අපට කිව්වේ අප සිංහලයට තැන දෙනවා මදි බවයි. ඔවුන් එසේ කිව්වා පමණක් නොව, ජාති භේද වාද අවුස්සා සිංහල-දෙමළ සට්ටන ඇති වන තැනට මඟ පෑදුවා. අප සිංහලයට තැන දෙනවා මදිය කියමින් එක් පිරිසක් මහනුවරට පයින් ගිය හැටි ඔබතුමාටත් මතක ඇති. ගම්පහ ගරු මන්ත්‍රීතුමාත් (එස්. ඩී. බණ්ඩාර නායක මයා.) මෙහි සිටිනවා. ගරු බණ්ඩාර නායක අගමැතිතුමා සිංහල රාජ්‍ය පණත ක්‍රියාත්මක කරන්නට සූදානම් වුණු අවස්ථාවේදීත් නොයෙක් විධියේ උද්ඝෝෂණ මේ රටේ ඇති වුණා. ඒ අවස්ථා වේදී එක්තරා පැවිදි පිරිසක්, බණ්ඩාර නායක අගමැතිතුමා සිංහල භාෂාවට තැන දෙනවා මදිය කියමින් කැකෝගැසූ හැටි තමුන්නාන්සේට මතක ඇති. ඒ වාගේම දෙමළ භාෂාවට එතුමා දෙන තැන වැඩියයිද ඒ පිරිස කෑගැසුවා. ඒ කාලයේ දී බණ්ඩාරනායක අගමැතිතුමාත් චෙල්ව නායගම් මහත්මයාත් අතර ඇති කර ගෙන තිබුණු කිසියම් සම්මුතියක්, සිංහල යට තැන දෙනවා මදියයි කෑගැසූ පිරිසට ඇනුම්කන් දීමක් වශයෙන්, ඉරා දැමූ බව අප දන්නවා.

ඒ කටයුතු එසේ සිදු වුණායින් පසු, පසුගිය මහා මැතිවරණයේදී, අපගේ රජය සිංහල භාෂාවට තැන දෙනවා මදියයි උද්ඝෝෂණය කළ පිරිස් "ත්‍රෛනිකායික මහ සඟ පෙරමුණ" නමින් පෙරමුණකුත් ඇති කරගෙන ලංකාව පුරාම අපට විරුද්ධව ප්‍රචාර ගෙන ගියා. ඊට පසු මේ ආණ්ඩුව බලයට ආවා. මේ ආණ්ඩුව, භාෂා ප්‍රශ්නය සම්බන්ධයෙනුත් දිස්ත්‍රික් සභා හා ඉඩම් සම්බන්ධයෙනුත් නොයෙක් විධියේ කොන්දේසි සහිත රහස් ගිවිසුම් ඇති කරගෙන කටයුතු කරන බව දන්කවුරුනුත් දන්නවා. මෙම ගරු සභාවේදී ගරු අගමැතිතුමාත් රජයට සම්බන්ධ අනෙක් පක්ෂවල නායකයනුත් ඒ බව කෙළින්ම නොකිවත්——

**ගරු වන්නිනායක**
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ විශ්‍රාම වැටුප් සම්බන්ධවයි. [බාධාකිරීම්]

**ගරු මොන්ටේගු ජයවික්‍රම (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමති)**
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம—அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர்)
(The Hon. Montague Jayewickreme—Minister of Public Works, Posts and Telecommunications)
විශ්‍රාම වැටුප් දෙනවාට අකැමතිද?

**ඉලංගරත්න මයා.**
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
ඒ ගැන අප විරුද්ධ නැහැ. එහෙත් අප මේවා විවේචනය කරන්නට ඕනෑ. අප අපගේ අදහස් මේ ගරු සභාව මාර්ග යෙන් රටට ඇහෙන්නට කියන්න ඕනෑ. ඒකටයි අප ඉදිරිපත් වී සිටින්නෙ.

ඒ රහස් ගිවිසුම පිළිබඳව තවම මේ ආණ්ඩුව නියම ප්‍රකාශයක් කර නැහැ. නමුත් පත්‍ර මාර්ගයෙන්, "ජනදින" සහ "ඇත්ත" යන පත්‍රවල මාර්ගයෙන් එය රටට හෙළි කළා. ඊළඟට මොකද කළේ? ලංකාවේ නොයෙක් දෙසින් කළ විරෝධ යන් හා උද්ඝෝෂණයන් මධ්‍යයේ 1966 ජනවාරි 8 වැනිදා දෙමළ භාෂා (විශේෂ විධිවිධාන) පනත යටතේ රෙගුලාසි සම්මත කළා. ප්‍රශ්න විසඳීම ආණ්ඩුවක යුතු කමක්. ඒවාගේම පැහැදිලි ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීමත් ආණ්ඩුවක යුතුකමක්. අප මේ ආණ්ඩුවට කෙළින්ම කරන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

චෝදනාව නම් මේ ආණ්ඩුව විපක්ෂයේ සිටියදී පමණක් නොව ආණ්ඩු බලය අල්ලා ගත්තාට පසුවත් රාජ්‍ය භාෂාව පිළිබඳව නියම ප්‍රකාශයක් නොකර නොයෙක් විධියේ යටිකූට්ටු ක්‍රියා මාර්ග වලින් රාජ්‍ය භාෂා පනතට නොයෙක් විධියේ අවැඩ කරනවාය යන්නයි. ඒකයි අප කරන චෝදනාව. මේ ආණ්ඩුව බලයට පත්වූවාට පසුව 1966 සැප්තැම්බර් මස 4 වන දින නිකුත් කළ භාණ්ඩාගාර චක්‍රලේඛය ගැන මා ඔබතුමාට මතක් කරන්නට සතුටුයි. "රජයේ සේවකයෝ (ආදි ප්‍රවේශක නිලධාරීහු) සහ රාජ්‍ය භාෂාව" යනු එහි මාතෘකාවයි. එම චක්‍ර ලේඛයෙන් සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීම පිළිබඳව අපේ ආණ්ඩුව කාලයේදී යම් පියවරවල් ගැන නොතකා සිංහල භාෂාව රාජ්‍ය භාෂාව වීම තව ටිකක් දික්ගස්සා තිබෙනවා.

මෙම චක්‍ර ලේඛයෙන් අපේ ආණ්ඩුව කාලයේදී නිකුත් කර තිබෙන චක්‍ර ලේඛ කීපයක්ම අහෝසි කර තිබෙනවා. ඒවා මෙසේයි :

(1) 1958 ජනවාරි 18 වැනි දින අංක 425 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය.
(2) 1958 පෙබරවාරි 12 වැනි දින අංක 430 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය.
(3) 1963 මාර්තු 7 වැනි දින අංක 2/9/156/15/8 (එච්) දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපිය.
(4) 1963 ඔක්තෝබර් 18 වැනි දින අංක 620 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය.
(5) 1963 ඔක්තෝබර් 18 වැනි දින අංක 621 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය.
(6) 1964 පෙබරවාරි 26 වැනි දින අංක 638 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය.

මේ චක්‍ර ලේඛ සියල්ලක්ම 1966 සැප්තැම්බර් 4 වන දින සහ අංක 2/9/156/26 (එච්) දරණ චක්‍ර ලේඛයෙන් අවලංගු කර තිබෙනවා. 1956 සිංහල රාජ්‍ය භාෂා පනත ඉදිරිපත් කළ අවස්ථාවේදී 1960 දෙසැම්බර් 31 වන දිනට පෙර එය ක්‍රියාත්මක කර අවසාන කරන්නට අප අදහස් කළා. නමුත් යම් විධියකින් 1960 දෙසැම්බර් 31 වන දින වන විට එම පනත සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරන්නට නොහැකි වුණොත් එක්තරා අන්දමකට සහන සලසා දීම පිණිස රෙගුලාසි පැන වීමට අප එම පනතින් ඉඩ තබා තිබුණා. ඒ අනුව සිංහල භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් ඇති කර ගන්නට අප අවස්ථාව දුන්නා. කල් දුන්නා. සහන දුන්නා. නමුත් අප ඒ සහන සැලසුවේ කුමන කොන්දේසි යටතේද? සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතාවක් ඇති කර ගැනීමට සැහෙන උත්සාහයක් දැරුවා නම් ඒ උදවිය තවත් ධෛර්යමත් වන විධියටත් සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතාවක් ඇති කර ගැනීම වර්ජනය කළ උදවිය රාජ්‍ය සේවයෙන් අස් කිරීමටත් අප කටයුතු කළා.

අප ඒ විධියට කටයුතු කළේ මක්නිසා ද? රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කරන්නටය කියා ඒ කාලයේදී විපක්ෂයත් ඒවාගේම ආණ්ඩු පක්ෂයේ උදවියත් අපෙන් තදින්ම ඉල්ලා සිටියා. විශාල බල පෑමක් තිබුණා. සිංහල භාෂාව පිළිබඳව රාජ්‍ය සේවකයන් තුළ ප්‍රවීණත්වයක් ඇති කර ගැනීමට අපි ධෛර්යය දෙනවා මදිය, පනත ක්‍රියාත්මක කිරීමේ වේගය මදිය කියා විශාල උද්ඝෝෂණයක් ගෙන ගියා. එමනිසා මහජන මතයට ගරු කිරීමක් වශයෙන් අප ඒ ආකාරයට කටයුතු කළා. ඒ අනුව ආණ්ඩුවේ සේවකයන්ට පුළුවන් තරම් සිංහල භාෂා ප්‍රවීනතාවක් ලබා ගන්ට ධෛයර්‍ය දෙන්නටත්, එක්තරා අන්දමකින් බල කරන්නටත් අපි උත්සාහ කළා.

තවත් කොන්දේසියක් තමයි, එක්තරා කාලසීමාවක් ගියාට පසු අළුතෙන් ආණ්ඩුවේ සේවයට බැඳුණු සියලු දෙනාම සිංහල මාධ්‍යයෙන් විභාග ගත යුතුයි කියන එක. එහෙත් ඊට පෙර ලංකාවේ හැමතැනම සිංහල ඉගැන්වීමට විධිවිධාන සැලැස්විය යුතුයි. මේක ක්‍රියාත්මක කරන කාලයේත් තරමක බලපෑම් තිබුණා. දැන් වගේ මෙච්චර තිබුණේ නැහැ. ගුරුවරුන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවලට යාම වර්ජනය කළා. අපට සහයෝගය දැක්කුවේ නැහැ. ඒ අතර සිංහල ඉගෙන ගෙන ප්‍රවීණතාවක් ලබා ගන්න පවා ද්‍රවිඩ රාජ්‍ය සේවකයන් උනන්දුවක් දැක්කුවේ නැහැ. සිංහල ඉගැන්වීමට අවස්ථාවක් ඇති කරන්ටත් ආණ්ඩුවට බැරි වුණා; සිංහල මාධ්‍යයෙන් රාජ්‍ය සේවයට බඳවා ගන්නටත් බැරි වුණා. මීට විරුද්ධව විශාල කලබැගෑනියක් ඇති කරමින් එක්සත් ජාතික පක්ෂයත්, විරුද්ධ පාර්ශ්වයේ එකල සිටි ඇතැම් වෙනත් පක්ෂත් අපට විරුද්ධව චෝදනා නැගුව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

දැන් එක්සත් ජාතික පක්ෂය බලයට ආවට පසුව මොකද කරන්නෙ? 1966 ජනවාරි 8 වැනිදා දෙමළ භාෂා විශේෂ විධිවිධාන පනත ඉදිරිපත් කරල සිංහල රාජ්‍ය භාෂාව මුළු ලංකාවේම ක්‍රියාත්මක වීම අඩපණ කිරීමට පියවරක් ගත්ත. සිංහල රාජ්‍ය භාෂාව පිළිබඳව විශාල උද්ඝෝෂණයක් රටපුරා එදා ගෙන ගිය එක්සත් ජාතික පක්ෂයට සහයෝගය දැක්වූ මහානායක ස්වාමීන් වහන්සේලා පවා අද කියා සිටිනව, "දඹරාවේ හාමුදුරුවො මරා දැම්මෙ අපරාදෙ: ඒ හාමුදුරුවො කිව්ව දේ, කියන්ට ආව දේ සම්පූර්ණ ඇත්ත" කියා එදා, අද උතුරු සහ නැගෙනහිර පළාත්වල සිංහලට තැනක් නැහැ කියා සේරුවිල නායක හාමුදුරුවොත්, නාගදීපේ නායක හාමුදුරුවොත් වගේ එක්සත් ජාතික පක්ෂයට සම්පූර්ණයෙන්ම උදව් කළ ස්වාමීන් වහන්සේලා පවා කෑ ගහනව. ඒ විධියේ තත්ත්වයක් ඇති කරල සිංහල රාජ්‍ය භාෂාව කිරීමේ වැඩ පිළිවෙල සම්පූර්ණයෙන්ම අඩපණ කළා.

ගරු සභාපතිතුමනි, අද තිබෙන තත්ත්වය ඔබතුමා දන්නවා ඇති. දෙමළ විශේෂ විධිවිධාන පනත ක්‍රියාත්මක කරන්ට ගිහින් ගරු අගමැතිතුමාට අද සමහර පළාත්වල උභතෝකෝටික ප්‍රශ්නවලට මුහුණ පාන්ට සිදු වී තිබෙනව. තමුන්නාන්සේ පත්‍ර මාර්ගයෙන් දකින්ට ඇති. අපි විභාගකර බැලුව. ද්‍රවිඩ ජනයා හුඟක් ඉන්න උඩරට පළාතකට සිංහලෙන් පමණක් චක්‍රලේඛයක් පිට කළ අවස්ථාවකදී ද්‍රවිඩ පුරවැසියන් කියා තිබෙනව මේක අපට තේරෙන්නෙ නැහැ කියා. ඔවුන් ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයේ නායකතුමා ළඟට ගිහින් අගමැතිතුමාට මේ කාරණය පෙන්නා දුන්න. ඊට පසුවයි, අගමැතිතුමාගේ නීතියේ තිබෙන තද බල ගතිය තේරුම් ගිහින් තිබෙන්නෙ. අගමැතිතුමා එදා ජනවාරි 8 වෙනිදා කියා සිටියා, මේක අබමල් රේණුවක තරමින්වත් බණ්ඩාරනායක ප්‍රතිපත්තියට වෙනස් නැහැ කියා. ත්‍රිසිංහලයේම පළාත් නවයේම සිංහල භාෂාව රාජ්‍ය භාෂාව වෙනවා යයි කෑ ගැසුව. මගේ චෝදනාව සිංහල භාෂාව පිළිබඳ ප්‍රශ්නය හෝ ද්‍රවිඩ භාෂාවට තැන දීමේ ප්‍රශ්නය හෝ මෙහෙම කළයුතුය කියන එක නොවෙයි. මගේ චෝදනාව මේ ආණ්ඩුව එකක් කියල තවත් එකක් කරන එක ගැනයි. යම්කිසිවක් ප්‍රකාශ කරල, එය ක්‍රියාත්මක කරල අන්තිමේදි එහි ඵල විපාක භාර ගන්ට තරම් ආත්ම ශක්තියක්, හෘදය සාක්ෂියක් මේ ආණ්ඩුවට නැති බවයි මම කියන්නෙ. එවකට කියා සිටියා, සිංහල රාජ්‍යභාෂා ප්‍රතිපත්තිය මුළු ලංකාවේම ක්‍රියාත්මක කරනවා කියා. දැන් සිංහලය රාජ්‍ය භාෂාව වෙලා තිබෙන්නෙ පළාත් 7 ක විතරයි. ද්‍රවිඩ භාෂාව මුළු ලංකාවේම රාජ්‍ය භාෂාව වෙලා තිබෙනව. උතුරු නැගෙනහිර පළාත් දෙකේ රාජ්‍ය භාෂාව ද්‍රවිඩ භාෂාවයි. අනික් පළාත්වල ද්‍රවිඩ භාෂාවටත්, සිංහල භාෂාවටත්, ඉංග්‍රීසි භාෂාවටත් සමතැනක් ලැබී තිබෙනව. අපේ ප්‍රතිපත්ති නොයෙක් විධියෙට වෙනස් වෙන්ට පුළුවනි. එහෙත් එකක් කියල තවත් එකක් කිරීම ගැනයි අපේ චෝදනාව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ශ්‍රේණියේ උදවියට විතරක් විශේෂයක් කරන්නේ ඇයි කියා මා අහන්ට කැමතියි. මේ රෙගුලාසිය මොකක්ද?

"මේ නියෝගවලට පටහැනිව කුමක් සඳහන් වුවද, දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද්ද 1956 සැප්තැම්බර් 24 දට කලින් සිට අඛණ්ඩ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙහි) නියෝග. එහි 19 වැනි නියෝගයට ඉක්බිතිවම පහත සඳහන් අළුත් නියෝගය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ."

මේ නියෝග ගැසට් පත්‍රයේ පළ කර තිබෙනවා. 19 වැනි නියෝගය මොකක්ද?

"මේ නියෝගවලට පටහැනිව කුමක් සඳහන් වුවද, 1956 සැප්තැම්බර් 24 දට කලින් සිට අඛණ්ඩ සේවයේ යෙදී සිටිය සාමාජිකයකු සිංහල භාෂාවෙන් රාජකාරි කටයුතු කිරීමට නොහැකි වීම නිසා 1964 ජනවාරි 1 වැනි දින හෝ ඊට කලින් විශ්‍රාම ලැබුවොත් මේ නියෝග යටතේ සෞඛ්‍ය හේතු නිසා විශ්‍රාම ලබන්නෙකුට ගෙවිය යුතු පමණ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් වේද එපමණම ගණනක් ඔහුට ගෙවිය යුතුය."

මා කලින් සඳහන් කළ චක්‍ර ලේඛයේ අදහස මීට වඩා වෙනස්. මොකක්ද ඒකෙ තියෙන්නෙ?

"ස්වකීය රාජකාරි කටයුතු සඳහා සිංහල භාෂාව භාවිතා කළ යුතුයයි ආදි ප්‍රවේශක නිලධාරීන්ට බල නොකළ යුතුය. කෙසේ වුවද, ඇතැම් අවස්ථාවලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෙම නිලධාරීන්ගෙන් සමහරෙක් ස්වකීය බඳවා ගැනීමේ මාධ්‍යයට අන්‍ය වූ මාධ්‍යයකින් රාජකාරි කට යුතු කිරීමට බැඳී සිටින්නට පුළුවන්."

මේකට බල පාන කොටස මෙන්න:

"පහත දැක්වෙන 2 වැනි උප ඡේදයේ සඳහන් ආදි ප්‍රවේශක නිලධාරීන් හැර සෙසු නිලධාරීන්ට විශ්‍රාම ගැනීම සඳහා ඉල්ලුම් කිරීමට අවසර දිය හැක. විශ්‍රාම ගැනීමට ඔවුනට අවසර දුනහොත් සෞඛ්‍ය හේතූන් උඩ ඔවුන් විශ්‍රාම ගත්තේ නම්, ඔවුනට ලැබෙන විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය හෝ ඔවුනට ලබා ගැනීමට හිමිකම් ලැබෙනු විනා රැකියාව නැති වී යෑමේ හේතුවෙන් වන්දියක් ලැබීමට හිමිකමක් නැත."

මේ පැරාවෙන් අදහස් කරන්නෙ ගරු මුදල් ඇමතිතුමා දුන් ඉදිරිපත් කර තිබෙන එකට වඩා වෙනස් දෙයක්.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

1956 සැප්තැම්බර් 24 වැනි දට පෙර සේවයේ යෙදී සිටි සියලු දෙනාම.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

සේවයේ හිටපු පරණ උදවියද අළුත් උදවියද කියන එක ගැන නොවෙයි, මා සඳහන් කරන්නෙ. මේ චක්‍ර ලේඛයේ තිබෙන පැරාවෙත්, ඔබතුමා ඉදිරිපත් කර තිබෙන මේ රෙගුලාසියෙත් වෙනසක් තිබෙනවා. ඒ වෙනස නිසා මොන විධියේ ප්‍රතිඵල ඇති වෙනවාද කියන්නට මට අමාරුයි. ඒක තීරණය කිරීම ඔබතුමාගේ විශේෂඥයන්ට භාරයි. මේ චක්‍ර ලේඛයේ තිබෙනවා, "රැකියාව නැති වීමේ හේතුවෙන් වන්දියක් ලැබීමට හිමිකමක් නැත" කියා. දෙවැනි එකේ ඒක නැහැ. වන්දියක් තියෙනවද නැද්ද කියන එක තේරෙන්නෙ නැහැ. මා අහන්නේ, ඇයි මේ අයට පමණක්—විදුලි සන්දේශ සේවයේ අයට පමණක්—විශේෂයක් කරන්නෙ, අනික් අයට ඒක නොකරන්නෙ, කියායි.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

1956 සැප්තැම්බර් 24 වැනිදට පෙර සිටි අයට ලැබෙනව නේද ඒ වරප්‍රසාදය?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ඒ චක්‍ර ලේඛයෙත්, මේ රෙගුලාසියෙත් වෙනසක් තිබෙන නිසා ඒ ගැන පරීක්ෂා කර ඒ වෙනසෙන් ප්‍රයෝජනයක් තිබෙනවා නම් සියලු දෙනාටම ඒ ප්‍රයෝජනය සාධාරණව ලැබෙන්නට සලස්වන ලෙස මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

දෙවැනි කාරණය මේකයි. මේ චක්‍ර ලේඛය අනුව කණිෂ්ඨ සේවකයන් හා ජ්‍යෙෂ්ඨ සේවකයන් අතර විශේෂයක් නැහැ. මේ චක්‍ර ලේඛයෙන් අදහස් කෙරෙන්නෙ හැමෝටම එක විධියයි. ඔබතුමාගෙ රෙගුලාසියෙ මෙහෙම තියෙනවා:

"එසේ වුවද පූර්වෝක්ත විධිවිධාන පහත සඳහන් සාමාජිකයන්ගෙන් කිසිවකුට අදාළ නොවිය යුතුය.

1 භාණ්ඩාගාරයේ ලේකම් විසින් තීරණය කරනු ලබන පරිදි කණිෂ්ඨ ශ්‍රේණිවලට අයත් යම් සාමාජිකයකු."

එයින් තේරෙන්නේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන්ට පමණක් මේ සහනය ලැබෙන බවයි. කණිෂ්ඨ සේවකයන්ට එය නොලැබෙන බවයි. ඔබතුමා අදහස් කරන්නේ යම් කෙනකු සිංහල ප්‍රවීණතාව ඇති කර ගැනීමට බැරිය කියා විශ්‍රාම ගත්තොත් ලෙඩක් නිසා විශ්‍රාම ගත් කෙනකුට මෙන් සංග්‍රහ කළ යුතු බවයි. ඒ සහනය ජ්‍යෙෂ්ඨ සේවකයන්ට තියෙනවා. මේකෙ හැටියට කණිෂ්ඨ සේවකයන්ට ඒ සහනය නැහැ. යම් කිසි ගිවිසුමකට බැඳී සිටි උදවියටත් නැහැ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

විශේෂ ගිවිසුමකට.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ඔව්, විශේෂ ගිවිසුමකට බැඳී සිටි උදවියටත් නැහැ. එහෙත් ඔය කොන්දේසි දෙක අනික් ආණ්ඩුවේ සේවකයන්ට නැහැ. ඒ නිසා මේ ඉදිරිපත් කර තිබෙන රෙගුලාසිවලින් කණිෂ්ඨ සේවකයින්ටත්, ගිවිසුම්වලට අත්සන් කර සිටින සේවකයින්ටත් අනික් අයට වඩා අඩු සැලකිල්ලක් කරන්


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

නේ ඇයි? ඒ නිසා සිංහල ප්‍රවීණතාව නැති නිසා යම් සහනයක් දෙනවා නම් කණිෂ්ඨ ජ්‍යෙෂ්ඨ වශයෙන් භේදයක් නැතිව සාධාරණව කාටත් දෙන්නය කියා මා ඉල්ලා සිටිනවා.

සිංහල භාෂාව කොතරම් දුරට රාජ්‍ය භාෂාව වෙනවාද කියන එක ප්‍රතිපත්ති වැඩක්. එය විවේචනය කරන්නේ වෙනත් අන්දමකටයි. එහෙත් ශ්‍රේණි අතරත් වෙනසක් ඇතිවීම ගැන සොයා බලන්නට සිදු වෙනවා. කලින් තිබුණු චක්‍ර ලේඛයේ හැටියට අහවල් දවසට කලින් කියා දින නියමයක් තිබුණා. මේ චක්‍රලේඛය බල පැවැත්වූයේ 1966 සැප්තැම්බර් 4 වැනිදා සිටයි. අනික් චක්‍ර ලේඛය බලපැවැත් වූයේ ඊට කලින් සිටයි. ඒ නිසා මෙයින් අදහස් කරන්නේ ඊට පසුව වුණත් 1966 සැප්තැම්බර් 4 වැනිදා වනතුරු යම් කෙනෙක් මේ අන්දමට විශ්‍රාම ගත්තා නම් ඒ අයටත් මේ වරප්‍රසාද දෙන එකයි. මේ සම්බන්ධව මා මීට වඩා දීර්ඝ විස්තරයක් කරන්නේ නැහැ.

මා ඔබතුමාට කරුණක් කියනවා. කරුණාකර සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීමත්, දෙමළ භාෂාවට ඔබතුමාල දෙන තැනත් හැංගිහොරා ක්‍රියාත්මක නොකර කරන දේ රටටම ඇසෙන්නට කියන්නය කියා මා කියනවා. මා කලින් කී විධියට අද නම් මුළු ලංකාවේම රජ කරන්නේ දෙමළයි. සිංහළ, දෙමළ හා ඉංග්‍රීසිවලට පළාත් 7 ක සම තැන ලැබී ඇති අතර උතුරු නැගෙනහිර පළාත්වල දෙමළ භාෂාව තනිකරම රජ කරනවා. ඒ නිසා කරන දේ කෙලින්ම ප්‍රකාශ කර එය කරන්නය කියා මා කියා සිටිනවා. දැන් කල් ගත්වී තිබෙන නිසාත්, දිස්ත්‍රික් සභා පනත් කෙටුම්පත එහෙම තිබෙන නිසාත්, අර හැංගී තිබෙන රහස් ගිවිසුම දැන්වත් ඉදිරිපත් කළොත් එය කවුගෙටවත් යවා ලේඛනයක් හැටියට තැන්පත් කරන්නටත් පුළුවන්කම ලැබෙනවා. අපේ ගිවිසුම මේකයි, අපි ක්‍රියාත්මක කළේ මේවායි, මේවා ක්‍රියාත්මක කිරීමට තිබෙනවාය කියා කරුණාකර කියන්න. එසේ කර අවංක ආණ්ඩුවක් හැටියට ක්‍රියා කළොත් ඔබතුමන්ලාට විරුද්ධව ප්‍රචාරයක් ගෙන යන්නට වුවමනා නම් එහෙමත්, පක්ෂව විවේචනය කරන්න ඕනෑ නම් එහෙමත් කරන්න අපට පුළුවන් වෙනවා. තමුන්නාන්සේලාගේ රාජ්‍ය භාෂා ප්‍රශ්නය මේකයි කියා ප්‍රචාරය කර හරින්නත් පුළුවන් වෙනවා.

මගේ ඉල්ලීම මේකයි. කණිෂ්ඨ සේවක යින්ටය කියා අඩුවෙන් සංග්‍රහ කරන්න එපා. සිංහල ප්‍රවීණතාව නැතෙයි කියා ජ්‍යෙෂ්ඨ අය විශ්‍රාම ගත් විට එක ක්‍රමය කුත්, කණිෂ්ඨ අය විශ්‍රාම ගත් විට තව ක්‍රමයකුත් තිබීම සුදුසු නැහැ. ගිවිසුම්වලට අත්සන් කර සිටින අයටත් එහෙමයි. එහෙත් විදුලි සන්දේශ දෙපාතීමේන්තුවට පිටස්තරව සිටින අයට ඒ අඩුපාඩුකම් අවහිරකම් මොකවත් නැහැ. ඒ නිසා කරුණාකර දෙකොටසටම සාධාරණව සංග්‍රහ කරන හැටියට මා ඉල්ලා සිටිනවා.

අ. භා. 6.55

**ගරු වන්නිනායක**

*(கௌரவ வன்னிநாயக்க)*

(The Hon. Wanninayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙයට අදාල නැති කරුණු කීපයකුත් කියන්නට යෙදුණා. මෙය ඉදිරිපත් කර තිබෙන්නේ මෙන්න මේ නිසයි. 1956 සැප්තැම්බර් 24 වැනිදාට පෙර බැඳුණු සමහර අය රාජ්‍ය භාෂාව ගැන දැනීමක් නැති නිසා විශ්‍රාම ගැනීමේදී යම් යම් වරප්‍රසාද ලැබුවා. විදුලි සන්දේශ දෙපාතීමේන්තුවේ තවත් කොටසක් සිටියා තමන්ගේ විශ්‍රාම වැටුප් පනතේ එවැනි වරප්‍රසාද කිසිවක් අඩංගුව නොතිබුණු. එහෙත් ඒ අයත් සේවයට බැඳී සිටින්නේ 1956 සැප්තැම්බර් 24 වැනිදාට පෙරයි. ඒ නිසා එකම කාල සීමාවක සේවයේ යෙදී සිටි පිරිසකට එක විධියේ විශ්‍රාම වැටුප් ක්‍රමයක් තිබෙන්නට ඕනෑය කියන එක යුක්තිසහගත සාධාරණ රජයක් හැටියට මේ රජය පිළිගෙන තිබෙනවා. ඒ නිසා විශ්‍රාම වැටුප් අතින් දෙපක්ෂයටම සම අයිතිවාසිකම් ලබාදීමයි මෙහි අදහස.

කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (වී. බී. ඉලංගරත්න මයා.) යම් යම් විෂමතාවන් ගැන කිව්වා. තවම එවැන්නක් ඉදිරිපත් වෙලා නම් නැහැ. එහෙත් එවැනි දේවල් ගැන දැනගන්නට ලැබුණු හැටියේම ඒ සෑම කරුණක් ගැනම ක්‍රියා කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සාධාරණ අන්දමට සියළුම සේවකයින්ට යුතුකම ඉටු කිරීමට අපි ලැහැස්තියි. අවාසියක් හෝ අසාධාරණයක් හෝ සිදු වූ රජයේ සේවකයන් ගැන දන්නවා නම් අපට ඉදිරිපත් කරන මෙන් කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමාට මා ආරාධනා කරනවා.

සිංහල භාෂාව රජයේ භාෂාව කිරීම ගැන දීර්ඝ විස්තරයක් කළා. ඒ ගැන විවාදයක් පටන් ගැනීමට මෙය අවස්ථාව නොවෙයි. ඒ නිසා මා ඊට දැන් සූදානම් නැහැ. එතුමාගේ කාලයේදීත් සිංහල භාෂාව රාජ්‍ය භාෂාව හැටියට ක්‍රියාවේ යොදන්නට බැරි වූ බව කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමාත් පිළිගන්නවා. එතුමා මෙන්ම අපත් එය පිළිගන්නවා. අද එය මුළු රටමත් පිළිගන්නවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරන්නට බැරි වුණු බවයි මා කිව්වේ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

දැන් උන්නැහේ කියන එක මාත් පිළිගන්නවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

දැන් ඒ කාලයේ තිබුණු ටිකවත් කෙරෙන්නේ නැහැ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

පුළුවන් තරම් කරන්නට අපත් වීර්ය කරනවා. සිංහල භාෂාව රාජ්‍ය භාෂාව හැටියට පුළුවන් තරමින් ක්‍රියාවේ යොදන්නට උත්සාහ කරනවා ඒ අතර දෙමළ භාෂාවට දිය යුතු සාධාරණ තැන දෙමින්. මීට පෙර තිබුණු ආණ්ඩුවත් ඒ ප්‍රතිපත්තියයි අනුගමනය කෙළේ. යුක්තිසහගතව කරන්නට පුළුවන් තරම් කරන්නට අපිත් උත්සාහ කරනවා. මීට වඩා දීර්ඝ විස්තරයක් කරන්නට වුවමනාවක් ඇතැයි මා කල්පනා කරන්නේ නැහැ. රාජ්‍ය භාෂා ප්‍රශ්නය සම්බන්ධයෙන් මේ අවස්ථාවේ කථා කරන්නට වුවමනාවක් නැහැ.

තවත් එක් වැදගත් කාරණයක් කියන්නට කැමතියි. මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ යම්කිසි වරදක් සිදු වී තිබෙනවා නම් එය නැති කරන්නටයි. කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා හෝ වේවා වෙන මන්ත්‍රීවරයකු හෝ වේවා ඉදිරිපත් කරන යම් වැදගත් දෙයක් වෙතොත් ඒ ගැන සලකා බලා සුදුසු පරිදි ක්‍රියා කරන්නට අප බලාපොරොත්තු වන බවයි මට කියන්නට තිබෙන්නේ.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I suggest that we take item 4 because it is a non-controversial one.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

No, Sir. It is true that it is a non-controversial item. But we have to speak on it.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

We have to leave out item 5 also because it is a controversial one.

## පළාත් පාලන අතුරු ව්‍යවස්ථා
## உள்ளூராட்சித் துணைவிதிகள்
## LOCAL GOVERNMENT BY-LAWS

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I move,

"That the by-law made by the Galle Municipal Council under sections 267 and 272 of the Municipal Councils Ordinance (Chapter 252), relating to plans for new

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

buildings or alterations to existing buildings and approved by the Minister of Local Government which was presented on March 26, 1968, be confirmed."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I move,

"That the by-laws made by the Kurunegala Municipal Council under sections 267 and 272 of the Municipal Councils Ordinance (Chapter 252), relating to plans for new buildings or alterations to existing buildings and approved by the Minister of Local Government which were presented on March 26, 1968, be confirmed."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

Sir, shall I move item 26?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரோா)*
(Dr. N. M. Perera)

No, Sir. It is not fair. Some hon. Members might want to speak on this matter.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

How about item 29?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரோா)*
(Dr. N. M. Perera)

It is not controversial. But hon. Members might want to say something in regard to this item too.

# කල් තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී:

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය".—[ගරු සී. පී. ද සිල්වා].

"சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக" [கௌரவ சி. பி. டி சில்வா] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப்பெற்றது.

*Motion made, and Question proposed,* "That the House do now adjourn".—[*The Hon. C. P. de Silva*].

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

නියෝජ්‍ය සභාපතිතුමනි, අධ්‍යාපන ඇමතිතුමාගේ සැලකිල්ලට භාජන කිරීම සඳහා එක්තරා කාරණයක් සඳහන් කරන්න කැමතියි. මගේ ඡන්දදායක කොට්ඨාශයේ එක්තරා ඡන්දදායකයකු ගෙන් ලැබුණු ලිපියක් පසුගිය පෙබරවාරි 11 වැනි දා අධ්‍යාපන ඇමතිතුමාට මා භාර දුන්නා. ඒ ලිපියේ සඳහන් වුණේ පානදුරා බාලිකා විද්‍යාලයේ I වැනි ශ්‍රේණියට ශිෂ්‍යා වන් දෙතුන් දෙනකු ඇතුළත් කර ගැනීම අකටයුතු අන්දමට ප්‍රතික්ෂේප කර ඇති බවයි. පදිංචි ස්ථානයේ සිට විද්‍යාලයට ඇති දුර ප්‍රමාණය අනින් බැලුවත්, විද්‍යාලයට ඇතුළත් කර ගැනීම ප්‍රතික්ෂේප කළ ඒ ශිෂ්‍යාවන්ගේ පදිංචි ස්ථානයට වඩා දුරින් පදිංචි ශිෂ්‍යාවන් එම විද්‍යාලයට ඇතුළත් කරගෙන තිබෙන බවට පැමිණිලි කර තිබෙනවා. ඒ පිළිබඳව ඇමතිතුමාට පැමිණිලි කිරී මෙන් පසුව විභාගයක් පවත්වා තිබෙනවා. එසේ ඒ පිළිබඳව විභාගයක් පැවැත්වීම ගැන මේ ගරු සභාවේදී අධ්‍යාපන ඇමති තුමාට මා ප්‍රසිද්ධියේම කෘතඥතාව පළ කරනවා.

යථෝක්ත ශිෂ්‍යාවන් එම විද්‍යාලයට ඇතුළත් කර ගැනීම විද්‍යාලයාධිපතිණිය විසින් වැරදි විධියට ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති බව ඒ විභාගයේදී ඔප්පු වුණා. ඒ පරීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් කලු තර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂතුමා ඒ විදුහල්පතිණියට නියෝග කළා, ඒ ළමයින් විද්‍යාලයට ඇතුළත් කර ගන්නය කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එහෙත් එම ළමයින් ඒ විද්‍යාලයට ඇතුලත් කිරීමට ගිය දෙමාපියන්ට බලාපොරොත්තු සුන් කර ගැනීමට සිදු වූයේ, ඔවුන් ඇතුළත් කර ගැනීම විදුහල්පතිණිය ප්‍රතික්ෂේප කිරීම නිසායි. ළමයින් ඇතුළත් කරවා ගැනීම සඳහා මාර්තු 31 වැනි දා විද්‍යාලයට ගිය නමුත් විදුහල්පතිණිය නොසිටි නිසා බැරි වුණා. නැවත වරක් අප්‍රේල් 1 වැනි දා ගියා. එදා විදුහල්පතිණිය හිටියා. එහෙත් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ නියෝගය සඳහන් ලිපිය අරගෙන ගිය ඒ තැනැත්තන් ඇය විසින් පන්නා ගනු ලැබුවා. අප්‍රේල් 2 වැනි ද ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂතුමාත් සමගම විද්‍යාලයට ගිය සමරනායක මහතා ළමයින් ඇතුළත් කර ගන්නැයි විද්‍යාලයාධිපතිණියගෙන් ඉල්ලා සිටි නමුත් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ කීමටවත් කීකරු නොවූ විද්‍යාලයාධිපතිණිය ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කළා. එවිට, ළමයින් ඇතුළත් කිරීමේ ලොග් පොත අරගෙන ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂතුමාම ඒ ළමයින් ඇතුළත් කරන්නට ගියා. එවිට විද්‍යාලයාධිපතිණිය කීවා, "මා මෙහෙම ක්‍රියා කරන්නේ අන් කිසි කාරණයක් නිසා නොවෙයි, මේ ළමයින් ඇතුළත් කර ගන්න එපා යැයි අධ්‍යාපන ඇමතිතුමාගෙන් පෞද්ගලික නියෝගයක් මට ලැබී තිබෙන නිසාය" කියා. එවිට ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂතුමා කීවා, "එහෙම නම් ඒ බව ලියවිල්ලකින් දෙන්න" කියා. එවිට ඇය "මේ ළමයින් ඇතුළත් කර නොගන්නේ එසේ කරන ලෙස අධ්‍යාපන ඇමතිතුමා නියෝග කළ නිසාය" යනුවෙන් ලියවිල්ලක් දී තිබෙනවා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
ගුරුවරියද, ලියවිල්ල දුන්නේ ?

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
ඔව්. ඇය ඒ ළමයින් ඇතුළත් කරගෙන නැහැ. එහෙත් ඊට වඩා දුරින් පදිංචි ළමයින් ඇතුළත් කරගෙන තිබෙනවා. මෙවැනි කරුණක් නිකම් මඩ ගැසීම සඳහා ආවාට ගියාට මා ඉදිරිපත් නොකරන බව තමුන්නාන්සේ දන්නවා ඇති. මා මේවා ඉදිරිපත් කරන්නේ කාරණා සෝදිසි කර බලා වගකීමක් ඇතිවයි. මේ අවස්ථාවේදී ගරු අධ්‍යාපන ඇමතිතුමා නම් මෙම ගරු සභාවේ නැහැ. එහෙත් පාර්ලිමේන්තු ලේකම්තුමා ඉන්නවා. එද ඒ ළමයින් තුන් දෙනා ඇතුළත් කර ගැනීම ප්‍රතික්ෂේප කළත්, දැන් ඔවුන් ඇතුළත් කර ගන්නට සිදු වෙනවා. ඒ ළමයින් ඇතුළත් කර ගැනීම වළක්වන්නට පුළුවන්කමක් නැහැ. එහෙත් ප්‍රශ්නය එය නොවෙයි. ඒ ළමයින් පාඨශාලාවට භාර ගන්නට එපා යයි ගරු ඇමතිතුමා නියෝගයක් නොදී ඇති අවස්ථාවක විදුහල්පතිණිය මේ විධියට ක්‍රියා කර තිබෙනවා නම් ඇයට විරුද්ධව යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්නට ඇමතිතුමාට සිදු වෙනවා. ළමයින් තුන් දෙනා එම පාඨශාලාවට ඇතුළත් කළ යුතු බව කරුණු පරීක්ෂා කිරීමේදී ඔප්පු වී ඇති නිසා දැන් ඔවුන් ඇතුළත් කර ගැනීමට සිදු වී තිබෙනවා. කෙසේ වෙතත් දැන් මෙතැන ප්‍රශ්නය වී තිබෙන්නේ විදුහල්පතිණිය අනුගමනය කළ ක්‍රියා මාර්ගයයි. ගරු ඇමතිතුමා විදුහල්පතිණියට "මේ ළමයින් ඇතුළත් කර ගන්නට එපා" යයි නියෝගයක් දී ඇතැයි ඇය අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට ලිපියකින් දන්වා තිබෙන බවට මට ආරංචියක් ලැබුණා. ඒ විධියේ ලිපියක් දී ඇති බව ඔප්පු වුණොත් ඒ අනුව සුදුසු පරිදි ක්‍රියා කරන්නට ඇමතිතුමාට සිදු වෙනවා. ඇමතිතුමා ඒ අනුව ක්‍රියා නොකළහොත් එතුමා ඇයට ඒ විධියේ නියෝගයක් දුන් බව පිළි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

ගන්නට අපටත් මෙම ගරු සභාවටත්, රටටත් සිදු වෙනවා. මේ අවස්ථාවේදී ඉතා කරුණාවෙන් එක ඉල්ලීමක් ඉදිරිපත් කරන්නට කැමතියි. මෙම ප්‍රශ්නයේදී ඉතාමත්ම අපක්ෂපාත ලෙස ක්‍රියා කර ඇති කළුතර අධ්‍යාපන අධ්‍යක්ෂතුමා නම් මාරු කරන්නට එපා. එවැන්නක් වේදැයි මා දන්නේ නැහැ. කෙසේ වෙතත් මෙම ප්‍රශ්නය ගැන සොයා බලා මේ කියන කාරණාවල ඇත්තක් තිබෙනවා නම් ඒ අනුව සුදුසු පරිදි ක්‍රියා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

අ. භා. 7.7

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.** (ගම්පහ)
*(திரு. எஸ். டி. பண்டாரநாயக்க—கம்பஹா)*
(Mr. S. D. Bandaranayake—Gampaha)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රජයේ වැඩ ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අසන්නට තිබෙනවා. බණ්ඩාරනායක ගුණානුස්මරණ ශාලාව සඳහා බුලර්ස් පාරේ පිහිටි ඉඩමේ මුල් ගල තැබුවේ කවදාද? මේ ආණ්ඩුව බලයට පත් වීමෙන් පසුව මේ ගුණානුස්මරණ ශාලාව සඳහා ඊට කලින් සකස් කළ සැලැමවල් වෙනස් කරනු ලැබුවේද? ඒ ගොඩනැගිල්ල සම්පූර්ණ කරන්නේ කවදාද? මේ ශාලාව ගොඩ නැඟීමට ඇති ඉඩම පෞද්ගලික සමාජ ශාලාවකට හෝ පුද්ගලයකුට නැවත පවරා දීමට අදහස් කරනවාද? මේවාට පිළිතුරු මොනවාදැයි දැනගන්නට කැමතියි.

අධ්‍යාපන ඇමතිතුමාගෙන්ද ප්‍රශ්නයක් අහන්නට තිබෙනවා. මෙය මීට කලින්ද මතු කළා. සීගිරි බිතුසිතුවම් නැවත වරක් මහජනයා සඳහා විවෘත කරන්නේ කවදාද යන්නත්, එසේ විවෘත කිරීම ප්‍රමාද කිරීමට හේතුව කුමක්ද යන්නත් දැනගැනීමට කැමතියි.



අ. භා. 7.8

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ජනසතු සේවා ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහන්නට තිබෙනවා. මේ අසන ප්‍රශ්නය ගැන මීට කලින්ද මා එතුමාට කියා තිබෙනවා. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු වන ලයනල් ගුණතිලක මහතාගේ හිතුවක්කාර සහ අයහපත් වැඩ පිළිවෙළ නිසා එහි සෑම ශ්‍රේණියකටම අයත් සේවකයන් අතර විශාල නොසන්සුන් තත්ත්වයක් පැන නැඟී තිබෙනවා. මෙම තත්ත්වය නිසා මේ සංස්ථාවේ ක්‍රියා මාර්ගයන් ළඟදීම සම්පූර්ණයෙන්ම වාගේ ඇණහිටින සවභාවක් පවතිනවා. වෘත්තීය සංගම් මගින් මෙම අධ්‍යක්ෂවරයාට විරුද්ධව චෝදනා ගණනාවක් ඉදිරිපත් කොට තිබෙනවා. ඒ වෘත්තීය සංගම්වල නියෝජිතයන් ගරු ඇමතිතුමාත් ගරු අගමැතිතුමාත් මුණ ගැසී ඒ සංස්ථාව පිළිබඳව මෙන්ම ඊට පිටස්තර, එහෙත් රජයට අදාළ නොයෙකුත් කරුණු පිළිබඳව වටිනා අදහස් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තුවෙන් සිටිනවා. ඉහත කී අධ්‍යක්ෂවරයාට විරුද්ධව ඉදිරිපත් කරන චෝදනාවලින් දෙකක් මෙසේයි:

1. ඒ අධ්‍යක්ෂවරයා තමා හෝ තමා වෙනුවෙන් පෙනී සිටින අය ලවා හෝ සංස්ථාවේ කොන්ත්‍රාත් ආදියෙන් ලාභ ප්‍රයෝජන අත් කර ගැනීමෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 8 වන ඡේදයේ බී සහ සී යන උපවගන්ති උල්ලංඝනය කර තිබේ.

2. එම පනතේ 10 වන ඡේදය අනුව එවැනි ලාභ ප්‍රයෝජන ලබා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලයට හෙළි නොකිරීමෙන්ද තව දුරටත් එම පනත උල්ලංඝනය කර ඇත.

මේ හැර මේ අධ්‍යක්ෂවරයාගේ ඉරියව් හා වෙනත් නොපනත්කම් පිළිබඳව කරුණු දැක්වීමට අවස්ථාව සලසා දෙන ලෙස සංස්ථාවේ සේවකයන් විසින් කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇති ඉල්ලීමට ඉඩ දෙන බව අගමැති වරයා මට දන්වා තිබෙනවා. මේ සාකච්ඡාව ඉක්මණින්ම ලබා දුන්නොත් මා සිතන හැටියට ජනසතු සේවා කටයුතු පිළිබඳ ඇමතිතුමාටත් එම සංසථාවටත් රජයටත් දැනගතයුතුව ඇති හුඟක් කරුණු ඒ උදවිය මගින් දැනගන්නට පුළුවන් වන නිසා මේ පිළිබඳව කල්පනා ව යොමු කරන හැටියට මා ඉල්ලනවා.

රජයේ වැඩ පිළිබඳ අංශය භාර ගරු ඇමතිතුමාගෙනුයි, ඊළඟ ප්‍රශ්නය අහන්න ට තිබෙන්නේ. කොලොන්නාවේ පිහිටි රජයේ කර්මාන්ත ශාලාවේ සේවකයන් අතර එක්තරා කුතුහලයක් ඇති වී තිබෙනවා, එම කර්මාන්ත ශාලාව වෙනත් පළාතකට ගෙන යනවාය කියන ආරංචිය උඩ. [බාධා කිරීමක්] මෙම ප්‍රශ්නය පිළිබඳව මා දන්වා එවා තිබෙනවා. දැනට මත් ඒ සඳහා වැලිගම ප්‍රදේශයේ ගොඩ නැගිලි සාදා තිබෙන බව සමහර උදවිය කියනවා. එසේම සමහර උදවිය කියනවා, මොරටුව ප්‍රදේශයේ ඒ සඳහා ගොඩනැගිලි සාදා තිබෙනවාය කියා. ඊට කලින් එහි වැඩ කරන සේවකයන්ට දන්වා එවා තිබුණා, ලංකාවේ පළාත් නවය තුල මෙම කර්මාන්ත ශාලාවේ ශාඛා නවයක් අරඹන් නට යන හෙයින් ඒ ඒ පළාත්වල සේව ය සඳහා යන්නට කැමති උදවිය සිටින වානම් දැනුම් දෙන්නය කියා. ඒ අනුව සමහර උදවිය රත්නපුරයට, සමහර උදවිය මහනුවරට යනාදී වශයෙන් කැමැත්ත පල කර සිටියා. එහෙත් දැන් ඔක්කෝම යවන්නට හදන්නේ වැලිගම ට. මෙම වැඩ පිළිවෙළ දේශපාලන වශයෙන් එතරම් හොඳ දෙයක් නොවන බවයි කියන්නට තිබෙන්නේ.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

මම පිළිතුරු දෙන විට කරුණු කියන්නම්.

**ඉලංගරත්න මයා.**
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

සමාගම් හතරක් මගින් තමන්ගේ නිලධාරීන් මාර්ගයෙන් මේ තත්ත්වයට විරුද්ධව නමුන්නාන්සේට කරුණු සැලකර තිබෙනවා. ඒ උදවිය ගේ ජීවිත මෙම වැඩ පිළිවෙළට අනුව නොයෙකුත් ආකාරයට වෙනස් වන්නට ඉඩ තිබෙන හෙයින් මේ ගැන විශෙෂ අව ධානය යොමු කරන ලෙස මා කියනවා. එහි පිහිටි වැද්දුම් ආයතනය වෙන දිහාවකට ගෙන යාම ගැන දැනටමත් කුතුහලයක් පවතිනවා. ඒවාගේම රථවාහන අළුත් වැඩියා කිරීමේ ආයතනයත් ට්‍රැක්ටර්ස් අළුත්වැඩියා කිරීමේ ආයතනයත් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ආයතනයත් පිටමං කිරීමට වීයඝී කරනවාය කියන අද හසකුත් පවතිනවා. කරුණු මෙසේ හෙයින් සතුටුදායක අන්දමින් තමතමන්ගේ වැඩ කටයුතු කර ගෙන යාම පිණිස ඒ උදවියට දෙන රුකුලක් වශයෙන් මේ පිළිබඳව පවත්නා තත්ත්වය ගැන ඔවුන්ට කරුණු කියා සිටින ලෙස මා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

එම කර්මාන්ත ශාලාවට අයත් යන්ත්‍ර අතුරින් පැරණි ඒවා හැටියට සලකා සේව යට ගත නොහැකි බවට නම්කොට කොන් ඩෙම් කරන යන්ත්‍ර ඒ කියන තරම් පැරණි ඒවා නොවන බව කියනවා. ඒවා සේවයට ගන්නට තරම් යෝග්‍ය තත්ත්වයක නැතැයි කිව්වාට මොකද හොඳ තත්ත්ව යක තිබෙන හෙයින් එම උදවියම ඒවා විකුණා ගන්නා බව කියනවා. මේවා දූසමාන ආරංචියි. සමහරවිට මේවායේ ඇත්තක් තිබෙන්නටත් පුළුවනි. එවැනි යන්ත්‍ර අතර ජීප් රථ 5 ක් තිබෙනවාලු. ලොරි 33 ක් තිබෙනවාලු. රෝලර්ස් 20 ක් තිබෙනවාලු. ඩම්පර්ස් 5 ක් තිබෙනවාලු. එයාර් කොම්ප්‍රෙසර්ස් 2 ක් තිබෙනවාලු. කොන්ක්‍රීට් බේසිං 5 ක් තිබෙනවාලු.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

ට්‍රැක්ටර්ස් 2 ක් තිබෙනවාලු. මේවා පාවිච්චියට යෝග්‍ය නැතෙයි කියා කොන්ඩෙම් කරවාගෙන ඒවා අබලන් ඒවා හැටියට ප්‍රකාශ කරවාගෙන ඒ උදවියම මිලදී ගන්නවාලු. මෙම තත්ත්වය පිළිබඳව විභාග කර බලන හැටියට මා ඉල්ලා සිටිනවා.

අ. භා. 7.13

**ඇස්. බී. යාලෙගම මයා.** (රත්තොට)
*(திரு. எஸ். பி. யாலேகம—றத்தோட்டை)*
(Mr. S. B. Yalegama—Rattota)

ඉඩම් හා වාරිමාර්ග ඇමතිතුමාගෙන් ප්‍රශ්න 2 ක් අසන්නට තිබෙනවා. ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය යටතේ මීට අවුරුදු 3 කට පමණ පෙර රත්තොට ආසනයේ වාරියපොල නමැති වත්තෙන් අක්කර 15 ක් උකුවෙල සහ ඇල්වල කියන ප්‍රදේශවල වෙසෙන ජනතාව අතර බෙදා දීම පිණිස කටයුතු කර ගෙන ගියා. ඒ සඳහා 38 වන අතුරු ව්‍යවස්ථාව යටතේ එම ඉඩම් අත්පත් කර ගැනීම පිණිස ගැසට් කළා පමණක් නොව ඉඩම් කච්චේරියක්ද පවත්වා ඒවා බෙදා දීම සඳහා කට්ටිකරුවන් 53 දෙනෙක්ද තෝරා ගත්තා. තත්ත්වය මෙසේ පවතිද්දී මෙම අවුරුද්දේ ජනවාරි මාසයේ 26 වන දින මාතලේ දිසාපතිවරයා විසින් කලින් දැනුම්දීමක් ද කොට එම කොටසේ ආදායම් පාලක නිලධාරිවරයා පිටත් කර යැව්වා, ඒ ඉඩමේ භුක්තිය භාර ගැනීම පිණිස. එසේ ගිය අවස්ථාවේ දී සිදු වූයේ කුමක්ද? එම වත්තේ වතුපාලකයන් එම වත්තට ඇතුල් වන ගේට්ටුව ඉදිරියට ඇවිත් ඒ ආදායම් පාලක නිලධාරිවරයාට තර්ජනය කර තිබෙනවා පමණක් නොව අනතුරු පවා කිරීමේ අදහසින් පාරත් අවහිරකොට ඔහුව එතැනින් පලවා හැර තිබෙනවා. ඒ පිළිබඳව ඉඩම් ඇමති අංශයට දැනුම් දෙන්නට යෙදුණා. එම දැනුම් දීම අනුව ඉඩම් අමාත්‍යාංශය මගින් නියෝගයක් යැව්වා, වහාම එම ඉඩම අත්පත් කර ගැනීම පිණිස ක්‍රියා කරන්නටය කියා. ඒ අනුව මාතලේ දිසාපතිතුමා විසින් එදා එම ඉඩමට ඇතුල් වීම අවහිර කිරීම සම්බන්ධවද සඳහන් කොට එහි භුක්තිය පවරා දෙන ලෙස නියෝගයක් නිකුත් කරන මෙන් ඉල්ලා මාතලේ දිස්ත්‍රික් උසාවියේ නඩුවක් පවරන්නට යෙදුණා. ගිය මස 24 වන දින පළමු වන වරට එම නඩුව ඒ උසාවියේ ඇසීමට අරගෙන එම මස 31 වන දින තෙක් කල් දැම්මා. ඒ අතරතුරේ දී ඉඩම් අමාත්‍යාංශයේ එක්තරා නිලධාරියකුගේ නියෝගයක් උඩ, අමාත්‍යාංශයෙන් ලියවිල්ලකුත් රැගෙන 29 වැනිදා ජීප් රියකින් එහි ගිය එක් නිලධාරියකු මෙම නඩුව පුළුවන් තරම් ඈත දිනයකට කල් ගන්නා ලෙස මාතලේ දිසාපතිතුමාට කියා තිබෙනවා. ඊට හේතුව, මෙම ඉඩම අත්පත් කර ගැනීම අත්හැරි බවට ගැසට් නිවේදනයක් ඇමතිතුමාගෙන් නිකුත් කරවා ගන්න තුරු නඩුව කල් දමා ගැනීමේ ඕනෑ කමයි. මේ විධියේ ඉල්ලීමක් කිරීමට ඉදිරිපත් වන ඔබ කවුදැයි ඒ අවස්ථාවේදී දිසාපතිතුමා පවා එම නිලධාරියාගෙන් ප්‍රශ්න කර තිබෙනවා.

මේ සඳහා කොළඹ සිට නිලධාරියකු යැවීමට තරම් තත්ත්වයක් කුමන විධියකට ඇති වුණාද යන ප්‍රශ්නයයි මා අහන්නේ. මෙවැනි අවස්ථාවකදී සාමාන්‍ය වශයෙන් කෙරෙන්නේ, විදුලි පණිවුඩයකින් හෝ ලියුමකින් හෝ නියෝග නිකුත් කිරීම මිස නිලධාරීන් ඒ ඒ ස්ථානවලට පිටත්කර යැවීම නොවෙයි. මේ සඳහා එක්තරා පුද්ගලයකුගේ බල පෑමක් ඇති වුණු බව මා දන්නවා. මේ ඉඩම අත්පත් කර ගැනීම අත්හැරීමට ඇමතිවරයා නියෝග කර තිබියදීත් ඔබ මේ විධියටක්‍රියා කරන්නේ ඇයි ඇයි ඔහු මාතලේ දිසාපතිවරයාගෙන් අසා තිබෙනවා. එක් පුද්ගලයකුගේ, එක් වතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමාගමක බල පෑම නිසා මේ වියඩිට ක්‍රියා කිරීම ඉතාමත් අසාධාරණයි. අවුරුදු 3 ක පමණ කාලයක් තිස්සේ ඒ ප්‍රදේශවාසීන් විසඳා ගැනීමට බලාපොරොත්තු වුණු ප්‍රශ්න යක් විසඳා දීමට දිසාපතිවරයා ඇතුළු අනෙක් නිළධාරීන් කටයුතු කරද්දී ඊට බාධා ඇති වන අන්දමින් මෙවැනි සිදුවීම් ඇති වීම ඉතාමත් කණගාටුදායකයි. එම නිසා, ප්‍රදේශවාසීන්ගේ යහපත මිස එක් පුද්ගලයකුගේ, එක් වතු සමාගමක යහපත ගැන කල්පනා නොකර, අක්කර දහස් ගණනක ඉඩම් තිබෙන "මීසාන්" නමැති මේ වතු සමාගමේ යහපත ගැන කල්පනා නොකර, අක්කර 15 ක මේ ඉඩම ජනතා වට ලබා දීම සඳහා ගෙනයන මේ ව්‍යාපාරය වෙනුවෙන් ඉදිරිපත් වී, අමාත්‍යාංශයේ යම් නිළධාරියකු මීට විරුද්ධව කටයුතු කර තිබේ නම් ඔහු ගැන සොයා බලා, ඉඩමේ බුත්තිය මාතලේ දිසාපතිවරයාට බාර දීම සඳහා ගෙන යන මේ නඩුව ඉවත් කරන් නට ඉඩ නොදී, මේ සම්බන්ධව සාධාරණ අන්දමින් කටයුතු කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. නඩුව අස් කරවා ගැනීමට මාතලේ දිසාපතිවරයාට බල කිරීමක් තිබෙන බවට දූසමාන ආරංචියක් මට ලැබී තිබෙනවා. ඊට ඉඩ නොතබන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටි නවා.

එන්සාල් වැවිය හැකි කැලෑ ඉඩම් අක් කර 2000 ක් පමණ රත්තොට ආසනයේ තිබෙනවා. මෙම ඉඩම් ගැන, මාතලේ එව කට සිටි දිසාපති අබ්ඩ් මහතා සමග සාකච්ඡා කළ අප, එන්සාල් වවන්නන්ගේ සමුපකාර සමිතියක් පිහිටුවා එම ඉඩම් ඒ සමිතියට ලබා දෙන ලෙස ඉල්ලීමක් කළා. අප එවැනි ඉල්ලීමක් කෙළේ ඒ ඉඩම් අක්කර 50, 25 ආදී වශයෙන් පුද්ගලයන්ට දීගෙන යන නිසායි. "සීමාසහිත රත්තොට කඳුකර එන්සාල් වවන්නන්ගේ සමුපකාර සමිතිය" නමින් අප විසින් පිහිටුවන ලද සමිතිය 67. 7. 28 වන දින මාතලේ සමුප කාර සංවර්ධන කොමසාරිස්තුමා විසින් ලියාපදිංචි කර තිබෙනවා. ඉහත කී ඉඩම්, වරින් වර අක්කර 500 බැගින් මෙම සමිති යට ලබා දෙන බවට මාතලේ දිසාපතිවරයා පොරොන්දු වුණා. එහෙත්, එම ඉඩම් ලබා දීමට මේ වනතුරු කිසිම පියවරක් ගෙන නැහැ. මාතලේ දිසාපතිවරයාටත් ඉඩම් අමාත්‍යාංශයටත් මේ ගැන නොයෙක් අවස් ථාවල දැනුම් දුන්නත් කිසිම ප්‍රයෝජන යක් වුණේ නැහැ. ඒ අතර, පුද්ගලයන්ගේ ඉල්ලීම් ගැන සලකා බලන ලෙස අමාත්‍යාං ශය දිසාපතිවරයාට නියෝග කර තිබෙනවා. එක්තරා පුද්ගලයකු ඉඩම් අක්කර 200 ක් ලබා ගැනීමට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ බව ගරු ඇමතිතුමාත් දන්නවා. ඒ ගැන සලකා බලන ලෙස අමාත්‍යාංශය නියෝග කරන තිබෙනවා. ලියාපදිංචි කරන ලද සමුප කාර සමිතියක් විසින් සිය ගණනකගේ යහපත සඳහා කළ ඉල්ලීම ඉවත දමා එක් එක් පුද්ගලයන්ගේ ඉල්ලීම් ගැන සලකා බැලීම අසාධාරණයි. එම නිසා, මේ ගැන සාධාරණව කල්පනා කර බලා යුක්තිය ඉෂ්ට කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 7.20

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

ගරු සභාපතිතුමනි, පානදුරේ ගරු මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) ඉදිරිපත් කළ කරුණ ගරු අධ්‍යාපන ඇමති තුමාගේ සැලකිල්ලට භාජන කරනවා. සීගිරියේ බිතු සිතුවම් සම්බන්ධව ගම්පහ ගරු මන්ත්‍රීතුමා (එස්. ඩී. බණ්ඩාරනායක මයා.) ප්‍රශ්නයක් මතු කළා. එම සිතුවම් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සම්පූර්ණ වුණේ ගිය සතියේ අන්තිම කොටසේදීයි. ඒ සිතියම්වල වැඩි ආරක්ෂාව සඳහා වැඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]
කොටසක් දැන් කරගෙන යනවා. ඉතාම ඉක්මණින් ඒ වැඩ කටයුතු සම්පූර්ණ වෙයි. ඒ කටයුතු සම්පූර්ණ වූ විගසින්ම නැවත වරක් සීගිරි චිත්‍ර නැරඹීමට මහ ජනයාට අවසර ලැබෙනවා ඇති.

**ගරු වී. ඒ. සුගතදාස**
*(கௌரவ சுகததாச)*
(The Hon. Sugathadasa)
කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) ඉදිරිපත් කළ ප්‍රශ්නය ගැන මට ඉතාම කණගාටුයි. එතුමා ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ අධ්‍යක්ෂ වරයකු ගැන බරපතළ චෝදනාවක් කළා. විශේෂ කරුණක් ගැන නොකියා වෘත්තිය සංගම්වලින් එම අධ්‍යක්ෂවරයා ගැන යම් යම් කාරණා දැනගන්නට ලැබුණාය, එම නිසා වෘත්තිය සංගම්වලට අගමැතිතුමා සමග සාකච්ඡාවක් කරන්නට අවස්ථාවක් ලබා දෙන්නය කියා එතුමා ඉල්ලීමක් කළා. එතුමා ඉදිරිපත් කළ චෝදනාව බරපතළයි. නමුත් කරුණු එකක්වත් ඉදිරිපත් කළේ නැහැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
වෘත්තිය සංගම් ඉදිරිපත් කරනවා.

**ගරු සුගතදස**
*(கௌரவ சுகததாச)*
(The Hon. Sugathadasa)
වෘත්තිය සංගම් ඉදිරිපත් කරන්නට ප්‍රථමයෙන් ගරු මන්ත්‍රීතුමාට අගමැතිතුමාට කරුණු ඉදිරිපත් කරන්නට තිබුණා. ගරු මන්ත්‍රීතුමාට දැන ගන්නට ලැබුණු කරුණුවල සත්‍යයක් තිබෙනවාද කියා සොයා බැලුවා නම්, ඒ කරුණු ගැන විශ්වාසයක් තිබෙනවා නම් භය නැතිව මේ අවස්ථාවේදී ඒවා හෙළි කරන්නට තිබුණා. අවංක අධ්‍යක්ෂවරයකුගේ චරිතයට කැළලක් කිරීමට එතුමා මේ අවස්ථාවේදී ඉදිරිපත් වීම ගැන මා කණගාටු වෙනවා. පානදුරේ ගරු මන්ත්‍රීතුමා එතුමාගේ ප්‍රශ්නය ඇසූ අවස්ථාවේදී මඩ ගසන්නට නොව කරුණු දැන ගැනීමට එම ප්‍රශ්නය අසනවාය කිව්වා. ඒ ආකාරයට අදහස් පිට කරනවා නම් මා ස්තුති කරනවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
විභාගයක් පැවැත්වුවහොත් කියයි.

**ගරු සුගතදාස**
*(கௌரவ சுகததாச)*
(The Hon. Sugathadasa)
ඇත්ත වශයෙන්ම මට කණගාටුයි. සාකච්ඡාවක් වුවමනා කරනවා නම් ප්‍රථමයෙන් මට එම චෝදනා ඉදිරිපත් කරන්නටය කියා ඒ වෘත්තිය සංගම් නායකයින්ට කරුණා කර කියන්න. කරුණු සහිතව චෝදනා ඉදිරිපත් කරන්නටය කියන්න. එසේ ඉදිරිපත් කළොත් මොන විධියේ චෝදනා වුවත් මා ඒවා ගැන සොයා බලා ඒවායේ යම් ඇත්තක් තිබෙනවා නම් අගමැතිතුමා සමග සාකච්ඡාවක් පවත්වන්නට අවස්ථාවක් ලබා දෙනවා.

අ. භා. 7.22

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
In regard to the question asked by the hon. Member for Gampaha (Mr. S. D. Bandaranayake), the foundation stone for the Bandaranaike Memorial International Conference Hall on the property along Buller's Road, Colombo 7, was laid on 11th March 1965.

Since the present Government came into power, there has been no variation in the original arrangement made for the construction of this Memorial Hall.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

The large seating capacity provided in the original complex for an International Conference Hall was reduced in the revised scheme, and with the savings possible from such reduction it was also proposed to construct a small hotel and a theatre for concerts, drama, etc. Towards this end a technical team comprising the Director of Public Works and the Chief Architect went to Peking in November 1966 to have discussions with the relevant representatives of the Government of the People's Republic of China. The proposal was ultimately agreed to by both parties and a report was submitted by the Director of Public Works to the Government after his return. A committee was then appointed to go further into the question of the suitability of the accommodation requirements agreed to and a report of this committee was forwarded to the Government by the Director of Public Works, who was the chairman.

The Chinese Government informed the Ceylon Government in November 1967 that they are not proceeding with the agreement reached by the Ceylon and Chinese technical delegates in November 1966.

The question of the utilization of the land is under consideration.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

What happened ?

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

The Chinese Government informed the Ceylon Government in November 1967 that they are not proceeding with the agreement reached by the Ceylon and Chinese technical delegates in November 1966.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

What does that mean ?

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

I do not know what it means. All I know is that I had certain discussions with the Chinese Ambassador before his departure and we agreed to send a delegation of the Director of Pubic Works and the Chief Architect to Peking. In Peking they agreed to the proposals made by the Ceylon delegation and it was then decided that letters be exchanged between the two Prime Ministers for the sucessful conclusion of the original project. But in November 1967 the Chinese Government informed the Ceylon Government that they are not proceeding with the agreement reached by the Ceylon and Chinese technical delegates in November 1966.

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)

Were there no amended proposals ?

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

That you must ask the Chinese Government. As far as we are concerned the Chinese Government agreed to the proposals made by us. That is all. And the matter was dropped there.

I can assure the hon. Member that if the Chinese Government is prepared to re-open negotiations I would be glad to consider it.

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)

Is it because the present Government queried the original proposals ?

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

No.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

What is the last statement you made—that you are considering how to dispose of the land?

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்கிரம)
(The Hon. Montague Jayewickreme)

No. I said the question of the utilization of the land is under consideration.

Let me explain this quite clearly to the hon. Member. If it is proposed not to utilize that land for any specific purpose, are you suggesting that that land should be allowed to idle and to run into weed?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

No, I am not saying that. All I am saying is that the Chinese Government, I know, donated Rs. 20 million for the purpose of putting up this hall to honour the memory of a great man of Ceylon. I do think you ought to follow it up. That money has not lapsed. They have not withdrawn that money. Please do get in touch with the Chinese Embassy and see what arrangements can be made.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்கிரம)
(The Hon. Montague Jayewickreme)

That is all I could say about this matter.

කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) ප්‍රශ්නයක් ඇසුවා. වචනයකින් දෙකකින් ඒකට පිළිතුරක් දෙන්නට මා අදහස් කරනවා. කොලොන්නාවේ රජයේ කර්මාන්ත ශාලාව මුළු ලංකාවේම උපකරණ අළුත්වැඩියා කිරීම් ආදී වැඩවලට තිබෙන මධ්‍යස්ථානයක්. නමුත් දැන් අප ලංකාවේ ප්‍රදේශ නවයට මධ්‍යස්ථාන නවයක් ඇති කර තිබෙනවා.

Decentralizing of the Kolonnawa Factory. In other words, all the equipment in the Southern Province will be repaired at the base workshop in the Southern Province, in Udukawa.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Not Weligama?

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்கிரம)
(The Hon. Montague Jayewickreme)

Why not? And similarly in Kandy, in the Central Province, in some other place for the Northern Province, Eastern Province and so on. There are nine base workshops undertaking repairs and proper maintenance of all these equipment in that perimeter of the province. That is what we have decided on technical advice.

As you know, the Kolonnawa Workshop undertakes repairs to typewriters, manufacture of hospital beds and buttons for the police force, and so forth. Now we have decided that the heavy equipment should be moved away from Kolonnawa, and I believe we are negotiating to move that to Ratmalana. The heavy equipment is to be repaired at Ratmalana and the work force doing that work then will be working in Ratmalana because, as you know, when you start undertaking work of this sort you cannot do everything in one place.

අ. භා. 7.29

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

An application was made to the Special Leases Board by the Rattota Kandukara Ensal Wawannange Sangamaya for a lease of 2,000 acres in Rattota area for cardamom cultivation. As the lands applied for did not fall within the area decided to be given under the Special Leases Scheme, it was decided by the Special

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Leases Board that this case be dealt with by the Government Agent outside the Special Leases Scheme, under the usual scheme for cardamom cultivation. This society subsequently had itself registered as a co-operative society and the application of the society is now under consideration. I am instructing the Government Agent to expedite this lease.

With regard to the other matter the position is this: The order to take possession of the land was published in the gazette; but in view of the fact that the acquiring officer was unable to take possession of the land peacefully the matter was reconsidered by me and final instructions have been issued to the Acquiring Officer, Matale District, to take possession of the land after obtaining a court order.

The acquiring officer's application to the District Court, Matale, will be taken up for hearing on the 15th instant.

එකල්හි වේලාව අ. භා. 7.30 වූයෙන්, කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, 1968 අප්‍රේල් මස 10 වැනි බදාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේය.

*அப்போது பி. ப. 7.30 மணியாகிவிடவே குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் வினு விடுக்காமலேயே சபையை ஒத்திவைத்தார்கள்.*

*அதன்படி, சபை 1968 ஏப்ரில் 10 புதன்கிழமை மு. ப. 10 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.*

*It being 7.30* P.M., MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *adjourned the House without Question put.*

*Adjourned accordingly until 10* A.M. *on Wednesday, 10th April 1968.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු

## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்

## WRITTEN ANSWERS TO QUESTIONS

### ටී. ඒ. රහීම් මහතා, විශ්‍රාමලත් පොලිස් සාජන්ට්

ஜனாப் ரி. ஏ. றஹீம், இளைப்பாறிய பொலிஸ் சார்சன்ட்

### MR. T. A. RAHIM, RETIRED POLICE SERGEANT

**744/68.**

**රත්නසිරි වික්‍රමනායක මයා.** (හොරණ)

(திரு. ரத்னஸிரி விக்ரமநாயக்க—ஹொறன)

(Mr. Ratnasiri Wickramanayaka—Horana)

අග්‍රාමාත්‍ය, රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පානදුරේ පොලිස් සේවයේ නියුක්තව සිටි අංක 1662 දරණ පොලිස් සාජන්ට් ටී. ඒ. රහීම් මයා. 67.2.16 වෙනි දින විශ්‍රාම ගැනීමට පෙර නිවාඩු ගිය බව එතුමා දන්නවාද? (ආ) මුදල් රෙගුලාසි 1365 (බී) වගන්තිය අනුව මොහුට අවුරුද්දකට දින 42ක නිවාඩුවක් අයිති බව එතුමා දන්නවාද? (ඉ) ඔහු 1965 වර්ෂයට එක දවසකුත්, 1966 වර්ෂයට දවස් දහසයකුත් නිවාඩු වශයෙන් ගෙන ඇති බව එතුමා දන්නවාද? (ඊ) 67.2.16 සිට 67.3.30 දක්වා ඔහුට ලැබී ඇත්තේ දින 44ක් බව එතුමා දන්නවාද? (උ) 1965 සහ 1966 වර්ෂවල ඔහුට ඉතුරුව ඇති දින 67න් දින 23ක පඩි ඔහුට ගෙවිය යුතු බව එතුමා දන්නවාද? (ඌ) මේ කාරණා සම්බන්ධව පානදුරේ පොලිස් පරීක්ෂක මහතාගේ මගින් අංක 3570 සහ 67.2.23 දින යටතේ පානදුරේ උප පොලිස් අධිකාරි මහත්මයාට දැන්වූ බව එතුමා දන්නවාද? (එ) පොලිස් මූලස්ථානය විසින් අංක ඇස්. ඇස්. ඩී. 113/61 සහ 67.10.26 දින යටතේ රහීම් මහතාට යවන ලද ලිපියේ අඩංගු කරුණු අවලංගු කිරීමට එතුමා කටයුතු කරනවාද?

பிரதம அமைச்சரையும், பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரையும், திட்ட அமைப்பு பொருளாதார விவகார அமைச்சரையும், தகவல், ஒலிபரப்பு அமைச்சரையும் கேட்ட வினா: (அ) பாணந்துறை பொலிசில் கடமையாற்றிய 1662 ஆம் இலக்கத்தையுடைய பொலிஸ் சார்சன்ட் ஜனாப் ரி. ஏ. றஹீம் இளைப்பாறுவதற்கு முன்னால் 16.2.67 இலிருந்து விடுமுறையில் சென்றாரென்பதை அவர் அறிவாரா? (ஆ) நிதிப்பிரமாணத்தின் 1365 (ஆ) பிரிவின்படி அவர் ஆண்டொன்றுக்கு 42 நாட்கள் விடுமுறை பெற உரித்துடையவர் என்பதை அவர் அறிவாரா? (இ) அவர் 1965 ஆம் ஆண்டில் ஒரு நாளும், 1966 ஆம் ஆண்டில் 16 நாட்களுந்தான் விடுமுறை எடுத்திருக்கிறாரென்பதை அவர் அறிவாரா? (ஈ) 16.2.67 இலிருந்து 30.3.67 வரை அவருக்கு 44 நாட்கள் மட்டுமே விடுமுறை வழங்கப்பட்டதென்பதை அவர் அறிவாரா? (உ) 1965 இலும் 1966 இலும் திரண்ட 67 நாள் விடுமுறையில் 23 நாட்களுக்கு அவருக்குச் சம்பளம் கொடுபடவேண்டுமென்பதை அவர் அறிவாரா? (ஊ) இவ்வுண்மைகள், பாணந்துறை பொலிசுப் பரிசோதகரால் பாணந்துறை உதவிப் பொலிசு அத்தியட்சகருக்கு 23.2.67 அன்று 3570 ஆம் இலக்கக் கடிதமூலம் அறிவிக்கப்பட்டதென்பதை அவர் அறிவாரா? (எ) பொலிசுத்தலைமை அலுவலகத்திலிருந்து ஜனாப் றஹீமுக்கு 26.10.67 இல் அனுப்பப்பட்ட எஸ்.எஸ்.டீ. 113/61 இலக்கக் கடிதத்தைச் செல்லுபடியற்றதாக்க அவர் உரிய நடவடிக்கையெடுப்பாரா?

asked the Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting: (*a*) Is he aware that Mr. T. A. Rahim, Police Sergeant 1662, of the Panadura Police, went on leave on 16.2.67 prior to retirement? (*b*) Is he aware that this person is entitled to 42 days' leave for a year under Financial Regulation 1365 (B)? (*c*) Is he aware that he had taken leave on one day in 1965 and 16 days in 1966? (*d*) Is he aware that between 16.2.67 and 30.3.67 he had been given only 44 days' leave? (*e*) Is he aware that pay for 23 of the 67 days' leave accumulated in 1965 and 1966 is due to him? (*f*) Is he aware that these facts were brought to the notice of the Assistant Superintendent of Police, Panadura, through the Inspector of Police, Panadura, by letter 3570 of 23.2.67? (*g*) Will he take action to invalidate

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්නසිරි වික්‍රමනායක මයා.]

letter SSD 113/61 of 26.10.67 sent from the Police Headquarters to Mr. Rahim ?

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)**

*(கௌரவ டட்ளி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும், தகவல், ஒலிபரப்பு அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)

(අ) ඔව්. (ආ) ඔව්. (ඉ) ඔව්. (ඊ) ඔව්. (උ) මෙය වැරදිය. විශ්‍රාම යන දිනය වෙනස් කර, ඔහුට හිමි දින 23ක සම්පූර්ණ පඩි සහිත නිවාඩුව ලබා දෙනවා ඇත. (ඌ) ඔව්. (එ) ඔව්. මේ පොලිස් සැරයන්ට හිමි දින 23ක නිවාඩුව ලබාගත හැකිවනු පිණිස ඔහු විශ්‍රාම ගත් දිනය 67.4.1 වෙනුවට 67.4.24 ලෙස සංශෝධනය කිරීමට, භාණ්ඩාගාරය සමග කටයුතු කරනවා ඇත.

*(அ) ஆம். (ஆ) ஆம். (இ) ஆம். (ஈ) ஆம். (உ) இது சரியல்ல. இளைப்பாறுத் தேதியை மாற்றுவதன் மூலம் அவருக்குரிய 23 நாட்களுக்கு முழுச் சம்பளத்துடன் லீவு வழங்கப்படும். (ஊ) ஆம். (எ) ஆம். திறைசேரியுடன் கலந்தாலோசித்து, இப் பொலிஸ் சார்சன்ட் இளைப்பாறும் தேதியை 1.4.67 இல் இருந்து 24.4.67 க்கு மாற்றி, அதன் மூலம் அவருக்குரித்தான 23 நாள் லீவை எடுக்க வகைசெய்வதற்கு நடவடிக்கை எடுக்கப்படும்.*

(*a*) Yes. (*b*) Yes. (*c*) Yes. (*d*) Yes. (*e*) This is not correct. He is entitled to 23 days' full pay leave which will be allowed to him by amending the date of retirement. (*f*) Yes. (*g*) Yes. Action will be taken in consultation with the Treasury to vary the date of retirement of this Police Sergeant from 1.4.67 to 24.4.67, so that he could avail himself of the 23 days' leave due to him.

ලිඛිත පිළිතුරු

## දියතිලක කෝරළේ ගම්සභාව, නුවරඑළිය

*தியதிலக கோறளை கி. ச., நுவரெலியா*

**DIYATILEKA KORALE V. C., NUWARA ELIYA**

**750/68.**

**ජෝර්ජ් අබයගුණසේකර මයා.** (හඟුරන්කෙත)

*(திரு. ஜோர்ஜ் அபயகுணசேக்கர—ஹங்குரங்கெத்த)*

(Mr. George Abeyagoonasekera—Hanguranketa)

පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති සහ ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) නුවරඑළිය දිස්ත්‍රික්කයේ දියතිලක කෝරලේ ගම්සභාවට සහ/හෝ සභාපතිතුමාට විරුද්ධව අකාර්යක්ෂමතාව සහ අයථා පාලනය ගැන චෝදනා 14ක් ඉදිරිපත් කරන ලද බව එතුමා දන්නේද? (ආ) එසේ නම් චෝදනා කවරේද? (ඉ) ඉහත සඳහන් චෝදනා ගැන පරීක්ෂණයක් නුවරඑළියේ සහකාර පළාත් පාලන කොමසාරිස් තුමන් විසින් පවත්වන ලද බව එතුමා දන්නේද? (ඊ) පරීක්ෂණයෙන් පසුව සහකාර පළාත් පාලන කොමසාරිස් තුමන් විසින් කරන ලද නිර්දේශ මොනවාද? (උ) ඔහුගේ නිර්දේශයන් ක්‍රියාත්මක කරන ලද්දේද? නොඑසේ නම්, ඒ මන්ද?

*உள்ளூராட்சி அமைச்சரினதும், தகவல், ஒலிபரப்பு அமைச்சரினதும் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா: (அ) நுவரெலியா மாவட்டத்திலுள்ள தியதிலக கோறளைக் கிராமச்சபையின் தலைவருக்கு அல்லது கிராமச்சபைக்கு எதிராக ஒழுங்கற்ற நிர்வாகத்திற்காகவும், திறமையின்மைக்காகவும் பதினான்கு குற்றச்சாட்டுக்கள் சாட்டப்பட்டுள்ளனவென்பதை அவர் அறிவாரா? (ஆ) அப்படியாயின், அக்குற்றச்சாட்டுகள் யாவை? (இ) அக்குற்றச்சாட்டுகள் பற்றி நுவரெலியா. உதவி உள்ளூராட்சி ஆணையாளரினால் ஒரு விசாரணை நடாத்தப்பெற்றதென்பதை அவர் அறிவாரா? (ஈ) விசாரணையின் பின் உதவி உள்ளூராட்சி ஆணையாளரினால் செய்யப்பட்ட விதப்புரைகள் யாவை? (உ) அவரது விதப்புரைகள் செயற்படுத்தப்பட்டனவா? அன்றேல், ஏன்?*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් අබයගුණසේකර මයා.]

asked the Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information and Broadcasting: (*a*) Is he aware that fourteen charges of maladministration and inefficiency have been made against the Chairman and/or the Village Council of the Diyatileka Korale Village Council in the Nuwara Eliya District? (*b*) If so, what were the charges? (*c*) Is he aware that an inquiry was held by the Assistant Commissioner of Local Government, Nuwara Eliya, into the said charges? (*d*) After the inquiry what were the recommendations made by the A.C.L.G.? (*e*) Were his recommendations implemented; and if not, why?

**ආර්. ප්‍රේමදාස මයා. (පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

(திரு. ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரதும், தகவல், ஒலிபரப்பு அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. R. Premadasa—Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information & Broadcasting)

(අ) දියතිලක ගම්සභාවේ සභාපතිට විරුද්ධව යම් යම් චෝදනා ඉදිරිපත් කර ඇති බව මම දනිමි. (ආ) තවම චෝදනා සකසා නොමැත. (ඉ) මෙකී චෝදනා ගැන විමර්ශනය කරන ලෙස නුවරඑළියේ පළාත් පාලන සහකාර කොමසාරිස්ගෙන් ඉල්වන ලදී. මොහුගේ වාර්තාව පදනම් කරගෙන තවදුරටත් විමර්ශනය කිරීම පිණිස ඇමතිතුමා මෙම අමාත්‍යාංශයේ නිලධාරියෙකුට නියම කරනු ලැබ ඇත. (ඊ) සහ (උ) වාර්තාව ලැබුණ පසු, සභාපතිට විරුද්ධව චෝදනා සැකසිය යුතුද යනු ඇමතිතුමා සළකා බලනු ඇත.

(அ) தீயதிலக கிராமச்சபைத் தலைவருக்கு எதிராகக் குற்றச்சாட்டுக்கள் உள்ளன என்பது எனக்குத் தெரியும். (ஆ) குற்றச்சாட்டுக்கள் இன்னும் தயாரிக்கப்படவில்லை. (இ) நுவரெலியா உள்ளூராட்சி ஆணையாளர் இக் குற்றச்சாட்டுக்களைப் புலன் விசாரணை செய்ய வேண்டப்பட்டு, அவரின் அறிக்கையின் பிரகாரம் அதையிட்டு மேலும் புலன்விசாரணை செய்வதற்கு உள்ளூராட்சி அமைச்சைச் சேர்ந்த அலுவலர் ஒருவரைக் கௌரவ அமைச்சர் பணித்துள்ளார். (ஈ) வும் (உ) வும்: அறிக்கை கிடைத்தபின் கிராமச்சபைத் தலைவருக்கு எதிராகக் குற்றச்சாட்டுக்கள் தயாரிக்கப்படவேண்டுமா என்பதைப் பற்றிக் கௌரவ அமைச்சர் கருத்திற் கொள்வார்.

(*a*) I am aware that certain allegations have been made against the Chairman of the Diyatileke Village Council. (*b*) No charges have yet been framed. (*c*) The Assistant Commissioner of Local Government, Nuwara Eliya, was requested to investigate into the allegations and on his report the Minister has directed a further investigation to be held by an officer in the Ministry. (*d*) and (*e*) The Minister will consider whether charges have to be framed against the chairman after the report is received.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம் : தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org